# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

62nd ISSUE
October 2009




බලන් පාබළ අභිමන්....

# සුබ මොහොතින් නව තනතුරක ....



රෙම ශ්‍රීලපාහ විධායක අධිකාරී
මේජර් කේඑ පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ




රෙම ශ්‍රීලපාහ මානි II (පාලන)
මේජර් එම්කේඑම් කුමාර ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ 'වයිට් හැකල්' අංශය භාර නිලධාරී
මේජර් ටීපී වීරසිංහ ශ්‍රීලපාහ



රෙම ශ්‍රීලපාහ පාලන කණ්ඩායම නිලධාරී අණදෙන
කපිතාන් ආර්ඩීඑම්එම් විජයතිලක ශ්‍රීලපාහ

**රෙජිමේන්තු අධිපති තුමා ඇතුළු සියලු නිලධාරි සෙසු නිලයන්ගේ සුබ පැතුම් !!**

THE WHITE HACKLE

# THE WHITE HACKLE

OCTOBER 2009 VOLUME 15 NO.02 62nd ISSUE

## Headlines

| | Page |
|---|---|
| • Feed back අදහස් උදහස් හා විවේචන | 02 |
| • සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහාය | 03 |
| • ජාත්‍යන්තර තරඟ බිමේ ජය කෙහෙලි නංවමින් ඉදිරියට යන ආබාධිත ක්‍රීඩකයා | 05 |
| • Meaning of some sayings | 06-07 |
| • වයිට් හැකල් කාටූනය | 07 |
| • ජීවයෙන් පිරි හමුදා දිවිය | 08-11 |
| • දමිළ කවිය | 11 |
| • සේවා වනිතා | 12 |
| • ශ්‍රීලපාහ රණවිරුවන් සඳහා ලද පරිත්‍යාග | 13 |
| • අනිවාර්ය හමුදා සේවය ඇති - නැති රටවල් | 14-15 |
| • දසුනේ හසුන | 16 |
| • කිඹුලිගේ පැටියා | 17 |
| • ජ්‍යෝතිෂයයි ඔබයි | 18 |
| • පුතුට නිවන දෙමාපියන්ට සෙවණ | 20-21 |
| • ඉස්ලාම් ධර්මයේ ඉතිහාසය | 22 |
| • සිමියොන්ලා හත්දෙනා (රුසියන් සුරඟන කතාව) | 23-25 |
| • සුබ මොහොතින් නව අණදෙන නිලධාරි තනතුර භාරගැනීම | 26-27 |
| • පලෙයි නගර මධ්‍යයේ ඉදිවූ පළමු බුදු මැදුර | 27 |
| • ශ්‍රී ලංකා යුධ හමුදාවට සොල්දාදුවන් 268 දෙනෙකු ශ්‍රී ලංකා පාබල හමුදාව දායාද කළ වගයි | 28 |
| • ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා තරගාවලිය - 2009 | 29 |
| • 23 ශ්‍රීලපාහ ඒකකයේ ආරම්භක පිය සටහන | 30 |
| • Countries With Absolutely No Military Forces | 32-33 |
| • 8 ශ්‍රීලපාහ සිව්වන අණදෙන නිලධාරි | 34 |
| • ආබාධිත රණවිරුවන්ගේ විශේෂ දක්ෂතා | 35 |
| • උසස් පාබල බණ්ඩ පුහුණු පාඨමාලාව - 4 ශ්‍රීලපාහ | 36 |
| • ප්‍රහේලිකා අංක 41 | 39-40 |




27 පලෙයි නගර මධ්‍යයේ ඉදි වූ බුදු මැදුර



34 8 ශ්‍රීලපාහ සිව්වන අණදෙන නිලධාරී



35 ආබාධිත රණවිරු ක්‍රීඩකයෝ




## කවරයේ කථාව

ශ්‍රී ලංකා යුධ හමුදාවට වසර 60ක් සපිරීම නිමිත්තෙන් 2009.10.03 දින සිට 2009.10.11 දින දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ අභිමානවත් අයුරින් පැවති ප්‍රදර්ශන භූමියට පැමිණි සේනාධිනායක අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා පාබල හමුදා ප්‍රදර්ශන කුටිය නරඹන අවස්ථා ඇතුළු විවිධ අවස්ථා වල ඡායාරූප මෙවර මුල් පිටුවෙන් විදහා දැක්වේ.

Designed & Printed by
softWave
107D, Havelock Road, Colombo 05.

# THE WHITE HACKLE

**SRI LANKA**
**LIGHT INFANTRY MAGAZINE**

**COLONEL OF THE REGIMENT**

**MAJ GEN** RMD RATHNAYAKE RWP RSP USP ndu psc

**Editor in Chief**

**COL** TJ KODITHUWAKKU RWP
(CENTRE COMMANDANT)

**Assistant Editor**

**MAJ** KA PUSHPAKUMARA RSP psc SLLI
(ADJUTANT RHQ SLLI)

**Associate Editor**

**MAJ** TP WEERASINGHE SLLI
(OIC 'WHITE HACKLE')

**Chief Consultant**

**MAJ GEN** HV ATHUKORALE VSV psc FBIM
( Rtd – Reg Force )
**BRIG** AER ABEYSINGHE
(Rtd – Vol Force)

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry
Telephone - 0112855204
0112855356
Fax - 0112855204
E-mail - rhqslli@yahoo.com
Website - www.slli.lk


# Feedback

## අදහස්, උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 62nd issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears though 'THE WHITE HACKLE', the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to 'THE WHITE HACKLE' We are willing to accept and use what if of a standard, like sketches cartoons stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let 'White Hackle' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

***Editor***

## කර්තෘ වාක්‍යය

වයිට් හැකල් සඟරාවේ 62 වන කලාපය ද මේ ලෙස ඔබ අතට පත්වේ. නුදුරේදී අප්‍රමාදව වඩා උසස් තත්ත්වයෙන් වයිට් හැකල් සඟරාව එළි දැක්වෙන අතර, අන්තර් ජාලය ඔස්සේ ද ( ශ්‍රී ලංකා පාබල හමුදා වෙබ් අඩවිය ) කියවීමට අවස්ථාව ලැබේ.

යුද හමුදා 60 වන සංවත්සරය ඔක්තෝම්බර් මස 10 වන දිනට යෙදී තිබිණි. ඒ නිමිත්තෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැති යුධ හමුදා ප්‍රදර්ශනය නැරඹීමට මෙන්ම බෙත්තාරාම ක්‍රීඩාංගනයේ පැවැති යුද හමුදා "ටැටු" සංදර්ශනය නැරඹීමට ද ලක්ෂ සංඛ්‍යාත ජනකායක් පැමිණියහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානය විදහා දැක්වූ එම ප්‍රදර්ශනයේ පැවති ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රදර්ශන කුටිය වෙත ද බොහෝ දෙනාගේ අවධානය යොමුවී තිබිණි. කොටි ත්‍රස්තවාදය විනාශ කිරීම සඳහා යොදාගත් අවි ආයුධ මෙන්ම යුධ හමුදාවේ විකාශනය පැහැදිලි කෙරෙන අතීතයේ භාවිතා කරන ලද අවි ආයුධ කෙරෙහි ද අවධානය යොමු විය. අප රටේ යුද්ධ හමුදාවේ ආරම්භය සිදුවූයේ ශ්‍රී ලංකා පාබල හමුදාවෙනි. අප රෙජිමේන්තුවේ ඉතිහාසය 1881 දක්වාම ඈතට දිවයයි. දුරාතීතයේ පටන්ම විවිධ මුහුණුවර වලින් අප රටේ ආරක්ෂාව සඳහා හමුදාවන් ක්‍රියාත්මක වුවත් 1949 අංක 17 දරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පනත මගින් ස්ථාපනය කරන ලද වත්මන් යුද්ධ හමුදාවේ ආරම්භය 1881 වසර දක්වාම දිව යයි. වර්තමාන ලෝකයේ යුද්ධ හමුදා නොමැති රටවල් ද තිබෙන අතර, ඒ පිළිබඳව සැකෙවින් කරුණු දැක්වෙන ලිපියක් ද මෙම කලාපයට ඇතුළත් කර ඇත.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn,57380 or 57404. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, Of PA Army HQ CBO by letter No, A/275/27 of 16 Mar, '94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.




නියම ධනය ඇත්තා ධනවතා නොව ධනයෙන් සැප විඳින්නාය

# සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE KILLED IN ACTION

1983 වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාමලේඛනය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පලකරනු ලැබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2947 | S/318640 | L/Cpl | Pushpakumara HMM | 11 SLLI | Mullikulam | 21/05/2008 |
| 2948 | S/187274 | L/Cpl | Rathnayaka SLD | 11 SLLI | Ge:Hos:CBO | 30/05/2008 |
| 2949 | O/305765 | Lt | ALP Athukorala SLLI | 15 SLLI | Kiri Ebban Wewa | 05/06/2008 |
| 2950 | S/318639 | Cpl | Nishantha DMA | 11 SLLI | Mullikulam | 10/06/2008 |
| 2951 | S/318798 | L/Cpl | Vidusanka UMK | 11 SLLI | Ge:Hos: CBO | 11/06/2008 |
| 2952 | S/305037 | Sgt | Karunarathna PMSK | 15 SLLI | Kiri Ebban Wewa | 12/06/2008 |
| 2953 | S/164716 | L/Cpl | Rathnayaka JASS | 6 SLLI | Nagarkovil | 14/06/2008 |
| 2954 | S/318218 | Sgt | Bandara KMCS | 7 SLLI | Palampiddi | 15/06/2008 |
| 2955 | S/319255 | Cpl | Lasantha NAR | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2956 | S/176576 | L/Cpl | Dissanayaka DMTK | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2957 | S/174854 | L/Cpl | Jayasekara DJYMWN | 8 SLLI | Periyamadu | 17/06/2008 |
| 2958 | S/314342 | Sgt | Prithikumara L | 11 SLLI | Mannar | 18/06/2008 |
| 2959 | S/178734 | L/Cpl | Madusanka NCP | 15 SLLI | Kiri Ebban Wewa | 6/23/2008 |
| 2960 | S/307845 | Cpl | Basnayaka BMS | 15 SLLI | Kiri Ebban Wewa | 6/23/2008 |
| 2961 | S/185814 | L/Cpl | Dissanayaka SVSC | 8 SLLI | Periyamadu | 24/06/2008 |
| 2962 | O/307995 | Lt | RMP Samaraweera SLLI | 11 SLLI | Mannar | 25/06/2008 |
| 2963 | S/312656 | Cpl | Bandula Kumara HMP | 12 SLLI | Kalyanapura | 01/07/2008 |
| 2964 | S/186081 | L/Cpl | Liyanage HLASK | 12 SLLI | Ge:Hos:ANP | 02/07/2008 |
| 2965 | S/00392 | L/Cpl | Jayasena PGSI | 12 SLLI | Kalyanapura | 05/07/2008 |
| 2966 | S/2D03341 | L/Cpl | Rasika LG | 15 SLLI | Ge:Hos:ANP | 7/4/2008 |
| 2967 | S/317675 | Cpl | Premathilaka MRRM | 6 SLLI | Nagarkovil | 07/07/2008 |
| 2968 | S/177065 | L/Cpl | Prasanna LAA | 15 SLLI | Ge:Hos: KND | 08/07/2008 |
| 2969 | S/176546 | L/Cpl | Senavirathna YMC | 7 SLLI | Thunnukkai | 17/07/2008 |
| 2970 | S/316240 | S/Sgt | Wipulasena HM | 10 SLLI | Mannar | 18/07/2008 |
| 2971 | S/316994 | L/Cpl | Jayarathna JSK | 7 SLLI | Thunnukkai | 18/07/2008 |
| 2972 | S/176676 | L/Cpl | Kularathna BADL | 12 SLLI | Kalyanapura | 20/07/2008 |
| 2973 | S/172267 | L/Cpl | Karunarathna RMN | 7 SLLI | Thunnukkai | 21/07/2008 |
| 2974 | S/311998 | L/Cpl | Marasinhe MM | 7 SLLI | Thunnukkai | 24/07/2008 |
| 2975 | S/318036 | Cpl | Rajasinha Banda AGRP | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2976 | S/172310 | L/Cpl | Amarasena AS | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2977 | S/160686 | L/Cpl | Ghanarathna RB | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2978 | S/317544 | L/Cpl | Perera JMAI | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2979 | S/306139 | L/Cpl | Nishantha Kumara PGI | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2980 | S/317511 | L/Cpl | Saman Kumara KL | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2981 | S/164754 | L/Cpl | Kumara WRSS | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2982 | S/4Q02475 | L/Cpl | Wickrama WTN | 7 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2983 | S/319518 | L/Cpl | Gunarathna UGPK | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2984 | S/319248 | L/Cpl | Perera AAC | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2985 | S/319506 | L/Cpl | Wimaladasa IM | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2986 | S/317457 | L/Cpl | Maduranga GKC | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2987 | S/312995 | L/Cpl | Weratunga SNP | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2988 | S/172647 | L/Cpl | Kumarasinhe RDA | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2989 | S/319287 | L/Cpl | Kumarasiri HAA | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2990 | S/317077 | Cpl | Abesinhe AMMP | 8 SLLI | Thunnukkai | 25/07/2008 |
| 2991 | S/315789 | L/Cpl | Herath Kumara DMN | 7 SLLI | Ge:Hos:ANP | 28/07/2008 |
| 2992 | S/186084 | L/Cpl | Rukshan Prasad KP | 12 SLLI | Kalyanapura | 28/07/2008 |
| 2993 | S/181826 | L/Cpl | Suranjith HLD | 12 SLLI | Kalyanapura | 28/07/2008 |
| 2994 | S/320272 | L/Cpl | Mihidupala RD | 15 SLLI | Ge:Hos:ANP | 30/07/2008 |
| 2995 | S/302654 | Sgt | Aberathna Banda AG | 15 SLLI | Kiri Ibban Wewa | 03/08/2008 |
| 2996 | S/172287 | L/Cpl | Wasantha SU | 7 SLLI | Thunnukkai | 05/08/2008 |

තව කොටසක් ලබන කලාපයේ

# සටන් බිමේ විරුවනේ.....

| | |
|---|---|
| තනිවී තල් අරණේ නුඹ ඉන්නා | කලට |
| සිහිවේ නුඹේ හද සිතුවිලි මා | සිතට |
| එන්නට වරම් නැත මට නුඹ | වෙතට |
| අමුණමි පත් ඉරුවේ සිතුවිලි නුඹ | වෙතට |
| | |
| පරාජය වු දේශෙක උරුමය | පතලා |
| පිය මැන යන්න නුඹ යුද විරුවකු | වීලා |
| දුර කත ඉඳන් දිව රෑ නුඹ ළඟ | රැඳිලා |
| දිරිමල් සලන්නම් නුඹ සිත තුළ | පිපිලා |
| | |
| සාමයේ මල් සුවඳ අතුරා මව් | දෙරණේ |
| නිදහස් සුවය රදවනු නිති කුමරු | වනේ |
| නුඹ හට පිදුව පෙම රදවා හද | අරනේ |
| ඉන්නම් එතෙක් මා මේ නිසසල | සෙවනේ |
| | |
| බෝල්පිණි අහුරු දුටු විට දුක හිතනු | එපා |
| පායුග වෙන් වුවත් හදවත සලනු | එපා |
| මරණය ළඟදි සතුරට යට වන්න | එපා |
| විරුවකු වුණ නුඹට සෝ දුක් වන්න | එපා |
| | |
| අදහන ආගමට බැතිබර සිරස | නමා |
| කටයුතු කරමු මුල් තැනදී දෙනෙත | යොමා |
| සුන්දර සිතින් පැතුමක් ගොනු කරමි | මෙමා |
| ඔබ සැම රැක දෙත්වා දෙවිවරුන් | සැමා |

සාසෙ සම්පත්, ලාකෝ ඉන්දික කුමාරගේ
ආදර පුංචි නැගණිය නුවන්තිකා
උදයානි



## ප්‍රාර්ථනා

දුටුව නෙතක් පහන් කරන
පුංචි රෝස මලක් විලස
ඈත අහසෙ පායා දිලෙන
ලස්සන පොඩි තරුවක් ලෙස
ඉදිරියටම පිය නගන්න
මගෙන් සුහද පැතුම් ඔබට

පුන් කලස් මතුපිට
පහන් දැල්වෙන විලසට
අහිංසක හදවතකට
නොහිමි පහනක්
වෙන්න සදහට

ඊ.ඩී. ඉමේෂා උපේෂිකා

# දකුණට වසන්තය

පෙරදා මහ රෑ නිදි වර්පිතව
නුඹ යුධ බිමේ...
සතුරන්ට එරෙහිව
තල් වැට මායිම්
පසු කරමින් නිමේෂයෙන්
නිමේෂය.... සිටි හින්දා....
මගේ හද ගිනි ඇවිලුනා
මුළු රැය පුරා කඳුළැලි සමගින්
එනමුත් සාමයේ මල් පිපුන
උතුරු වසන්තය ගෙන ආවා
අපේ දිවියට සතුට සැනසුම
සෙබළ බිරියක් වන නිසා....

7 ශ්‍රීලපාහ, 'ඩී' කණ්ඩායමේ
එස්පීසීකේ කුමාරගේ බිරිය
සුනිමලී (සෙව්වන්දි) කළාඔය

# සෙබළ සිතකින්

පිනි බිංදු මල් වැස්ස
මළ හිරුගෙ සැඳෑවට
හාත්පස කරුවලය
පෙනෙන නෙත් මානයේ
මුර කුටියෙ මගේ හිත
තනිවෙන යාමයට
තනි රකින ගිනි අවිය
තුරුළු කර පපු තුරට
සෙනෙහසේ මිරිගුවක්
මගේ සිත අද්දරින්
පෙනෙනවා දහස් වර
මුර කුටියේ මානයට
සිත තනි කරන පාලුවට
ගිනි අවිය තුරුලු වෙයි
වරින් වර උණුසුමට....

ඊ.ඩී. ඉමේෂා උපේෂිකා
කුරුණෑගල

# අනිවාර්ය ලැබීම

අහසේ හරි මහ මුහුද මැද හෝ
පර්වත ගුහාවක නැත්නම්
සක්වල ඉම කොතැනක හරි
සැඟවී සිටියත් අනිවාර්යයෙන්ම
අප සොයාඑන එක දෙයක් ඇත
ඒ තමයි මරණය........

කෝප්‍රල් තිලකරත්න පීආර්
"ඊ'' කණ්ඩායම
ජනාධිපති ආරක්‍ෂක සේනාව
අරලිහගහ මන්දිරය

# රණ බිමට උපහාර

| | |
|---|---|
| අහස් කුස සිපගෙන සිංහ ධජය | ලෙලදේ |
| භූතලය තෙත්කොට ලේ | වැහිරේ |
| ලක් මව සිසාරා ජය හඬ | රැව් දේ |
| ඒ ඔබ නිසාමයි අපේ රණ | විරුවනේ |
| | |
| වෙඩි උණ්ඩ ලය පලා ඔබ ගසන හැම | දිනේ |
| තව තවත් විරුවන් ඔබ අනුව පෙල | ගැසේ |
| ඔබ හැම බිහිකල මෙකල විරු මව්වරු | අපේ |
| ඔබ මෙන්ම විරුවන්ය දෙපා නමදිමු | ඇගේ |
| | |
| අවසන් හුස්ම හෙලුවන් ඔබ රුදු | සටනේ |
| ගෙවනා අවසන් හෝරාවයි ඔබ | උතුරේ |
| රැකගෙන ලංකා එක්සේසත් කම | මිතුරේ |
| එන්න මග බලා හිඳ නෑ සිය හැම | දකුනේ |
| | |
| බුදුන් පුදන දෑතින් වැන්දත් | ඔබට |
| පව් නෑ සොයුරනි අප රකිනා | නිබඳ |
| අපටත් සතුටින් ඉන්නට රටක් | හෙට |
| ලබලා දෙන්න ඔබ හට අත්වෙයි | නිවන |

ලාකෝ ඉන්දික කුමාර,
සාසෙ සම්පත්ගේ ආදර නැගණිය
නුවන්තිකා

## යථාර්ථය

ගිමන් වූ සිත නුඹ සොයයි...
ශක්තිමත් වූ නුඹ බොහෝ දුරයි...
මා පිදූ පෙම පිවිතුරු නිසාවෙන්...
සත්තකයි.. නුඹ සිතින් පමණක් මා ළඟයි

සැරයන් විජේරත්න ආර්එම්කේ
'ඒ' කණ්ඩායම, 8 ශ්‍රීලපාහ

# මගෙම හිමිසඳුට බුදු සරණයි

රට රකිනා සටන් බිමේ
සෙබළුන් හා ඔබ උතුරේ...
ඔබගේ උණුසුම් තුරුල්ලේ සිටි සැටි
මතකයට නැගේ සැමදාම...
දරුදෙදෙනා සමග නිවසේ ඉන්න විට
තනිකම පාලුව දැනෙනවා මගේ හදවතට..
ආදරයෙන් ඔබෙ කම්බුල් සිපගන්නම්
හැමදාටම ඔබගේ තුරුල්ලට වෙලා ඉන්නම්..
මා හැරදා වෙනතක නම් යන්න එපා
පපුව පැලිලා මා මියයනවා සත්‍යයි...
සැමදාමත් මා බලා සිටින්නේ
ඔබගේ රූපය දැක ගන්නයි...
හැම භවයේදිම ඔබව පතා මා ඉපදෙන්නම්
මගෙත් ආයු ලැබ මටත්වඩා කල්
ඔබ ජීවත් වේවා !

මගේ රත්තරං සුදු මහත්තයට තිස්තුන් කෝටියක්
දෙවිවරුන්ගේ පිහිට ආරක්‍ෂාව නොඅඩුව ලැබේවා !

තුෂාර පීජීගේ බිරිය මධු

# ජාත්‍යන්තර තරග බිමේ ජය කෙහෙලි නංවමින් ඉදිරියට යන ආබාධිත ක්‍රීඩකයා



සෙ/308239 කෝප්‍රල් ලලිත් කුමාර ඩබ්ජිජ් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බළසේනාවට 1995.08.16 දින බැදී මූලික පුහුණුව හැදෑරීමෙන් අනතුරුව ශ්‍රීලංකා පාබල හමුදාව වෙත ඇතුලත් කරන ලදී. ඒකකය සමග ක්‍රියාන්විත රාජකාරීන් සදහා සහභාගි වෙමින් සිටියදී 1995.11.10 දින රිවිරැස ක්‍රියාන්විතයේදී කෝපායි ප්‍රදේශයේදී ත්‍රස්තවාදීන් අටවා තිබූ පීඩන බෝම්බයක් පෑගීමෙන් තුවාල ලබා වම් පාදය දණහිසට පහළින් කපා ඉවත්කර ඇත.

ඔහුගේ එම ආබාධිත තත්ත්වය මත රෙපිමුබ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කරන ලද අතර එහිදී ඔහුගේ හැකියාවන් හඳුනාගෙන ක්‍රීඩා සඳහා යොමු කරන ලදී. එහිදී ඔහු විසින් තම සැඟවී තිබූ හැකියාවන් ඔප් නංවා ගනිමින් දක්ෂතා දක්වන ලදී. එහිදී ඔහු විශේෂයෙන් බැඩ්මින්ටන් ක්‍රීඩාවෙන් සහ දුනු විදීමේ ක්‍රීඩාවෙන් විශිෂ්ට කුසලතාවයන් පෙන්වා ජය අත්කරගත් අතර හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන්ද හැකියාවන් වර්ධනය කරගනිමින් ජයග්‍රහණ අත්කර ගන්නා ලදී.

එම දක්ෂතාවයන් ඔහු යුධ හමුදා අන්තර් රෙපිමේන්තු ආබාධිත ක්‍රීඩා තරගාවලියේදී සහ ආබාධිතයින්ගේ ක්‍රීඩා පිළිබඳ ජාතික සම්මේලනය මගින් පවත්වන ලද ජාතික ආබාධිත ක්‍රීඩා තරගවලදීද පෙන්නුම් කරමින් ජයග්‍රහණ අත්කර ගනිමින් අප ඒකකයටත් ශ්‍රී ලංකා පාබල හමුදාවටත් මහත් ගෞරවයක් අත්කර දුන් ක්‍රීඩකයෙකි.

ඔහු ඉහත දක්වන ලද දක්ෂතා මත විදේශ තරඟාවලි සඳහා සහභාගි වීමට සුදුසුකම් ලබාගත් අතර, එහිදී විශිෂ්ට දක්ෂතා දක්වා ජයග්‍රහණ අත්කර ගැනීමට සමත් විය. ඔහු සහභාගි වූ විදේශ තරගාවලියන්හි ජයග්‍රහණ රාශියක් ඇත.

අවසන් වරට ඔහු 2009 වසරේදී ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගි වී ඉහළ දක්ෂතා දක්වා ජයග්‍රහණ අත්කර ගනිමින් තම හැකියාවන් තවදුරටත් වර්ධනය කරගනිමින් ඉදිරියට පැමිණ ඇති ක්‍රීඩකයෙකි. ඔහුගේ එම දක්ෂතාවයන් අප පාබල හමුදාවෙන් කිසිදා මැකී නොයනු ඇති අතර, මෙවන් ක්‍රීඩකයින් තම ආබාධිත තත්ත්වය ගැන නොසිතා කටයුතු කිරීම තුලින් අප සියලු දෙනාටම හොඳ ආදර්ශයක් ලබාදී ඇත. ඔහු ලබාගත් එම ජයග්‍රහණ ශ්‍රී ලංකා පාබල හමුදාවටත් ශ්‍රීලංකා යුධ හමුදාවටත් පොදුවේ ශ්‍රීලංකාද්වීපයටත් මහත් ආඩම්බරයට කරුණකි. ඔහුගේ එම ක්‍රීඩා දිවිය ඉදිරියටත් සාර්ථකව පවත්වාගෙන යමින් ජයග්‍රහණ අත්කර ගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර මෙවන් ක්‍රීඩකයින් සිටීම අප පාබල හමුදාවේ කීර්තිය තවදුරටත් පවත්වාගෙන යාමට ඉවහල්වන කරුණක් බව සඳහන් කරමු.

- 1999.11.18 ඊශ්‍රායලයේ පැවති ලෝක ශූරතා ආබාධිත බැඩ්මින්ටන් තරගාවලිය. යුගල ඉසව්වෙන් - ලෝකඩ පදක්කම.
- 2000.06.01 බෙල්ජියමේ පැවති පෙලෙන්ඩස් පැරාඔලිම්පික් බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2000.06.06 ජර්මනියේ පැවති ලෝක ආබාධිත විවෘත බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2001.06.05 දින ස්පාඤ්ඤයේ පැවති ආබාධිත විවෘත බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2001 වසරේ ජර්මනියේ පැවති විවෘත ආබාධිත බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2002 වසරේ කොරියාවේ බූසාන් නගරයේ පැවති ආසියා ශාන්තිකර කලාපීය 8 වන පැසිපික් ආබාධිත බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2004.07.10 දින සිට 2004.07.20 දින දක්වා මැලේසියාවේ පැවති 1 වන ආසියාතික පැරාඔලිම්පික් බැඩ්මින්ටන් තරගාවලිය නියෝජනය කිරීම.
- 2006 මැලේසියාවේ ක්වාලාලාම්පූර් නගරයේ පැවති 9 වන ආසියාතික ශාන්තිකර කලාපීය පැසිපික් ආබාධිත දුනු විදීමේ තරගාවලිය නියෝජනය කිරීම.
- 2008.12.22 දින ඉන්දියාවේ බැංගලෝර්හි පැවති ආසියා පැරාඔලිම්පික් බැඩ්මින්ටන් තරගය. ඒකල ඉසව්ව - රිදී පදක්කම, යුගල ඉසව්වෙන් රිදී පදක්කම, කණ්ඩායම් තරගයෙන් - රිදී පදක්කම.
- 2009.06.21 දින සිට 24 දින දක්වා ජර්මනියේ ඩෝත්මන් නගරයේ පැවති විවෘත ආබාධිත බැඩ්මින්ටන් තරගය. ඒකල ඉසව්ව - රන් පදක්කම, යුගල ඉසව්වෙන් - ලෝකඩ පදක්කම.
- 2009.09.07 දින සිට 12 දින දක්වා කොරියාවේ පැවති ලෝක කුසලාන ආබාධිතයන් සඳහාවූ බැඩ්මින්ටන් තරගාවලිය. ඒකල ඉසව්ව රිදී පදක්කම.







ජාත්‍යන්තර තරග බිමේ ජය කෙහෙලි නැංවූ තවත් ආබාධිත රණවිරු ක්‍රීඩකයින්ගේ විස්තර ඉදිරි කලාප වලින් ඔබට ඉදිරිපත් කරනු ඇත.


**ක්‍රීඩා අංශය**
**රෙපිමුබ ශ්‍රීලපාහ**

# MEANING OF SOME SAYINGS

- **All mops and brooms.**
  This refers to an untidy condition of the hair.
- **An honest man when there are no anchors around.**
  Ironical tribute.
- **A single line may have two hooks.**
  A dual purpose.
- **An Irish youngster for the bow oar.**
  He gets the spray over him.
- **A gunshot away.**
  A short distance about fifty yards.
- **A noggin to scrape.**
  A very difficult task.
- **An hour by sun.**
  An hour before sunset.
- **Come day go day God send Sunday.**
  Applied to a lazy person.
- **Cape St Mary's pays for all.**
  This locality has a prolific fishery.
- **Done it brown.**
  Overdid the thing - the allusion is to burnt bread.
- **Don't cut tails.**
  Don't be too particular. Fish tails were cut as a mark.
- **Douse the killock.**
  Throw the grapnel overboard.
- **Fair weather to you and snow to your heels.**
  Good luck on your way.
- **Fish in summer and fun in winter.**
  Everything in its place.
- **Give her the long main sheet.**
  To go afar with no intention to return.
- **Go to law with the devil and hold court in hell.**
  The odds are all against you.
- **Good morrow to you.**
  You are mistaken.
- **Jack is as good as his master.**
  The hired man is paid off when the end of the fishing season arrives, and is no longer a servant.
- **In a hobble about it.**
  Not worrying about the matter.
- **If you lose your grapnel, you'll find it in the fall.**
  You will find it on your account at the merchant's store.
- **I'll go bail for that.**
  I will vouch for the truth of it.
- **Let no man steal your lines.**
  Beware of competition.
- **Long may your big jib draw.**
  A good wish for the future.



- **May snow is good for sore eyes.**
  An old legend; many say it is true.
- **Nofty was forty when he lost the pork.**
  Never be sure of anything; the man Nofty held the best trump but allowed an opponent to reach game.
- **Out dogs and in dieters.**
  Prepare for the summer fishery.
- **Pigs may fly, but they are very unlikely birds.**
  Hope in vain.
- **Skin the old cow.**
  When cold March weather persists far into April the old cow dies of hunger.
- **Solomon Gosse's birthday.**
  This was Thursday when the usual was pork and cabbage and pudding, a favourite meal in Newfoundland.
- **The devil to pay and no pitch hot.**
  Unprepared for emergency. To "pay a boat" meant to put hot pitch over a seam between the planks.
- **There's favour in hell, if you bring your splits.**
  Said of currying favour through under-hand methods.
- **Tom Long's account.**
  To pay what you owe and have nothing left.
- **'Tis not every day that Morris kills a cow.**
  Favourable opportunity comes but seldom.
- **The old dog for a hard road.**
  Experience easily overcomes difficulty.
- **White horses on the bay.**
  On a stormy day waves break into foam. The allusion to white horses is apparently a reference to an Irish tradition of a chieftain named O' Donahue who was drowned in a lake in killarney on his wedding morn, and could afterwards be seen in a storm riding a white horse and preceded by maidens strewing flowers .
- **Wait a fair wind, and you'll get one.**
  Await opportunity.
- **When the snipe bawls, the lobster crawls.**
  After sunset.
- **You can't tell the mind of a squid.**
  This refers to an unreliable person. A squid can move backwards or forward.
- **You can get only one shot at a shell bird.**
  A shrewd person can be duped but once.
- **You are robbing Peter to pay Paul.**
  Needless change of useful things.
- **You'll do it in the long run.**
  Eventually you will succeed.
- **You are taking a rise out of me.**
  Your flattery is only for the purpose of making others laugh at me.




- **You are as deep as the grave.**
  Your real feelings are not easily judged from your appearance.

- **You are making a nice kettle of fish.**
  Making a mess of affairs.

- **You are moidering my brains.**
  Your noise is very disturbing.

- **Your tawts are too far aft.**
  The word "thwart" meaning a cross seat in a boat, is commonly pronounced "tawt" by Newfoundland fishermen. The expression means you are very wrong in your opinion.

- **You are too big for your boots.**
  You are assuming too much authority.

- **You can cut a notch in the beam.**
  Said when someone does the unusual.

- **You are like a fish out of water.**
  Not at home in your environment.

- **The older the crab, the tougher his claws.**
  It is not easy to fool a sophisticated person.

(Courtesy **"HISTORIC, NEWFOUNDLAND AND LABRADOR",** which was published by Department of Development and Tourism of the Province of Newfoundland and Labrador).

---

## වාසනාව උදාවීමට නම්

ඔබ කණගාටුවෙන් නම්
ජීවිතය එපා වී ඇත්නම්
යම්කිසි කාර්යයක නිරතවන්න
ඔබ දුප්පත් අයකු නම්
වැඩ කරන්න
එවිට ඔබ එයින් මිදේවි
පොහොසත් අයෙකුනම්
තවත් වැඩ කරන්න
එය තවත් තහවුරු වේවි
ඔබ බොහෝ විට
ගොඩක් දේ වලින්
පරාද වී ඇත්නම්
තව තවත්
උත්සාහවන්ත වෙන්න
අඩුපාඩු හඳුනගන්න
සියලු දෝෂ දුරුවේවි

ලාකෝ සුරංග අයිපී
'ඊ' ආරක්‍ෂක කණ්ඩායම
ජනාධිපති ආරක්‍ෂක සේනාව

## චයිට් හැකල් කාටූනය




අදහස : මේජර් හරිඳු වීරසිංහ ශ්‍රීලපාහ
චිත්‍ර : සෙ/පු/201875 කෝප්‍රල් ප්‍රේමලාල් විජේසිංහ (4 ශ්‍රීලපාහ)

# ජීවයෙන් පිරි හමුදා දිවිය

ජීවිතයේ සුන්දරවූ මෙන්ම ජවයෙන් පිරි ගිය යෞවන වයස පසු කොට මා මැදි වියට පැමිණෙමින් සිටිමි. මහනුවර ධර්මරාජ විදුහලින් ඉගෙනීම ලබා හමුදාවට බැඳෙන විට මාගේ වයස අවුරුදු 21කි. සමකාලීන පාසල් මිත්‍රයන් වෙනත් රැකියා කරනවිට මම හමුදා දිවිය තෝරා ගත්තෙමි. දැනුදු නිවාඩුවක් ලැබ මිතුරන් හා ඇසුරු කරන විට ඔවුන් ගෙවන නිදහස් දිවිය දැක යම් දොම්නස් සහගත සිතිවිලි ඇතිවූ අවස්ථා නැතිවා නොවේ. නමුත් ආපසු හැරී බලන විට සොල්දාදුවකු ලෙස ලැබූ අත්දැකීම් මා හට පුන පුනා පවසන්නේ යුද හමුදාව වැනි ගෞරවණීය ක්සේත්‍රයක මාගේ ජීවිතය ගෙවා දමන්නට ලැබීම ආඩම්බරයක් බවයි. හමුදාව තුල නැගෙන රිද්මය හඳුනන්නෙකුට පමණක් එහි රසය විඳිය හැකිය. ඉඳුරාම එක් දෙයක් කිව හැක. එනම් ජීවිතයේ සැඳෑ කාලයේ දී දැන් දැනෙන සතුට මීට වඩා සිය දහස් ගුණයකින් වැඩිවනු ඇති බවයි.

## අරන්තලාව

මාගේ හමුදා දිවියේ වඩාත් ප්‍රිය කරන කාලය මා ගෙවා දැමුවේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි මංගලගම, අරන්තලාව, ටැම්පිටිය, උණු වතුර බුබුල හා පොල්ලෙබැද්ද යන සිංහල මායිම් ගම්මාන වලය. එයිනුත් මා වඩාත් ප්‍රිය කරනුයේ අරන්තලාව ග්‍රාමයේ සිටි කාලයයි. එය 1990 වකවානුවයි. මා ලුතිනන්වරයකුව සිටියදී 6 ශ්‍රී ලංකා පාබල හමුදාවේ සී කණ්ඩායමේ ඛණ්ඩ භාර නිලධාරියකු ලෙස 35 දෙනකුගෙන් සමන්විත ඛණ්ඩයක් රැගෙන අරන්තලාව පොලිස් මුරපොල පිහිටි ස්ථානයේ කඳවුරු බඳින ලදී. එම කඳවුර පිහිටියේ අතහැර දමනු ලැබූ අරන්තලාව පාසල් භූමියේය. එය 1989 දී රුදුරු ත්‍රස්තවාදීන් විසින් සංඝයා වහන්සේලා 39 දෙනෙකු කපා කොටා ඝාතනය කරන ලද තැනයි. එහි ආදාහනයද එම ස්ථානයේම සිදු කර ඇත. මහඔය සිට කිමී 12ක් අම්පාර දෙසට ආවිට එම ස්ථානය හමුවේ. එසේම මහඔය සිට කිමී 2ක් පමණ පසුකරත්ම ගම අවසානයේ හමුවනුයේ කැලෑවකි. එය බිම්තැන්න පත්තුවයි. ඒ වන විට අරන්තලාවේ කිසිම පවුලක් ජීවත් නොවුනු අතර, සියලු දෙනා ත්‍රස්තවාදීන්ට බියේ ගෙවල් අතහැර ගොස් සිටියහ. අරන්තලාවේ සිට තවත් කිමී 7ක් පමණ කැලෑව පසුකර ගිය විට මංගලගම හමුවේ. එය ත්‍රස්තවාදීන් මෙන්ම අලි, දිවි, වලසුන්, මුවන් හා වල් ඌරන් බහුලව වෙසෙන කැලෑබද ප්‍රදේශයකි. එම බිම්තැන්න පත්තුව හිරු බැසයන සැඳෑ කාලයට ගත සිත සුවපත් කරවන අතිශය රමණීය වූ තැනකි.

## අම්පාරට යෑම


අපට පැවරී තිබුනේ ප්‍රධාන මාර්ගයේ ආරක්ෂාව තහවුරු කිරීම (පිකට් කිරීම) හා අරන්තලාව පොලිස් මුරපොලට ආරක්ෂාව සැපයීමයි. පොලිස් මුරපොල භාරව සිටියේ එස්අයි ජිනදාසය. ඔහු මා සමග ඉතා මිත්‍රව සිටියේය. මා කරන සෑම කටයුත්තක්ම ඔහුට නව අත්දැකීමක් විය. මොවුන් ගේ සිත් ශක්තිමත් කිරීමට මෙන්ම අප ගැන විශ්වාසයක් ඔවුන් තුල ඇති කිරීමට මා මෙන්ම සෙසු සෙබළුද නිරතුරුව කැප වූහ. වරක් මා මිමි 60 මෝටාර් විදිනය මීටර් 30ක් දුර ඇති ආරක්ෂක වැට මතට වෙඩිතබා පෙන්වූ අතර ඉතා ඉහළ ගිය මෝටාර් බෝම්බය නැවත පහළට එනවිට තම හිස මතට පතිත වේ යැයි සිතූ පොලිස් නිලධාරීන් ආවරණ වලට මුවා වූ අයුරු මම දුටිමි. හදිසි ආරක්ෂක සැලැස්ම ක්‍රියාත්මක කරන විට භයෙන් මිරිකුනු පොලිස් නිලධාරීන්ගේ මුහුණු මට තවමත් මැවී පෙනෙන්නා සේය. එක් අතකට ඔවුන් සාධාරණය. මන්දයත් ඒ වන විට වෙල්ලාවලි පොලිසියෙ සියලු නිලධාරීන් කොටි අත්අඩංගුවට ගෙන මරා දමා තිබුනි.

අප ඒකකය අම්පාර රාජකාරි සඳහා පනාගොඩ සිට පදියතලාවට එනවිට බෙහෙවින්ම රෑ බෝවී තිබුනි. එහිදී අපට දැනගන්නට ලැබුනේ වෙල්ලාවලි පොලිසියේ සියලු නිලධාරීන් කොටි අත්අඩංගුවට ගෙන මරාදමා ඇති බවත්, 6 ශ්‍රීලපාහ කණ්ඩායමක් කඳවුරු බැඳ සිටි කලවංචිකුඩි හා කල්මුනේ කඳවුරු වටලා ප්‍රහාර දීමට පටන්ගෙන ඇති බවත්ය. මා ඉතා ගරු කරන කර්නල් සරත් ඇඹව කලවංචිකුඩි කඳවුරේත් මා සමග දියතලාවේ එකට පුහුණු වූ කපිතාන් සම්පත් කරුණාතිලක කල්මුනෙහිත් සටන් වදිමින් සිටීම නිසා එහි යන අපට අලුත් ශක්තියක් ලැබී තිබුණි. එනිසාම අපි විමසිලිමත්ව හා වඩාත් උද්‍යෝගිමත්ව කටයුතු කළෙමු. ඒ වන විට ඊළම් 11 යුද්ධය ආරම්භ වී තිබිණි.

## පිකට්

මාගේ භට පිරිසේ සැරයන්වරයා වූයේ සැරයන් වික්‍රමසිංහ එච්පී ය. ඔහු ඉතාම නිර්භීත මෙන්ම විනයගරුක පුද්ගලයෙකි. උදෑසන පිකට් (මාර්ග ආරක්ෂක මුරය) එකට යෑමට සූදානම් වී කැලෑවට බසින දිසාව මා විසින් තීරණය කරනු ලබයි. අපි පිකට් කරන්නේ අරන්තලාව සිට මහඔය දෙසට කි:මි: 6ක් මග දෙපසයි. මා පිකට් එකට යන්නේ ස්ථිර මාර්ගයකින් නොවේ. මෙසේ කරන විට ත්‍රස්තවාදිනට අපගේ නිශ්චිත ගමන් මාර්ගයක් සොයා ගැනීමට අපහසුය. මේ නිසා මා යටතේ සිටි කිසිදු භටයකුගේ හෝ පොලිස් නිලධාරියකුගේ මරණයක් සිදුවූයේ නැත. මේ ගමන් සඳහා බල්ලන් දෙදෙනකුද අප සමග යාමට පුරුදු වී සිටියහ. අප පිකට් කරන මාර්ගය දෙපස කැලෑව තුල කොටි නිතරම ඔත්තු බලමින් සිටින බව අප දැන සිටියෙමු. වරක් මහඔය සිට පැමිණි පොලිස් පිකට් එකට ප්‍රහාර එල්ලවීමෙන් දොලොස් දෙනෙක් මරණයට පත් වූහ. ඊට සතියකට පසු එම ස්ථානයේදීම එල්ලවූ ප්‍රහාරයකින් තවත් 7 දෙනෙක් මරණයට පත් වූහ. මේ අයුරින් දෙපැත්තේ පිකට් කළ සෙසු භට පිරිස් ප්‍රහාර වලට ලක්වුවත් මාගේ භට පිරිස් වෙත කිසිදු ප්‍රහාරයක් එල්ලවූයේ නැත. දෛනික ක්‍රියාවලියක් වූ පිකට් යන වචනය එවකට මට හොඳින් හුරුපුරුදුය.

පිකට් එක යන අතරවාරයේ තවත් බොහෝ දෑ සිදු වේ. කැලෑව මැදින් ගලන රැකම් වැව දක්වා යන ඇලේ දෙපස විශාලව වැඩුනු ගස් වැල් යට පිරිසිදු සීතල වතුර වලවල් දක්නට තිබුණි. පිකට් කිරීමට කැමති හා ඒ සඳහා ඉතා දස්කම් පෙන්වන ලද කිහිප දෙනෙකු මා විසින් තෝරාගෙන තිබුනි. ඔවුන් සමග අවට වනයෙන් වැසුනු කඳු නැගීම ද මාගේ පුරුද්දකි. ගස් වැල් හා ගල් ගුහා සහිත එම කඳු ඉතා ප්‍රියංකරය. අලි වලසුන් ලැගුම් ගත් තැන් නිරීක්ෂණය කිරීම අමුතු ආශ්වාදයක් ගෙන දුනි. වනයෙන් නැගෙන රිද්මය හැඳිනිය හැක්කේ වනයට ඇලුම් කරන අය හට පමණි. උදෑසන වනය තුලින් අහස දෙස බලන විට මගලවටන් ආරුවේ ජල පහරේ හැඩයටම වංගු ගැසෙමින් බොහෝ දුර විහිදී යන ආකාශ ගංගාව සැබවින්ම චමත්කාර ජනකය. එම ආකාශ ගංගාව මා හිතේ නොමැකෙන සේ රැඳී ඇත. ඒ දිනවල පොලිසියට පැමිණි අලුත් එස්අයි කෙනක් ද පිකට් එක යෑමට පැමිණියේය. ඔහු නිලධාරියකු වූ නිසා හෝ බිය නිසා හෝ පිකට් එක යන අතරතුර මා ළග සිටියේය. මෙය මාගේ ක්‍රියාකාරකම් වලට මහත් බාධාවක් විය. සැමටම කැලයේ ඇවිදිමට දක්ෂකමක් නැත. දිනක් මා එබෙන්නට පුරුදුවී සිටි වතුර වලක දෙතුන්වරක් එබී ගසක් යට හිඳගෙන සිටින විට මා අනුකරණය කරමින් මා හා ගමන් කළ අන් අයද වතුරේ දෙතුන් විටක් ගිලෙමින් ඇඟ සිසිල් කරගන්නා ලදී. එස්අයි අජිත් මහතා කිසිවක් නොකොට බිම හිඳගන්නවා දැක අපත් සමග එනවානම් එක කණ්ඩායමක් ලෙස වැඩ කළ යුතු බවත් ඒ නිසා වතුර වලේ දෙතුන් විටක් එබී එන ලෙස මම දැන්වීමි. එවිට අනේ චීෆ් මට පුරුදු නැහැයි කී විට මාගෙ විධානය පරිදි සගයන් එස්අයි උස්සා වතුරට දමන ලදී. පසුව හැමදාම නිල ඇඳුමින් නාන්ට වනවායැයි පවසා එස්අයි පිකට් එක යෑමට ආවේ නැත. එය මට විශාල අස්වැසිල්ලක් විය. පිකට් එක අවසන් වන තැන ඇති කුඩා පාලම යට බෝම්බ අටවා ඇත්දැයි



බැලීමට හට පිරිස් සමග මමද එහි යමි. ඒ පාලම් බිත්ති මත ඇඳ ඇති හා ලියා ඇති වදන් ගැහැණියක දුටුවහොත් ඈ පත්වන අපහසුතාව හිතා ගැනීමටත් අපහසු තරම්ය. ඉන් සමහර සෙබළුන් පෙලෙන මානසික අසහනයක් මනාව පිළිබිඹු වේ. යුද වදින සෙබළාට තම අවශ්‍යතාවයන් සැපිරීමට යම් ක්‍රමයක් ඇති කරදිය යුතුයැයි මාගේ අදහසයි.

## කඳවුරු ජීවිතය

මා දිවා කාලය ගත කිරීමට තෝරාගත් ස්ථාන අතුරින් විශාල ඇටඹ ගසක් අදටත් මතකයේ ඇත. හතර දෙනෙක් ගස වටේ අත්වැල් බැඳගත්තත් එය ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවීය. ගස එතරම් විශාල වුවත් ඇඹිලි පුරුකකට වඩා අඹ ගෙඩි ලොකු නොවීය. මේ ගසේ බටගොයි, ගිරවුන්, නීලකොබෙයියන්, හම්බාවන් වැනි සතුන් විමසිල්ලෙන් බලන්නකුට දැකගැනීමට හැකිය. අරන්තලාව පොලිස් මුරපොලේ හට පිරිස් සඳහා මැටියෙන් සාදා ඉළුක් සෙවිලි කළ ශාලාවක්ද, මා සඳහා පාසල් ගොඩනැගිල්ලේ එස්අයි පිනදාස මහතාගේ කාමරයද ලැබී තිබුණි. මහඔය පොලිසියෙ සිට පැමිණි වතුර බව්සරයෙන් ටැංකියකට වතුර පුරවා වැඩි කොටස ළිඳකට දැමීම සතියට දෙතුන් විටක් කෙරුණි. මම පොලිස් මුර පොලට පැමිණිදා සිට එහි වෙනස්කම් රාශියක් සිදු කළෙමි. අප පොලිස් නිලධාරින් ගේ ජීවිත ආරක්‍ෂා කරදෙන බව ඇදහූ ඔවුහු මාගේ සියලු වැඩ කටයුතු වලට උපරිම සහයෝගය දැක්වූහ. අපි ආරක්‍ෂක වැට බංකර් සහ විමර්ශන කුටි අලුතින් සැලසුම් කර සකස් කළෙමු. මේ සඳහා තේක්ක කඳන් අවට ඇති තේක්ක කැලයෙන් නිර්ලෝභිව කපා ගැනුනි. හදිසි ප්‍රහාරයකදී කළ යුතු දෑ නිතර නිතර පුරුදු කිරීම නිසා කඳවුරේ බියකින් තොරව ජීවත් වීමට හැකි පරිසරයක් පැවතුණි. කොතරම් රාජකාරි මධ්‍යයේ වුවද සෑම දිනකම සවස ක්‍රීඩා කරන්නටද අපි අමතක නොකළෙමු. එහිදී වැඩි වශයෙන් කෙරුනේ වොලිබෝල් ක්‍රීඩාවයි. මෙනිසා සියලු දෙනාට කඳවුර ප්‍රිය ජනක තැනක් විය.

කඳවුරේ වෙඩි තැබීමේ තරග සවස් කාලවලදී පැවැත්විණි. එහිදී ඉලක්ක පත් වූයේ මීටර් 50ක් පමණ ඈතින් කඳවුරු ආරක්‍ෂක වැටෙන් කනුවක් උඩ තැබූ හිස් බෝතල්ය. එහිදී සිදු කෙරුනේ තරග කරුවන් දෙදෙනෙකු අතර තරග පැවැත්වීමයි. බොහෝවිට එම තරග වලට සහභාගි වූයේ පොලිස් නිලධාරින්ය. ඔවුහු මා සමග තරග කර මා පැරැද්දීමට බොහෝ උනන්දුවෙන් වෙඩි තැබීම් කළහ. නමුත් ඒ සෑම අවස්ථාවකදීම ඔවුන් සිගරට් පැකට් ගණන් පැරදිනි. ඔවුන්ව තරගයට උනන්දු කරවීම සඳහා මා ඔවුන්ට වඩා මීටර් 20 පමණ පිටුපස සිට වෙඩි තැබීම සිදුකළ අතර, මා ගානේ පතුරම් සැපයීම වැනි උපක්‍රම ද යොදන ලදී. කඳවුරට බටහිර දෙසට වන්නට වැවී තිබුණු ඉලුක් කෑමට කුරු අලින් තුන්දෙනෙක් රාත්‍රී කාලයේදී පැමිණීමට පුරුදු වී සිටියහ. උන්ව සෑම දිනම ගෙන්වා ගැනීමේ අදහසින් මා එම ඉලුක් වලට ලුණු දියකර ඉස්සවන ලදී. ලුණු රසට පුරුදු වූ අලින් පසුව ලුණු පැකට් විසි කළ විට ඒවා කෑමට පවා හුරු වූහ. එකල ලුණු දමා බංකරය අසලටම ගෙන්වාගන්නා අලින් කඳවුරු විදුලි පහන් ආලෝකයෙන් වඩා සමීපව බැලීමේ මහඟු අවස්ථාව අපට උදාවිය.

බොහෝවිට රාත්‍රියට කොටි පොලිස් මෝටරෝලා යන්ත්‍රයට කතා කිරීමට පුරුදු වී සිටියහ. කැඩුනු සිංහලෙන් කතා කරමින් ඔවුහු පොලිසියේ අය සමග ව්‍යාජ මිතුරුකමක් ඇති කරගන්නට උත්සාහ දැරූහ. එය දැනගත් මම පොලිසියේ අයට බැනවැදී එම ක්‍රියාවලිය නවතා දැමුවෙමි. දිනක් රාත්‍රී පොලිසියේ අයකු මුර රාජකාරි පැහැර හැරි අවස්ථාවක මාගේ හටයෙකු විසින් පහරදී කඳවුර තුල සුලු කලබලයක් ඇති විය. මා හා එස්අයි පිනදාස අතර තිබුණු මිත්‍රකම නිසා මෙතෙක් කල් පොලිස් නිලධාරින් හා හමුදා හටයන් සිටියේ මහත් සමගියෙනි. එම සිදුවීම හරහා ඒ සමගියට බාධා එල්ලවන බැවින් අදාල සිදුවීමට සම්බන්ධ වූවන් හට බැරැක්ක නීතිය අනුව දඬුවම් පමුණුවන ලදී. ඊට පසුදින පොලිසියේ කිහිපදෙනකුම පහරකෑ පුද්ගලයා සමග පැමිණ බෙහෙත් ගැනීමට මහඔය රෝහලට යාමට අවශ්‍ය බව එස්අයි පිනදාසට පවසා සිටියහ. සිද්ධිය වූ දින මා විසින් මාගේ හට පිරිස් වෙත දුන් නියෝග කඩකර ඇති නිසා එදින රාත්‍රියේ සියලු දෙනා පෙලගස්වා සැරයන් වරයාට හැර අන් සියලුම දෙනා හට මා විසින් මුශ්ටි ප්‍රහාර ලබාදෙන ලදී. මෙය දුටු එස්අයි පිනදාස පසුදින උදෑසන පොලිස් නිලධාරින් පෙලගස්වා කිසිම අයෙක් රෝහල වෙත රපෝර්තු නොකරවන බව දන්වා සිටින ලදී. එදින උදෑසන පිකට් එක යෑමට පෙල ගැසුනු පොලිස් නිලධාරින් අමතා මා කතා කළ විට ඔවුන් පෙරසිටියා සේ සාමකාමීව සිටින්නට කැමති බව සියලුදෙනා පැවසූහ. ඉන්පසු අප අරන්තලාවෙන් සමු ගෙන යන තෙක්ම සියලු දෙනා ඉතා සාමකාමීව සිටියහ.

කඳවුරට බටහිරින් මීටර් 200 පමණ දුරින් මහ පාර අසල අරළු, බුළු, ගම්මාළු වැනි වටිනා ඖෂධීය ශාක අක්කර 2ක පමණ කොටසක වගා කර තිබුණි. බොහෝ කලක් තිස්සේ වෙනත් ගස් වැල් වැවී තිබුණු නිසා එය කැලයක් සේ පෙනුනත් සැලකිල්ලෙන් බලන විට එය ඖෂධ වනයක් ලෙස හඳුනා ගැනීමට හැකි විය. කඳවුරට නැගෙනහිර පිහිටි තේක්ක කැලය තුල ඊලම් 2 යුද්ධය පටන් ගැනුනු මුල් දින කිහිපය තුල සිදුවූ සමහර සිදුවීම් ඉතා අමිහිරිය. එවැනි මතකයන් මෙන්ම සමහර සිදුවීම් විවෘතව ලිවිය නොහැක.

## වනයේ ඇවිදයාම

මාර්ග ආරක්‍ෂාවෙන් පසු හැන්දෑවේ සිට පසුදින 1000 පැය වනතෙක් මහ පාර සම්පූර්ණයෙන් වසා දැමෙයි. මෙම කාලය තුල අවට කැලයේ සිටින්නේ සතුන්, ත්‍රස්තවාදීන් හා අප පමණි. සවස් යාමයේ එළිමහන් පතන් හා අඳුරු ගස්ගොමු තුලින් සතුන් සොයා නිශ්ශබ්දව ඇවිද යෑම අතිශය ආශ්වාදජනකය. එසේම ත්‍රස්තවාදීන් ද ගැවසෙන හෙයින් එහි ත්‍රාසජනක බවද අඩු නැත. එහි වනය ඉතා විශාල ප්‍රදේශයක් පුරා විහිදේ. එය උතුරට සොමාවතිය දක්වාත් දකුණට ඉගිනියාගල අභයභූමිය දක්වාත් පැතිර ඇත. කැලය මැදින් උතුරට කිලෝ මීටර් 20ක් පමණ ගියවිට වැලිකණ්ඩිය නමැති දෙමළ ගම හමුවේ. ඒ ආශ්‍රිතව රුකම් වැව හා උන්නච්චිය දෙමළ ගම හමුවේ. මෙම කැලේ තනි අලින් කිහිප දෙනෙක්ම සිටිති. අප පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් කිසිදු කතා කිරීමක් නැතිව සංඥා මගින් පමණක් කැලයේ ගමන් කිරීමට පුරුදු වී සිටියේය. සතුන් වතුර බොන තැන් අලුත් ඉළුක් ඇති තැන් අපි සියලු දෙනා ඉතා පැහැදිලිව දැන සිටියෙමු. සතුන් ගේ හැසිරීම මම හොඳින් හඳුනමි.

කැලයේ ඇවිදිමේදී අතහැර දැමූ ගෙවතුවල දොඩම්, පේර, දෙහි පැපොල් වැනි පලතුරු කඩාගෙන කෑමට හැකි විය. අරන්තලාවේ සිට දකුණු දෙසට කිමි 10ක් වනය මැදින් යන විට මගලවටන් ආරු මුල් කොටස හමු වේ. මැකී ගිය දඩමං පොතේ මෙන්ම දොස්තර ස්පිටල් විසින් ලියන ලද පොත් කිහිපයකම මෙම ජල පහර ගැන කියවේ. පිරිසිදු ජලය ගස් අතරින් ගලනු දකින මා හට එම දියපහරට පැන නෑමට නිතැතින් සිතුවිලි පහළවේ. එනිසා පුරාණ වැද්දන් පරිභෝජනය කළ මගලවටන් ඇලේ පැන රිසිසේ වතුර නෑවෙමි. මෙම ප්‍රදේශය ඝණ කැලයෙන් වැසී ඇත. වරක් කිමි 20ක් කැලේ මැදින් දිවිලාන වැව තෙක් ගමන් කිරීමේදී සවස 4ට පමණ වැව් පිටිය පුරා අලි 35-40 ක පමණ රංචුවක් දක්නට ලැබුණි. ඒ අතර ඇත්තු සිටියහ. ඒ ගමනේදීම ප්‍රථම වරට කළු වලසෙක් මීටර් 10 පමණ දුරට දැකගත හැකිවීම සුවිශේෂයි. අප එනු දුටු වලසා කළු ගලක් මත සිට එම ගල වෙත නැමී තිබූ විශාල ගසක අත්තකට පැන අඳුරුවී ගිය වනය තුලට පැනගත්තේය.

මෙම ප්‍රදේශයේ පුරාණ වැදි ජනයා ජීවත් වූ නිල්ගල, රතුගල යන වැදි ගල්ගුහා පසුව ගම් වශයෙන් ප්‍රසිද්ධවී ඇත. තවද රජෙකු සැඟව සිටි කන්දක්ද මෙම භූමි ප්‍රදේශයේ පිහිටා ඇත. ඒ යන ගමනේදී හදිසි පණිවිඩ ඇතොත් ලබා ගැනීම සඳහා ගුවන් විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍රයක්ද රැගෙන යාමට අපි අමතක නොකෙළෙමු. රාත්‍රියට ෆ්ලෑෂ් ලයිට් එල්ලකර බැලීමේදී ඇතැම් ගස් යට සතුන් ගේ දිලිසෙන ඇස් සමූහයක් දක්නට ලැබේ. එම අවස්ථාවලදී

මම දඩයම් නොකරමි. වනයේ සුන්දරත්වය පමණක් විඳගනිමි. වෙනත් දඩයක්කරුවන් මෙම කැලෑවට නොයන හෙයින් සත්තු බහුලව සිටිත්. අරන්තලාවේ සිට දකුණට යෑම මෙසේ අශ්වාද ජනක වුවත් උතුරු දෙසට යෑම එසේ නොවේ. එය ත්‍රාසජනකය කඳවුරේ සිට කි.මී. 10ක් පමණ උතුරට ගිය විට වැලිකණ්ඩිය දෙමළ ගම හමුවේ. එය ත්‍රස්තවාදීන් හට හිතවත් ගමකි. මාර්ග ආරක්‍ෂක මුරයන්ට පහර දීමට පෙර බොහෝ විට ත්‍රස්තවාදීන් එකතු වන්නේ මේ ගමේදීය. ඔවුන් පසුබැසිමේදිද මේ ගම හරහා ගමන් ගන්නා බව එම ගමට ගිය අවස්ථාවකදී දැනගන්නට ලැබුනි. මේ නිසා අප ඒ පෙදෙසට ගියේ දැඩි සුපරික්‍ෂාකාරිවය.

දිනක් සවසක එම අඳුරු වනයේ දඩයමේ යනවිට අපයන දිශාව හරස් කරමින් තනි අලියෙක් සිටියේය. ඌද අප සිටිනු දැක සෙමෙන් කැලයට වැදිනි. අපි අලියා මගහරින අදහසින් ගමන් මාර්ගය වෙනස් කොට වෙනත් පැත්තකින් බලාපොරොත්තු වූ කුඩා දියකඩිත්ත වෙත පැමිණියෙමු. එහිදී කලින් අපව මගහැර ගිය අලියා ගසක සෙවණැල්ලක් තුළ නොසෙලී සිටින අයුරු දැක ගත හැකිවිය. යාර 25ක් පමණ මගහැර ගිය අලියා එක වරම හොඬවැල ඔසවා කටින් පිඹිමින් ඉදිරිපස ගාත් දෙක බිම අනිමින් අපට පහරදීමට පැනගෙන ආවේය. උගෙ කට රෝස පාටට පෙනුණි. අප දෙසට අලියා එනු දැක මම උගේ හිසට උඩින් යනලෙස වෙඩි තැබුවෙමි. එහෙත් එය ප්‍රමාණවත් නොවූ හෙයින් අප නුදුරුව තිබූ ගල්තලාවක් උඩට දිවගත්තෙමු. ඒ වනවිට කැලය හොඳින් හුරුවී සිටි හෙයින් අලියකු පහරදීමට පැමිණියහොත් කළ යුතු දෙය කල් තියා සැලසුම් කර තිබිණ. පසුව යාර 10ක් පමණ අප සිටි තැනට දිව ආ අලියා වෙඩි ශබ්දයට බියවී වෙනත් පැත්තකට දිව ගියේය. මම කිසි විටෙක අලියකු මැරීමට අනුබල නොදුන්නෙමි. මෙවන් අවස්ථාවක හොඳින් කටයුතු කිරීමට නම් නිරවුල් මනසක් අවශ්‍යය. හමුදා නිලධාරියකු ලෙස පීඩනයක් පවතින අවස්ථාවේ නිරවුල්ව කටයුතු කිරීමට ලැබූ මෙවන් අභ්‍යාසයන් පසු කාලීනව පැවති දරුණු සටන්වලදී මා හට නිරවුල්ව සිතීමට මනා පිටුවහලක් විය.

මේ අතර, අප තැබූ වෙඩි ශබ්ද ඇසී සැරයන්වරයා ඇතුළු කිහිප දෙනෙක් කඳවුරේ සිට අප සොයා වේගයෙන් පැමිණියහ. එවකට මාගේ හට පිරිස් අතර එවැනි තද බැඳීමක් පැවතිණි. දිනක් කැලයේ ඇවිදිමේදී අලින් මියගිය සොහොනක් බඳු ස්ථානයක් හමුවිය. එහි අලින් තිදෙනෙකුගේ ඇටකටු තිබිණි. ඉන් අලින්ගේ දත් 4ක් මා විසින් ගලවා ගන්නා ලදී. එයින් බෙහෙත් පිණිස ගෙන ආ දත් දෙකක් තවමත් ගෙදර ඇත. බොහෝ අය කම්මුල් ගාය වැළඳුනු අවස්ථාවල මාගේ මවගෙන් දැනුදු ඒවා ඉල්ලාගෙන යති. දිනක් උතුරු වනයේ දඩයමේ යාමේදි කැලය තුල අප සිටි තැනට සමීපව සතකු දිවයන හඬ ඇසුනි. එසැනින්ම කැලයෙන් එලියට මතුවූ විශාල කුළු හරකෙක් අප මැදින් දිව ගියේ මා සමග ගිය අයකුටද ඇනගෙනය. පහර කෑ අය ඌ ගේ පිටමතින් යාර 7 - 8 ඈතට යනතෙක් අපහට කිසිවක් කර ගැනීමට නොහැකිව බලා සිටීමට සිදුවිය. පසුව හරකාගේ පිටින් බිම වැටුනු ඔහුව පරීක්‍ෂා කිරීමේදී වාසනාවකට මෙන් තදබල තුවාලයක් සිදුවී නොතිබිණි. තවත් දිනක් වනයේ ඇවිදිමේදී වැදි ගම්මානයක් හමුවිය. අප දුටු සැනින් එහි සිටි ගැහැණු සියළු දෙනා ළමයින්වද ඇදගෙන කැලෑව තුලට දිව ගොස් සැගව ගත්හ. එහිදී හමුවූ ඉතා කුලෑටි පිරිමින් දෙදෙනකු සමග අපි කතා කිරීමට උත්සාහ දැරුවද ඔවුන් බොහෝ සේ බියපත් වී සිටි බැවින් එම අදහස අතහැර දමන ලදී.

## දඩයමේ යෑම

ඉතා දක්‍ෂ ලෙස දඩයම් කිරීමට හුරුවී සිටි මා සතුන් දඩයම් කිරීම සඳහා අවි වර්ග 3ක් තිබිණි. ටී 56 මාගේ පුද්ගලික අවිය ද, මා විසින් සිරෝ කරන ලද ග්‍රාම ආරක්‍ෂකයකු හට අයත් 303 රයිෆලය හා පොලීසියට අයත් බෝර 12 ෂොට්ගන් එකක්ද මේ සඳහා භාවිතා කරන ලදී. දඩයම් වලදී මා පමණක් වෙඩි තැබූ අතර ආරක්‍ෂාවටත් මැරුනු සතුන් කඳබැඳ ගෙන රැගෙන ඒමටත්, දඩයම් මුණගැස්වීමටත් අන් අය සිටියහ. දඩයා යනුවෙන් ගම්මුන් විසින් හඳුන්වන පුද්ගලයෙක් ගියවිට කිසිදු සතකු හමු නොවේ. හට පිරිස් වලට බයේ පැනයන මුවන් ගෝනුන් ඌරන්ගේ මංකඩවල් ගණනාවක් මම දැන සිටියෙමි. එසේ නොමැතිනම් අවශ්‍ය දිසාවට සතුන් එලවා ඉලක්කය පුහුණු කළ අවස්ථා ද තිබුණි. ගිනිගත් ඉළුක් පතන් මැදින් සතුන් දිවීමේදී අනිවාර්යෙන් මුවමස් ගෝනමස් හෝ වල් ඌරුමස් දවල් කෑමට සකස් කිරීමට හැකිවිය. රුකම් වැවට ගලා යන ඇල පාරක විශාල වතුර වලක් පිකට් එක අවසන් වන තැන තිබුණි එම වලට සෑම උදෑසනම දියකාවුන් පැමිණ සිටි අතර පළමු වෙඩිල්ලේ සිට දියකාවුන් සියල්ල ඉගිලී යනතුරු වෙඩි තැබීමේදී අඩුම තරමින් දියකාවුන් 6ක් වත් වෙඩි තබා බිම දැමීමට තරම් ටී 56 අවිය අතට හුරුවී තිබුණි. පළල් තටු සහිත පිලිකනයන් අහසේ ඉගිලී යන විට උන් වෙඩි තැබීම පහසු කටයුත්තක් විය. මේ වැඩ නිසා මාර්ග ආරක්‍ෂාව සඳහා සහභාගිවන හට පිරිස් මා වෙත ඔවුන් ගේ පූර්ණ විශ්වාසය තබා තිබුණි. ගෝනකු වැනි විශාල සතකු දඩයම් කළ පසු පොලිසියට පණිවුඩයක් යැවූ විට එස් අයි පිනදාස මහේන්ද්‍රන් ජීප් රථය පදවාගෙන හැකි තරම් දුර කැලේ මැදින් අප සිටි තැනට පැමිණේ. මෙම කැලය තුල පාරවල් නොමැතිව වුවද ජීප් රථයක් පදවාගෙන යෑමට හැකිය.

මම අතීතයේදී සතුන් මැරීම ගැන දැන් පසුතැවෙමි. එම නිසා දඩයම් ගැන විස්තර වශයෙන් ලිවීමට අපහසු බවක් දැනේ.

## වෙනත් කඳවුරු

මාගේ නිලධාරි අණදෙන වශයෙන් කටයුතු කරන ලද්දේ මේජර් ජේපී වර්ණකුල ය. ඔහු මාගේ හමුදා ජිවිතයේ පළමු නිලධාරි අණදෙන්නාද විය. ඔහු යටතේ ටැම්පිටිය, කොස්ගොල්ල, උණුවතුරබුබුල, රතුපස් උහන, පොල්ලේබැද්ද මංගලගම, අරන්තලාව, යන ගම්වල කඳවුරු පිහිටා තිබුණි මා දීර්ඝ කාලයක් අරන්තලාවේ සිටියද සුලු කාලයකට හෝ මේ සියලුම කඳවුරු වලද රාජකාරී කොට ඇත. එම සෑම කඳවුරකම පාහේ සිදුවූ මතක සිටින සිදු වීම්ද අපමණය.

මංගලගම දි මම අඩි තුනක් පමණ දිග පිඹුරු පැටවකු අල්ලා ගත්තෙමි. මුලදි ඌ දරදඬු වුවත් පසුව හීලෑ විය. ක්‍රමයෙන් පිඹුරු පැටවා මාගෙ උණුසුමට හුරු වූයේය. ඒ සමගම තවත් යෝධ පිඹුරන් 4 දෙනකුද අප විසින් ඇති කරන ලද අතර, උන් කාලතුවක්කු උණ්ඩ හසුරා එවන ලද පෙට්ටි දෙකක දමනු ලැබීණි. එම පිඹුරන්ගෙන් එකෙකු කහපැහැති වූ අතර, අනෙක් තිදෙනා දිගින් අඩි 10කට වඩා වැඩිය.

මා ටැම්පිටිය කඳවුරේ සිටින විට ටැම්පිටිය වැවේ දිය නෑමට පුරුදුවී සිටියෙමි. වැව තිබෙන්නේ කඳවුර පිටුපසින්ය. දිනක් වැවේ පිහිනමින් සිටිනවිටදී වැව මැදට වන්නට කොටයක් තිබෙනු දැක ඒ දක්වා ගොස් නැවත ගොඩට ඒමට සිතා ඒ දෙසට පිහිණුවෙමි. කොටය තිබුණේ ගොඩ සිට මීටර් 250ක් පමණ ඈතිනි. මා ඒ දෙස වරින්වර බලමින් ඊට කිට්ටු වෙද්දී නිකමටමෙන් ගොඩ බිම දෙස බැලිමි. එවිට ගොඩසිටි කිහිපදෙනක් මාදෙස බලා මොනවදෝ අතින් කියනු පෙනුනි. නමුත් මා පිහිනු දුර වැඩි බව ඔවුන් පවසන්නේ යැයි සිතූ මා නැවතත් කොටය දෙසට පිහිනුවෙමි. නමුත් ගොඩබිම දෙස බැලූ මා හට එහි සිටි පිරිස අතර අමුතු කලබලයක් පවතින බව දැනුනි. කෙසේ වෙනත් කොටය ආසන්නයට වින් සිටි මා එහි දුටුවේ කොටයේ මුල් කොටස කිඹුලෙකුට සමාන බවකි. එහෙත් ඒ කිඹුලෙකු බව නිකමට හෝ නොසිතිණි. නමුත් ගොඩ සිටින අය හැසුරුනු ආකාරයත් කොටයේ හැඩය ආදියත් අනුව කුමක් සිදුව ඇද්දැයි මා හට ක්ෂණයකින් අවබෝධ විය. සැබවින්ම එහි සිටියේ කිඹුලෙකි. වේගයෙන් හැරී ගොඩබිමට පිහිනු මාහට ඒ අතරවාරයේ කිඹුලන් පිළිබඳ අසා ඇති භයානක සිදුවීම් මෙනෙහි වන්නට විය. නමුත් වාසනාවකට මෙන් කිඹුලා මා හට පහර දීමට පැමිණියේ නැත.

**මේජර් ජේඑම්අයිඑස් ජයසුන්දර ශ්‍රීලපාහ (විශ්‍රාමික)**



# රන් අකුරෙන් නම් ලියවෙන රණබිමේ වීරයෝ

බුදුන් තෙවරක් වැඩිය සිරිලක
බලෙන් ගන්නට යුද වැදී
විදෙස් හමුදා සමඟ රණ බිම
වීරයන් ලෙස යුද වැදී
දැයේ විරුවන් ලක රකින්නට
පිදූ ජීවිත හද ලැදී
මෙරට බේරා ගත්තු විරුවන්
සදා පුදනෙමි පින්දිදී

එදා නරනිඳු ගැමුණු කුමරුන්
සමඟ යුද පෙරමුණ රැඳී
සටන් කළ ඒ වීර සෙබළුන්
අදත් සටනේ ඇත රැඳී
දැයට හිතවත් කමින් දිවිදුන්
ඔබේ නාමය හද රැඳී
ණයගැතියි ඔබ සැමට විරුවනි
ගොතා පවසමි හද බැඳී

වසර තිහකට පමණ පෙරසිට
බලෙන් ගන්නට රට බෙදා
කෲර කොටි රැල යත්න දැරුවේ
ලේ පිපාසෙන් මයි සදා
දැය සමඟ ජාතිය රකින්නට
දිවිය පිදු විරුවන් මෙදා
මෙලක පවතින තුරා විරුවනි
අමරණීයයි ඔබ සදා

උතුරුකරයේ මුහමලේදී
ඉදිරි රැකවල් වළල්ලේ
වෙඩි හඬෙන් මුසු රණ බිමේ මැද
දරා ගිනි අවි තුරුල්ලේ
මරුව පෙනි පෙනි රැඳී සිටියා
මියෙන තුරු ඔබ මුහමලේ
සටන් වැදි මගෙ එකම පුතු අද
නිදයි මිහිකත තුරුල්ලේ

බහතෝරන වියේ පටන්
සෙල්ලං අවි ගෙන සුරතට
බියක් හිතේ නැතුවයි ඔබ
යනව කිව්වේ හමුදාවට
ආයුබෝවන් කියමින් පුතු
යෙදෙමින් සිටි රැකියාවට
රණවිරුවෙක් වෙන්නද පුත
එක්වුයේ හමුදාවට

යුධ පිටියේ ගැමුණු කුමරු
එළාර රජු පැරදෙව්වා
හෙළ විරුවන් ලෙසින් එදා
මුළු සිරිලක බැබලෙව්වා
ගැමුණු රජුගෙ රණවිරුවන්
හෙටත් ලකේ උපදිනවා
පුතේ ඔයා හැමදාමත්
රට රැකුමට එක්වෙනවා

පුතුගෙ විපත මවගෙ උපත
එකම දිනක සිදු උනේ
කොහොමද මව් සිහිකරන්නේ
ඈ ඉපදුනු දිනේ
ජාතික වීරයෙකු ලෙසින්
දිවි පිදුවත් අනේ
පුතුගෙ නමත් රන් අකුරෙන්
ලියවෙයි මතු දිනේ

ආදර මව්පියො සමඟින්
දෙන්නම ඔබෙ අක්කලා
නෑදෑ හිතමිතුරු කැලත්
හඬනව අද දුක්වෙලා
ඇසුරු කරපු හැම සමඟින්
ගම්වාසින් හඬවලා
ඔබ සුරතල් කෙරූ පුංචි
පුතුන් තිදෙන තනිවෙලා

ඔබ තරුණෙකු උවත් පුතේ
රෑට නිදන ඇඳේ
මගෙ තුරුලට වෙලා නිදයි
මගේ පුංචි ඇඳේ
පුතු නැති පාළුව දැනෙනව
නිදන විටත් ඇඳේ
සිහිනෙන් හැමදාම පුතේ
එනු තුරුලට ඇඳේ

කැවද? බිව්වද? අම්මේ ඔබ හැම
සුවදුක් විමසා බැලූ පුතේ
දිනකට දෙවරක් දුරු රට හිටියත්
විස්තර විමසූ පුංචි පුතේ
ගමනේදි බිමනේදි ප්‍රවේශමෙන් යැයි
ඔවදන් දුන් රත්තරං පුතේ
මගේ කරේ ඔබ අවසන් නින්දට
ගියේ ඇයිද රත්තරං පුතේ

නොසිතුව විදහට කරදරයක් මට
සිදුවුවොතින් මහ යුද පිටියේ
දෙමව්පියන් රැකගන්නට කියා ඔබ
උපදෙස් දුන්නලු පෙර දිනයේ
මිතුරන් අමතා දුරකථනෙන් ඔබ
පොලිතින් තහනම් කර දැමුයේ
ගොක්කොල සැරසිලි පමණක් ඉල්ලුවෙ
පෙනෙන දුරින් මරුවද සිටියේ

මතු පරපුර වෙනුවෙන් පුතු
යුද පිටියෙදි බිලිවුනේ
ඉතිහාසයෙ ඔබේ නමත්
ලියවෙනවා මට දැනේ
සසර වසන තුරු සිරිලක
බේරාගත යුතු මැනේ
නිවන් දකින් පුතුනේ ඔබ
මෙතේ බුදුන් දකිමිනේ

පී.එස්. පෙරේරා (6 ශ්‍රීලපාභ මියගිය සෙ/3129428 කෝප්‍රල් දිනේෂ් ප්‍රියංකර පෙරේරා ජී ගේ පියා)

## வயதான கடிதம்.....

அனுப்புநர்:
ஒரு பெற்றோர்
பெறுநர்:
இன்னொரு பெற்றோர்
பொருள்:
உளறல்

அன்புள்ள மகனே!
நலமா?__________.
அன்று உன் விரல்பிடித்து
நடக்கச் செய்த
அதே ஸ்பரிசத்தோடே.....
இன்று பேனாப் பிடித்து
எழுதுகிறேன்..

இந்த கடிதத்தை
உன் மகனுக்குத் தெரியாமல் படி..
நீயும் பிற்காலத்தில்
இப்படி எழுதாமலிருக்க...

உன்னை சபிப்பதோ..
என் துயரங்களை சொல்வதோ..
இந்த கடிதத்தின் நோக்கமல்ல..
உன் தாய் என்று கூட
பாரபட்சம் பார்க்காமல்
என் கடைசி ஆசையை
தெரிவிப்பதே...

நான் இறந்தபிறகு கொல்லியை
தலையில்வைக்காதே...
வயிற்றில் வை...

என் உடலிலே
முதலிலே எரியப்போகும் உறுப்பு...
உன்னை சுமந்த கருப்பையாகத் தான்
இருக்க வேண்டும்....


நீ பால்வார்க்க
கொடுத்து வைக்காத வயிறு...
அஸ்தியாவது கொடுக்கட்டும்...

இந்த கடிதம் எழுதுகிறபோது
கையில் தீக்காயம் ஏற்பட்டுவிட்டது...
ஒன்றுமில்லை...
கடந்த ஐந்தாண்டுகளாய் கொதித்த
கண்ணீர்துளி ஒன்று
கை மீது சிந்திவிட்டது...
அதுவே காரணம்...

மகனே.. பெத்தமனம் பித்து
என்பதற்கு சான்றாய்...
என் கடைசி வரி...

உன் வீட்டு உணவு தான்
எனக்கில்லை என்றாகிவிட்டது...
ஒருவேளை நீ இந்த கடிதத்திற்கு
பதில் போட்டால்...
தபால் தலையை எச்சிலால் அல்ல...
ஒரே.....ஒரு... சோற்றுப் பருக்கையால்
ஒட்டி அனுப்பு....

இப்படிக்கு....
ஒரு வயதான குழந்தை..



අප මව්බිමට සේවය කරන ආයතන ගත්කල ශ්‍රී ලංකා යුධ හමුදාව සියල්ලන්ගේම ගෞරවයට ලක්වී ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදාවේ වීරෝදාර රණවිරුවන් රට දැය වෙනුවෙන් රුදුරු සතුරන් සමග දිවා රෑ නොතකා සටන් වදිද්දී ඔවුන්ගේ බිරියන් ද තම සැමියාට දිරිය දෙමින් සැමියා සේවය කරන රෙජිමේන්තුවට හා එය තුලින් රටට සේවය කිරීමට ඉදිරිපත් වු බව අපි සතුටින් දනිමු.

# නව ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ ප්‍රථම සභාවාරය



එසේ සේවය කිරීමට ඉදිරිපත් වු රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ බිරින්දෑවරුන් එකට එක්ව එක පොකුරක්ව කටයුතු කරමුයි යන අරමුණ පෙරදැරි කොට 1999 මාර්තු මස 03 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව පිහිටු වන ලදී. එතැන් සිට මේ දක්වා යුද්ධයේදී මියගිය/අතුරුදහන් රණවිරුවන්ගේ යැපෙන්නන්ගේ  සුබසාධනය හා ආබාධිත රණවිරුවන්ගේ සුබසාධන කටයුතු වෘත්තිය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සේවයේ යෙදී සිටින රෙජිමේන්තුවට අයත් සියල්ලන්ගේ සුබසාධන කටයුතු සොයා බලා ඉටු කිරීම සේවාවනිතා ශාඛාවේ මූලික අධිෂ්ඨානය වේ.

ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ පස්වන සභාපතිනිය වශයෙන් පත්වූ ගරු දමයන්ති රත්නායක මැතිනියගේ මූලිකත්වයෙන් ප්‍රථම මහා සභා රැස්වීම ශ්‍රීලපාහ නිලධාරි නිවස්නයේ දී 2009/08/05 වන දින පැවැත්වූ අතර ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ සියළු සාමාජිකාවන් එම අවස්ථාවට පැමිණියහ. එතුමිය ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාව ආරම්භ කළ දින සිටම සේවාවනිතා ශාඛාව මගින් සිදුකරන ලද සැම කටයුත්තක් සඳහාම තම නොමසුරු දායකත්වය ලබාදී ඇත. එය රෙජිමේන්තුවට හා ආබාධිත/මියගිය/අතුරුදහන් රණවිරුවන්ට හා ඔවුන්ගේ ළඟම ඥාතින්ට හැකි උපරිම අයුරින් සේවය කිරීම එතුමියගේ පරම අභිලාශය වනු ඇත.

රෙම ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාව

# ආබාධිත රණවිරුවන් වෙනුවෙන් රෝද පුටු හා සනීපාරක්ෂක කට්ටල පරිත්‍යාග කිරීම

පුරා දශක තුනකට ආසන්න කාලයක් අප මාතෘභූමිය වෙත එල්ල වු ත්‍රස්තවාදී ප්‍රහාරයන් වලින් අප රටේ ජීවත්වූ සමහර ජන කොටස්වලට ජීවිත පමණක් නොව වතු පිටි ගේ දොර යාන වාහන ඇතුළු තවත් විවිධ දේ අහිමි විය. එම අහිංසක ජනතාවට සාමයෙන් පිරි අලුත් හෙටක් පරිසරයක් නිර්මාණය කිරීමට තම ජීවිත කැප කරමින් විශාල මෙහෙවරක් කල යුධ හමුදාවේ සියලුම රෙජිමේන්තු වල සැලකිය යුතු පිරිසක් තම මව්බිම වෙනුවෙන් ජීවිත කැප කළ අතර පිරිසක් අතුරුදහන්ව තවත් පිරිසක් ආබාධිත විය. එම රණවිරුවන් හට හැමදාමත් දිරිය ශක්තිය දෙමින් ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් කැපවෙමින් විශාල සේවයක් කරන ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව මෙවරද ආබාධිත රණවිරුවන් වෙනුවෙන් සුවිශේෂි වු පරිත්‍යාග රැසක් සිදු කළහ. ඒ තම මව් බිමට හිතැති තවත් දානපතියන්ගේද ආධාර උපකාර ඇතිවය.

මෙම පරිත්‍යාග උත්සවය 2009.08.08 දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවති අතර, මෙහිදී ආබාධිත රණවිරුවන් වෙනුවෙන් රෝද පුටු අත්වාරු යුවල්, කෘත්‍රිම පාද, කොමඩ් කට්ටල, වැනි දේ පරිත්‍යාග කළ අතර මෙම පරිත්‍යාග සදහා අනුග්‍රහකත්වය ලබා දුන්නේ ජන විජය පදනම හා ඉතාලියේ පදිංචි ශ්‍රීලාංකික පුරවැසියන් පිරිසකි.

මෙදින උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය ද සහභාගි වු අතර රෙම ශ්‍රීලපාහ සේනාවිධායක තුමා හා රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි තුමා ඇතුළු ශ්‍රීලපාහ නිලධාරින් ද ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ සාමාජිකාවන්ද සහභාගි වුහ.





## තම පුතු සිහිකරමින් ප්‍රවීණ ගායන ශිල්පිණී සුජාතා අත්තනායක මහත්මිය විසින් ආබාධිත රණවිරුවන් හට කළ පරිත්‍යාග








# ආබාධිත රණවිරුවන් හට කෘත්‍රිම පාද පරිත්‍යාග කිරීම

වන්නි ප්‍රදේශයේ සිදු කරන ලද මෙහෙයුම් වලට සහභාගි වී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්වූ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණවිරුවන් 06 දෙනෙකු සඳහා බ්‍රිතාන්‍යයේ පදිංචි වෛද්‍ය බෝපිටිය මහතා ඇතුලු පවුලේ සාමාජිකයින් විසින් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා කෘත්‍රිම පාද 6ක් 2009.08.07 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පරිත්‍යාග කරන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි වන ලුතිනන් කර්නල් අයිපීආර්පී බෝගොඩවත්ත ශ්‍රීලපාහ සහභාගි වූ අතර, වෛද්‍ය බෝපිටිය මහතා විසින් කෝප්‍රල් විජේරත්න කේඩීබීබී හටද නන්දන මහතා විසින් සාසෙ වීරසිංහ ඩබ්එස්එම්එම් යන අය හටද කෘත්‍රිම පාදයක් පරිත්‍යාග කළ අතර,

උතුරු නැගෙනහිර ප්‍රදේශයන් හි රුදුරු ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන්වැදි එම ප්‍රහාරයන් හේතුවෙන් දකුණු පාදය දණහිසට පහලින් කපා ඉවත්කර ඇති 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සාසෙ චන්ද්‍රරත්න අයිපීසී යන සෙනියා හට යුධ හමුදා විශ්‍රාමික ජ්‍යේෂ්ඨ නිලධාරි මේජර් ජෙනරාල් සීජේ රණවීර ආර්එස්පී ගේ ඥාතියකු විසින් 2009.08.15 වන දින කෘත්‍රිම පාදයක් පරිත්‍යාග කරන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ මේජර් එස්ඒඑන් සමරනායක ශ්‍රීලපාහ සහභාගි විය.

රෙජිමූබ ශ්‍රීලපාහ



# අනිවාර්ය හමුදා සේවය ඇති-නැති රටවල්

ශ්‍රී ලංකා හමුදාවේ අප සියලු දෙනා හමුදාවට බැදුනේ කැමැත්තෙනි. අප කිසිවෙකු බලෙන් හමුදාවට බදවාගනු නොලැබිණි. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කොට අයදුම්පත් ඉදිරිපත් කොට ශාරීරික යෝග්‍යතාවය, මානසික යෝග්‍යතාවයද ඇතුළුව තව තවත් පරීක්ෂණයන්ගෙන් සමත්ව මූලික යුධ පුහුණුව ලබා අපි මෙම අභිමානවත් වෘත්තියට පිවිසුනෙමු. ශ්‍රී ලංකාවේ එසේ වුවද සෑම රටක්ම අප රට වගේ නොවන බව අපි දනිමු. ශ්‍රී ලංකාවේ තරුණයන්ට අනිවාර්ය හමුදා සේවයක් නොමැති වුවත් ලෝකයේ හමුදාවන් ක්‍රියාත්මක වන බොහෝ රටවල් අතුරින් ඇතැම් රටවල වර්තමානයේද හමුදා සේවය අනිවාර්ය වේ (Mandatory Military Service)' වෙනත් වචන වලින් කියන්නේ නම් එම රටවල තරුණයන් කැමැති වුවත් අකමැති වුවත් හමුදාවට බැදිය යුතුය. අකමැති වුවහොත් බලෙන් හමුදාවට බඳවා ගනු ලැබේ (Conscription). විශේෂයෙන් පළමුවන හා දෙවන ලෝක යුද්ධ සමයන්හිදී මෙම තත්ත්වය සුලභව දක්නට ලැබිණි.

ලෝකයේ ඇතැම් රටවල් එතෙක් පැවති අනිවාර්ය හමුදා සේවය පිළිබද නීතිය අවලංගු කොට තිබේ. එසේම තවත් රටවල් සීමා සහිතව එය සිදු කරනු ලැබේ. තවත් රටවල් අවශ්‍යතාවය මත සුදුසු කාල වකවානු වලදී එය සිදු කරනු ලැබේ. එදා මෙන්ම අදත් අනිවාර්ය හමුදා සේවය පවතින රටවල රජය විසින් නියම කරනු ලබන සුදුසුකම් සපුරා සිටි තරුණයන් හමුදාවට බැදීම ප්‍රතික්ෂේප කලහොත් හෝ මග හැර සිටිය දී හසු වුවහොත් දැඩි දඩුවම් විදීමට සිදුවේ.

පෝලන්තය මෙම අනිවාර්ය හමුදා සේවය පිළිබද නීතිය මෑතකදී එනම් 2008 දෙසැම්බර් මස 05 වන දින අවලංගු කළේය. ඇල්බේනියාව, සර්බියාව සහ යුක්රේනය වැනි රටවල් නුදුරේදීම එනම් 2010 වසර අවසාන වීමට ප්‍රථම අවලංගු කිරීමට කටයුතු යොදා තිබේ. ඉන් අදහස් කරන්නේ පසුව එම රටවල හමුදාවට බඳවා ගන්නේ සුදුසු නම් කැමති නම් පමණි. බෙලිස්, බොලිවියාව, ජැමෙයිකාව සහ උරුගුවේ වැනි රටවල් අනිවාර්ය හමුදා සේවය නියම කරන්නේ ඉදහිටය. එනම් තම රට යම් අර්බුදකාරී අවස්ථාවකට මුහුණ පෑවොත් ඒ සඳහා තිබෙන හමුදාව ප්‍රමාණවත් නොමැති නම්ය. එවැනි අවස්ථාවකදී වුවත් ජැමෙයිකාව වැනි රටවල් නව යෞවනයන් හමුදාවට බඳවා ගන්නේ දෙමාපිය කැමැත්ත මත බව එරට නීති පොත් වල සඳහන් වේ.

අනිවාර්ය හමුදා සේවය යන මාතෘකාව ගැන කතා කිරීමේදී තවත් විශේෂ යමක් මෙහිදී සඳහන් කළ යුතුය. එනම් අනිවාර්ය හමුදා සේවා කාලය ඉතාම දීර්ඝ කාලයක් පුරාවට නොපවතින බවයි. පහත දැක්වෙන රටවල වර්තමානයේ අනිවාර්ය හමුදා සේවා කාලය වසරක් හෝ ඊට අඩුය. අන්තර්ජාලයේ එවැනි රටවල් 22ක් දක්වා තිබේ.

| | |
|---|---|
| බොලිවියාව | |
| බ්‍රසීලය | (මාස 9ක් 12ත් අතර) |
| ඩෙන්මාර්ක් | (මාස 4ක් 12ත් අතර) |
| ඉක්වදෝරය | (රටේ අවශ්‍යතාවය මත වසරක් හෝ අඩුවෙන්) |
| එල් සැල්වදෝරය | (රටේ අවශ්‍යතාවය මත වසරක් හෝ අඩුවෙන්) |
| එස්ටෝනියාව | (මාස 8ත් 11ත් අතර) |
| ෆින්ලන්තය | (මාස 6ත් 12ත් අතර) |
| ජර්මනිය | (මාස 9) |
| ග්‍රීසිය | |
| ගෝතමාලා | (සාමාන්‍යයෙන් වසරක් වුව දෙවසරක් විය හැකි අවස්ථා තිබේ) |
| මෙක්සිකෝ | (රටේ අවශ්‍යතාවය මත වසරක් හෝ අඩුවෙනි) |
| මෝල්ඩෝවියා | |
| මොංගෝලියාව | |
| නෝර්වේ | |
| පැරගුවේ | (යුධ හමුදාවේ වසරකි. නාවික හමුදාවේ නම් දෙවසරකි) |
| සර්බියාව | (මාස 6කි) |
| ස්විට්සර්ලන්තය | |
| තායිවානය | (රටේ අවශ්‍යතාවය මත වසරක් හෝ අඩුවෙන්) |
| ටියුනීසියාව | |
| තුර්කිය | |
| යුක්රේනය | |
| උස්බෙකිස්ථානය | |

පහත දැක්වෙන රටවල තිබෙන අනිවාර්ය හමුදා සේවය මාස 18 කි. අන්තර්ජාලයේ එවැනි රටවල් 9 ක් දක්වා තිබේ.

| | |
|---|---|
| අසර්බයිජානය | |
| කොලොම්බියාව | |
| කාම්බෝජය | |
| ජෝර්ජියාව | |
| ලාඕසය | |
| මැඩගස්කරය | |
| කෝට් ඩී අයිවෝර් | |
| එරිත්‍රියාව | |
| රුසියාව | ( මාස 12 ත් 18 ත් අතර ) |

පහත දැක්වෙන රටවල තිබෙන අනිවාර්ය හමුදා සේවය නිසා හමුදාවට බඳවා ගත්තද සුදුසු පරිදි කැමති පරිදි යම් කාල සීමාවක් හමුදාගත සිවිල් පුද්ගලයන්ගේ රාජකාරි කළ හැකිය. එසේම යම් කාල සීමාවක් නිල ඇදුමෙන් අවි නොදරන හමුදා රාජකාරි කිරීමටද අවස්ථාව ඇත. එවැනි රටවල් 12ක් අන්තර්ජාලයේ දැක්වේ.

| | | |
|---|---|---|
| ඇන්ගෝලා | ඇල්ජීරියාව | ඔස්ට්‍රියාව |
| බෙලරුස් | සයිප්‍රසය | ඩෙන්මාර්ක් |
| එස්ටෝනියාව | ෆින්ලන්තය | ජර්මනිය |
| නෝර්වේ | ස්වීඩනය | සර්බියාව |

මේ දක්වා දැක්වූයේ රජය විසින් නියම කරන ලද වයස් සීමාවට අයත් ශාරීරික හෝ මානසික ආබාධ නොමැති සියලු තරුණයන් සඳහා වූ අනිවාර්ය හමුදා සේවය පිළිබඳවය. එහෙත් පහත සදහන් රටවල තත්ත්වය තරමක් වෙනස්ය. නිරෝගී තරුණයන් අතුරිනුත් විවිධ කරුණු කාරණා මත අධ්‍යාපනික වේවා ආගමික වේවා පෞද්ගලික වේවා යම් තේරීමක් සිදු කොට අනිවාර්යෙන් හමුදාවට බඳවා ගනු ලැබේ (Selective Conscription). අන්තර්ජාලයේ එවැනි රටවල් 15ක් දක්වා තිබේ.

| | |
|---|---|
| බෙනින් | මධ්‍යම අප්‍රිකාව |
| චැඩ් | චීනය |
| ගිනි බිසව් | ඉක්වදෝරය |
| එල් සැල්වදෝරය | ඉන්දුනීසියාව |
| මැලේසියාව | මෙක්සිකෝව |
| නයිජර් | සෙනෙගාලය |
| කේප් වර්ඩ් | තායිවානය |
| ටෝගෝ | |

පහත දැක්වෙන රටවල නම් අනිවාර්ය හමුදා සේවා කාලය තරමක් දීර්ඝය. මාස 18කට වඩා පවතී. එවැනි රටවල් 22 ක් අන්තර්ජාලයේ දක්වා තිබේ.

| | |
|---|---|
| ආමේනියාව | බර්කිනො ෆැසෝ |
| ප්‍රජාතන්ත්‍රවාදී කොන්ගෝව | කියුබාව |
| සමක ගිනි | ඊජිප්තුව |
| මොසැම්බික් | උතුරු කොරියාව |
| සාඕ ටොම් සහ ප්‍රින්සිපේ | සිංගප්පූරුව |
| සෝමාලියාව | දකුණු කොරියාව |
| ඊශ්‍රායලය | කසකස්ථානය |
| කිර්ගිස්ථානය | ලිබියාව |
| සිරියාව | සූඩානය |
| ටජිකිස්ථානය | තායිලන්තය |
| ටර්ක්මෙනිස්ථානය | වියට්නාමය |

පහත දැක්වෙන රටවල් ද තරමක් විශේෂයි. අප රටේ වගේම කැමති නම් සුදුසු කම් තිබේනම් අයදුම්පත් ඉදිරිපත් කොට හමුදාවට බැදිය හැකි තත්ත්වයක් තිබෙනවා මෙන්ම එම රටවල අනිවාර්ය හමුදා සේවයක්ද ක්‍රියාත්මක වේ (Both

Compulsory and Voluntary Military Service). එවැනි රටවල් 10ක් අන්තර්ජාලයේ සඳහන් වී තිබේ.

| | | |
|---|---|---|
| බර්මියුඩාව | බුරුන්ඩි | ගැබොන් |
| කුවේට් | මාලි | මොරිටානියාව |
| පිලිපීනය | සිංගප්පූරුව | උගන්ඩාව |
| වෙනසියුලාව | | |

පහත දැක්වෙන රටවල වර්තමානයේ අනිවාර්ය හමුදා සේවයක් ක්‍රියාත්මක නොවේ. එහෙත් මෙහි ඇතැම් රටවල අතීතයේදී එවැන්නක් ඇතැම්විට ක්‍රියාත්මක වන්නට ඇත. නමුත් වර්තමානයේ නැත (No enforced conscription). අන්තර්ජාලයේ දැක්වෙන එම රටවල් 88 අතර ශ්‍රී ලංකාවද වේ. ශ්‍රී ලංකාවේ නම් වර්තමානයේ පමණක් නොව මෑත අතීතයේදී ද අනිවාර්ය හමුදා සේවයක් ක්‍රියාත්මක නොවීනි.

| | |
|---|---|
| ඇෆ්ගනිස්තානය | ඇන්ටිගුවා සහ බාබුඩා |
| ආජෙන්ටිනාව | ඔස්ට්‍රේලියාව |
| බහමාස් | බහරේන් |
| බංගලාදේශය | බාබඩෝස් |
| බෙල්ජියම | භූතානය |
| බොස්නියා සහ හර්සගොවිනා | බොට්ස්වානා |
| බෲනායි | බල්ගේරියාව |
| බුරුමය (මියන්මාරය) | කැමරූන් |
| කැනඩාව | චිලී |
| කොංගෝ | ක්‍රොයේෂියාව |
| චෙක් | ජිබුටි |
| ඩොමිනිකන් | ඉතියෝපියාව |
| ෆීජි | ප්‍රංශය |
| ගැම්බියාව | ඝානා |
| පැපුවා නිව්ගිනි | හයිටි |
| හොන්ඩුරාස් | හංගේරියාව |
| ඉන්දියාව | ඉරාකය |
| අයර්ලන්තය | ඉතාලිය |
| ජපානය | ජෝර්දානය |
| කෙන්යාව | ලෙබනනය |
| ලෙසතෝ | ලිතුවේනියාව |
| ලැට්වියාව | ලයිබීරියාව |
| ලක්සම්බර්ග් | මැසිඩෝනියාව |
| මලාවි | මාලදිවයින |
| මෝල්ටාව | මොරොක්කෝව |
| මොන්ටෙනිග්‍රෝ | නැමීබියාව |
| නේපාලය | නෙදර්ලන්තය |
| නෙදර්ලන්ත ඇන්ටිලෙස් | නවසීලන්තය |
| නිකරගුවාව | නයිජීරියාව |
| ඕමානය | පකිස්තානය |
| පේරු | පෝලන්තය |
| පෘතුගාලය | ප්‍රංශය |
| කොස්ටාරිකා | කටාර් |
| රුමේනියාව | රුවන්ඩාව |
| සාන්ත කිට්ස් සහ නෙවිස් | සෞදි අරාබිය |
| සීෂෙල්ස් | සියරාලියොන් |
| ස්ලෝවැකියාව | ස්ලෝවේනියාව |
| දකුණු අප්‍රිකාව | ස්පාඤ්ඤය |
| ශ්‍රී ලංකාව | සුරිනාම් |
| ස්වාසිලන්තය | ටැන්සානියාව |
| ටිමෝරය - ලෙස්ටේ | ටොංගා |
| ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ | එක්සත් අරාබි එමීරය |
| එක්සත් රාජධානිය | ඇමරිකා එක්සත් ජනපදය |
| යේමනය | සැම්බියාව |

අප මෙතෙක් කෙටියෙන් කතා කළේ ලෝකයේ රටවල වර්තමානයේ අනිවාර්ය හමුදා සේවය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවයි. මෙම ලිපිය ආරම්භයේදීම සඳහන් කළ පරිදි එතෙක් පැවති අනිවාර්ය හමුදා සේවය පිළිබඳ නීතිය මෑතකදීම අවලංගු කළ රට වන්නේ පෝලන්තයයි. ඊට පෙරද බොහෝ රටවල් එතෙක් පැවති මෙම නීතිය අවලංගු කර ඇත. පළමුවන හා දෙවන ලෝක යුධ සමයන්හිදී තදින්ම ක්‍රියාත්මක වූ අනිවාර්ය හමුදා සේවය පිළිබඳ නීතිය එක්සත් රාජධානිය විසින් අවලංගු කරන ලද්දේ 1963 දීය. කැනඩාව ද දෙවන ලෝක යුද්ධයෙන් පසුව අවලංගු කළේය.

කොස්ටාරිකාව මෙම නීතිය අවලංගු කළේ 1948 දිය ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය 1972 දී අවලංගු කළ අතර ඇමරිකා එක්සත් ජනපදය එය අවලංගු කළේ 1973 දීය. හමුදාවට බලෙන් බඳවා ගැනීම ආජෙන්ටිනාව 1994 සිට ක්‍රියාත්මක වීම නවත්වා තිබෙතත් එරට නීති පොත් වලින් එම නීතිය තවම මකා දමා නැත. බෙල්ජියමද එම නීතිය 1994 දී අවලංගු කළේය. වර්ණ භේදවාදය යටතේ දකුණු අප්‍රිකාවේ සුදු ජාතිකයින්ට පමණක් පැවති දෙවසරක අනිවාර්ය හමුදා සේවය 1994 දී අවලංගු කරනු ලැබිණි.

හමුදාවට බලෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් මෑත කාලයේ ලෝකය පුරාද මහත් ආන්දෝලනයක් ඇති කළ රටකි ඉරාකය. ජනාධිපති සදාම් හුසේන් මහතා සමයේ පළමු පර්සියානු ගල්ෆ් යුද්ධයේදී එනම් කාන්තාරයේ කුණාටුව යන යුද ක්‍රියාන්විතය (Operation Desert Storm) සඳහා බලෙන් හමුදාවට බඳවා ගනු ලැබූවන් 100,000 ක් පමණ මියගිය බව වාර්තා විය. පසුව යළි ඇතිවූ දෙවන පර්සියානු ගල්ෆ් යුද්ධයෙන් පසුව බලෙන් හමුදාවට බඳවා ගැනීම අහෝසි විය.

නෙදර්ලන්තය බලෙන් හමුදාවට බඳවා ගැනීම 1996 දී නවතා දැමුවත් තවම එරට පොත්පත් වලින් එම නීතිය මකා දමා නොමැත. ප්‍රංශය ද 1996 දී එම නීතිය අවලංගු කළ අතර, පේරු රාජ්‍යය එය අවලංගු කළේ 1999 දීය. ස්පාඤ්ඤය 2001 දීය. ස්ලෝවේනියාව 2003 දී එය අවලංගු කළ අතර, චෙක් රාජ්‍යය සහ හංගේරියාව එය අවලංගු කොට ඇත්තේ 2004 දීය. ඉතාලිය ද 2004 දී අනිවාර්ය හමුදා සේවය පිළිබඳ නීතිය අහෝසි කළ අතර, එය ක්‍රියාත්මක වීම ඇරඹුනේ 2005 ජනවාරි 1 වන දිනය. රුමේනියාව, ස්ලෝවැකියාව, මැසිඩෝනියාව, මොන්ටෙනිග්‍රෝ බොස්නියා සහ හර්සගොවිනා හා මොරොක්කෝව යන රටවල් එම නීතිය 2006 දී අවලංගු කළ අතර 2007 දී බල්ගේරියාව, ක්‍රොයේෂියාව, ලැට්වියාව සහ ලෙබනනය එය අවලංගු කළහ.

අනිවාර්ය හමුදා සේවය නොහොත් බලෙන් හමුදාවට බඳවා ගැනීම ගැන කතා කිරීමේදී කාන්තාවන් ගැනද වචනයක් දෙකක් සඳහන් කළ යුතුය. අපි හොඳින්ම දන්නා පරිදි ශ්‍රී ලංකාවේ තරුණයන් සඳහා මෙන්ම තරුණියන් සඳහා ද අනිවාර්ය හමුදා සේවය පිළිබඳ නීතියක් නැත. එනම් අප රටේ නිලධාරිණියන් සහ සෙබළියන් හමුදාවට බැඳුනේ ස්වකැමැත්තෙනි. නමුත් එක්සත් රාජධානියට දෙවන ලෝක යුද්ධ සමයේදී ඇතිවූ භට පිරිස් හිඟය නිසා කාන්තාවන්ටද හමුදා සේවය අනිවාර්ය විය. එහෙත් එලෙස බඳවා ගත් කාන්තාවන් ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන දියුණු කිරීම සඳහා යොදවනු ලැබූ බව සඳහන් වේ.

1949 දී මහජන චීන සමූහාණ්ඩුව පිහිටුවූ දින සිට මේ දක්වාම පවතින නීතියට අනුව හදිසියේවත් තම රට යම් කිසි ආක්‍රමණකාරී හෝ අර්බුධකාරී අවස්ථාවකට පත් වුවහොත් සියලු චීන පුරවැසි පිරිමින් සඳහා පමණක් නොව කාන්තාවන්ටද හමුදා සේවය අනිවාර්ය වනු ඇත. චීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන වගන්තියේ එය මෙසේ සඳහන් කර තිබේ . It is a sacred duty of every citizen of People's Republic of China to defend his or her motherland and resist invasion. It is an honored obligation of the citizen of the People's Republic of China to perform military service and to join the militia forces .

ඊශ්‍රායලයේ ද වයස අවුරුදු 18ට වැඩි නිරෝගී තරුණියන් සඳහා හමුදා සේවය අනිවාර්ය කොට තිබේ. එහෙත් එම තරුණියන් විවාහක නම් හෝ ගර්භනී තත්ත්වයේ පසුවෙත් නම් හමුදාවට බඳවා ගනු නොලැබේ. එමෙන්ම රජය අනුමත කරන යම් යම් ආගමික හේතූන් හෝ අධ්‍යාපනික හේතූන් ඉදිරිපත් කිරීමෙන් ද අනිවාර්ය හමුදා සේවයෙන් ගැලවීමට ඊශ්‍රායල් තරුණියට අවස්ථාව ලැබේ.

අප රටේ තරුණියන්ට වගේම කැමති නම් ස්වීඩනයේ තරුණියන්ට ද හමුදාවට බැඳීමට 1980 පටන් අවස්ථාව උදාවී තිබේ. එහෙත් එරට දේශපාලන අධිකාරිය කාන්තාවන් සඳහා ද අනිවාර්ය හමුදා සේවය පිළිබඳ නීතියක් ඇති කිරීමට සාකච්ඡා කොට තිබේ. මෙම තත්ත්වය වඩාත්ම ඉස්මතු වුයේ 2002 දීය. ස්වීඩන් රජය විසින් එම වසරේදී කාන්තාවන් සඳහා ද අනිවාර්ය හමුදා සේවයක් ඇති කිරීම පිළිබඳව ඇති හැකියාව සළකා බලන ලෙස එරට හමුදාවෙන් ඉල්ලා සිටින ලදී. කෙසේ හෝ එවැනි නීතියක් තවම එරට ක්‍රියාත්මක වන්නේ නැත.

(අන්තර්ජාලයේ සඳහන් වන රටවල් 195 ක් ආශ්‍රයෙන් සිදුකරන ලද සමීක්ෂණයක තොරතුරු ඇසුරෙනි.)

**මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාභ**

**කාර්ය බහුල පුද්ගලයාට කඳුළු සැලීමට වෙලාවක් නැත**

## සෙබළ මගේම අයියණ්ඩියේ

ගිනි අවිය අත දරා තල් වැට අද්දරට වී......
ඔබ ඒ ගෙවූ දරදඬු ජිවිතය..............
දැන් අවසන් වී ඇත දැන් සාමයේ
මල් පිපි හමාරය........
ඔබ එම සුන්දර වූ සාමය උදා
කරලීමට කෙතරම් දහඩිය
ලේ බිංදු බිම හෙලුවාද
ඒ හෙලූ හැම දහඩිය ලේ බිදුවකටම
අප සදා ණය ගැතිය.......
ඔබ මෙන් අනෙක් සෙබළ
සොයුරු සොයුරියන් මේ ලක් දෙරණ
බේරා ගැනීමට කළ.... උත්සාහය............
අප කිසිදා අමතක නොකරමු.......
ඔබට සදා ජය පතමි..........

සැරයන් ධර්මසිරි ආර්ජ්වීසී ගේ
නැඟණිය චතුරි දේවිකා

## ජයග්‍රහණයේ නිම්වළලු....

ඔබේ නෙත් මානයේ
මහා විශ්වය පෙනේ
ජය ගන්න හැකිවේද
නුඹේ ඔය අත්වලට
දිළිඳු ඔය අත් වලට
දිළිඳු කටු මැටි පැලෙන්
සිර කරන
සිතුම් විහඟුන්ට
හැකිවේද පැනයන්න ඉන්
දිරිය අත්තටු මවා
කැදැල්ලෙන් ඉගිලිලා
විශ්වයම ජයගන්න
වැට කඩුලු බිඳ දමා

සාසෙ සුදත් බංඩාර ඩබ්ජ්පී
'ඊ' ආරක්‍ෂක කණ්ඩායම

## බොඳව ගිය මතක සිත තවම සක්මනේ


බොඳවුණු දෑසින් එපා
බලන්නට සමුගෙන යන්නට
මොහොත ලගයි මා ලය
තෙරපෙන දුකම හඬන්නට
එපා යලිත් මගේ සිත පෑරෙයි
සිල්වර කොටමත පරව ගියාවේ
අපේ කඳුළු මේ ලොවට බරයි
සැමරුම් හසුනකත් පෙරලා දුන්නත්
හඳවත සෙනෙහෙන් මිදේවිදෝ
අද හිනැහී කල්පයක් හඬන්නට
ඔය නෙතු රිදවනු නොහැකි
බැවින් සමුගෙන යන්නට පවිකල
අපගැන ඉකි නොබිඳනු මැන
සිහින් සරින්.............

11 ශ්‍රීලපාහ
කෝප්‍රල් රත්නායක
ආර්එම්ආර්පී ගේ
නැඟණිය ආර්.ඩබ්.එස්. සංජිවනි

## දසුනේ හසුන

අප අවි අත දරා සිටියත් දමිළ පුතේ
නුඹ වගෙ පුතුන් අප දෙදෙනා හටත් ඇතේ
නුඹගේ මවගෙ දෙතනේ කිරි නැතත් පුතේ
මාගේ අතින් දුන් පිටි කිරි රසද පුතේ!

අම්මා අප්ප දෙන්නම මේ රුදුරු කැලේ
කොටියා කියන විදියට අපි ගමන් කළේ
මාමා දුන්නු කිරි බිඳුවේ තිබුනු බලේ
නිවුනා පිපාසය දැන් මගෙ පුංචි තොලේ



දසුන :
යුධ හමුදා මාධ්‍ය ඒකකයේ අනුග්‍රහයෙනි.
හසුන :
ච/සැරයන් පුණ්‍යපාල ඩබ්පී
16 (සෙව්) ශ්‍රීලපාහ

# කිඹුලිගේ පැටියා!

මාතර ගඟේ සිටිනා කිඹුලිගෙ පැටියා
තල්ල සුදුයි බෙල්ලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතාගෙන හිටියා
මිනී නොකයි මාතර කිඹුලිගෙ පැටියා

කවිය කී විට එක එල්ලේම හිතට එන්නේ මිනී කන කිඹුල්ලුයි, මාතර ගඟයි, කිඹුල් බිය නිසා නවතා ඇති පාරු ආදියයි. නමුත් කතන්දරේ ඊට වැඩිය හාත්පසින්ම වෙනස් එකක්. අදත් මහපාරේ දුවන බඩු ලොරි නවත්වන රෑ කඩයක් වගේ එකක් මාතර ගඟේ පාරුකාරයින්ගේ කෑම බීම සඳහා එක් තොටුපලක තිබුණාලු. මස්, මාළු, පොල්සම්බෝල, අච්චාරු ආදිය සහිත බත් වේලක් නැත්තම් ලුණු මිරිස් ආප්ප ආදිය හෝ හකුරු කැටයක් සමඟ කහට කෝප්පයක් බොන්නට පුළුවන් මේ රෑ කඩේ ඉතාම ජනප්‍රිය එකක් උනාට කඩේ පාලනය කරපු කළු තරබාරු කට සැර අම්මන්ඩිගෙන් මිල මුදල් හෝ අය කරන ගාස්තුව ගැන කිසිම සහනයක් කවදාවත් තිබුනේ නැත. පාරු කාරයින් ඇ දුටුවේ " මිනී කන කිඹුලියක " මෙනි. මහ අම්මන්ඩිගේ අභාවයෙන් පසු කඩේ කටයුතු කළේ ඇගේ සුරූපි දියණියයි. ඇගේ රූපාලංකාරය වැනූ රසිකයන් " මාතර ගඟේ සිටිනා කිඹුලිගේ පැටියා - තල්ල සුදුයි බෙල්ලේ ගෝමර කැටියා " යැයි කීවේ ඒ නිසාය. මිනී කන කිඹුලි හිටි කාලෙත්, කිඹුලිගේ පැටියා හිටි කාලෙත් , රෑ කඩේ ජනප්‍රිය වූ බව කියවෙන්නේ " යන එන පාරු නවතාගෙන හිටියා " යන පදයෙනි. " මිනී නොකයි මාතර කිඹුලිගේ පැටියා " කීවේ දුව අම්මාට වඩා හිත හොඳ අම්මන්ඩියෙක් වූ නිසාය.

(පොත පත ඇසුරෙනි.)

# ආදර හිච්චි නෝනට

මා තනිවෙලා බංකරයේ සිටින විට
සිහි වුනි මා පුතුද දියණිය බිරිය මට
ඔබලා සැපෙන් සන්තෝසෙන් සිටින විට
නොදැනුනි දුකක් කරදරයක් මගෙ සිතට

යාළුවො එක්ක සන්තෝසෙන් මම ඉන්නේ
එනමුත් නිතර ඔබලා මට සිහි වෙන්නේ
ලැබුනොත් නිවාඩුව ඉක්මනටම එන්නේ
ඔබලා දකින්නටයි මගෙ සිත ඉල්ලන්නේ

දියණිය නිතර මාහට අඬ ගසනවද
සුදු පුතු හැමදිනක පාසැල් යවනවද
මා නැති අඩුව දැනිලා දුක දැනෙනවද
නොසලා කඳුළු මා එනතුරු ඉන්නවද

සාසෙ පියසෝම යුඑල්පී
'ඩී' කණ්ඩායම, 4 ශ්‍රීලපාහ

# මානුෂිය මෙහෙයුමේ අමතක නොවේය වාහනේ

අපියි නැවීලා
යුද්දෙට උදව් කරලා
දැන්නම් හම ගිහිල්ලා
ඇයි පැත්තකට දමලා

උඩින් ගියෙ අපිනේ
ලෙඩ්ඩු ඇද්දෙත් අපිනේ
අපෙ අයියා කපිර්නේ
මල්ලිගේ නම කෝබ්‍රොනේ

මගේ නම යුනිකෝන්
ඇද්දේ උඩට කොල්ලන්
නිවාඩු ඔපරේෂන්
රියදුරු අමරකෝන්

අපි තමයි බපල්
ඒ උනාට නැහැනෙ කවල්
කඳු පල්ලම් කැලෑවල්
අපට හුරුයි සදාකල්

ආර්මඩ් කාර් එක
දුන්නේ අපි පයර් එක
හැම වැඩට පස්ට් එක
ඇත්තමයි ඇත්ත ඒ ටික

ඇද්දෙ ආටි ගන්ස්
අපේ නැහැ බොරු ගැස්
යුද්දෙදි නෝ චාන්ස්
මමයි අයන් හෝස්

හතලිහ පුරවලා අට්ටි
වැදුනොත් වෙනවානෙ කට්ටි
යුද්දෙදි අපි අලුත් බල්ටි
ගහල දෙන්නෙ අපියි මල්ටි

යන්නේ අපි ඉගිලිලානේ
ගන්නේ මුලු පාර අපිනෙ
දෙන්නේ සයිරන් හඬනෙ
ඇම්බියුලන්ස් මම රජුනෙ

යුද්දෙට ගියෙ නැතත්
අපට කිසි නැහැ නැකැත්
ආර්මඩ් තහඩු බස් එකත්
නැතුවම බැහැනෙ කවදත්

අපි නැතුවම බැරිය
බඩු පටවන්න හරිය
අමතක කරනු බැරිය
දුකට සැපට දෙකට ලොරිය

යුද්දෙට අපි කැපුවෙ පාර
දැන් මතකද ඔන්න පාර
මහ කැලයේ තාර පාර
ඩෝසර් කැටපිලර් පහර

කන්ටේනර් නැහැනෙ සද්දෙ
කොළඹින් පතුරොමිය ඇද්ද
ටැංකි දෙකක් පද්ද පද්ද
අපි නැහැ කිසි සද්ද බද්ද

ළමයින්ගේ වාහනේ
ට්‍රේලර් බවුසර් ඇම්නේ
වල ගොඩ කොතනත් හුරුනේ
ට්‍රැක්ටර් රථ දෙවියනේ

නමින් රයිඩර්
මෝටර් සයිකල් රයිඩර්
යුද්දෙට ඕන රයිඩර්
නැතුවම බැහැනෙ රයිඩර්

කෑම ඇද්දේ නිතරම
පදින තරමට යනව මම
කාටත් පොදු මම
පුෂ්සයිකලයයි මම

මෙකී නොකී හැම
වාහනයක් හැම
දුන්නේ යුද්දෙට පෙම
අමතක නොකරමි මම

කතා කලොත් යකඩ කඳන්
මලකඩ බිඳු ඉවත දමන්
අපටත් බැහැ නිකම් ඉඳන්
ඕනෙ පදක්කම් ඔබගෙන්

යුද්දෙට අපෙ ශ්‍රමය වගේ
වාහනයෙන් ලැබුණු අගේ
මිළ කරන්න බැහැනෙ අගේ
ඔබමය දෙවියන් වගේ

සැරයන් පුණ්‍යපාල ඩබ්පී
16 ශ්‍රීලපාහ 'ඒ' කණ්ඩායම

# ඔබ උපන්නේ මේ නැකතින් නම්

## ජ්‍යෝතිෂය යි ඔබ යි

**අස්විද** නැකතින් උපන්නේ විරූපවත් ශරීරයක් ඇති යහපත් මාර්ගයෙහි ගමන් කරන, ක්‍රියාවන්හි දක්ෂ තරබාරු ධනවන්තයෙක් වන්නේ ය.

**බෙරණ** නැකතින් උපන්නේ නිරෝගී භාවයෙන් හා සත්‍යවාදී කමෙන් යුක්ත, ස්ථිර පැවතුම් හා ප්‍රාණවත් ශරීරයක් ඇති, සැප විඳින්නාවූ බුද්ධිමතෙක් වන්නේය.

**කැති** නැකතින් උපන්නේ නිවට ගති ඇති, පාප කම් කරන, නිතර කුසගින්නේ පෙළෙන, එසේම අවැඩ කරන කෙනෙක් වන්නේය.

**රෙහෙණ** නැකතින් උපන්නේ ධනයෙන් යුක්තවන කෙළෙහි ගුණ දන්නා බුද්ධිමත් රාජ සම්මාන ලබන ප්‍රිය වචන හා සත්‍යය පවසන රූප ශොභාවෙන් යුක්තවන්නේය.

**මුවසිරිස** නැකතින් උපන්නේ චපල ගති ඇති කථාවෙහි දක්ෂ කෲර කටයුතු හා අවැඩ කරන, අහංකාර, අනුනට ද්වේශ කරන කෙනෙක් වන්නේය.

**අද** නැකතින් උපන්නේ කෙළෙහි ගුණ දන්නා අභිමාන ගති ඇති හීන වූ ශරීරාවයව යුත් පාපයෙහි ඇලුනු ප්‍රයෝග කම් කරන වස්තුවෙන් තෙරවුවෙක් වන්නේය.

**පුනාවස** නැකතින් උපන්නේ තැන්පත් ගතියෙන් යුක්ත සැප අනුභව කරන ජනයන් විසින් ප්‍රියකරනු ලබන පුත්‍ර මිත්‍රාදීන්ගෙන් සමන්විත කෙනෙක් වන්නේය.

**පුස** නැකතින් උපන්නේ දේව ධර්මයෙහි (ලැජ්ජා භය) ඇලුම් ඇති කල්පනාකාරී ජනයන් විසින් ප්‍රියකරනු ලබන ඉවසුම් ගතිය ඇති යස ඉසුරු නිසා සැපවත් ජිවිතයක් ගත කරන කෙනෙක් වන්නේය.

**අස්ලිය** නැකතින් උපන්නේ වැඩිපුර අනුභව කරන කෙළෙහිගුණ නොදන්නා වංචාකාරී දුෂ්ඨ අසත්පුරුෂ ක්‍රියාකරන කෙනෙක් වන්නේය. මෙම නැකතේ ප්‍රථම පාදයෙන් උපන් තැනැත්තා යහපත් ගතිගුණ ඇත්තෙක් ද, දෙවැනි පාදයෙන් ධනය විනාශ කරන්නෙක් ද, තුන්වැනි පාදයෙන් මවට පීඩා කරන්නෙක් ද, සිව්වැනි පාදයෙන් පියාට පීඩා කරන්නෙක් ද, වන්නේය.

**මා** නැකතින් උපන්නේ බොහෝ දාසයන් විසින් පිරිවරන ලද, ධනයෙන් ආඪ්‍ය සැප විඳින, පියා කෙරෙහි භක්තිය ඇති මහත් උත්සාහයෙන් රාජ සේවය කරන සේනාපතියෙක් වේ.

**පුවපල්** නැකතින් උපන්නේ විද්‍යාවන්ත ගව සම්පත්තියෙන් යුක්ත ගම්භීර ගති ඇති, ස්ත්‍රීන්ට ප්‍රිය, සැප විඳින ප්‍රසිද්ධ උගතෙක් වන්නේය.

**උත්‍රපල්** නැකතින් උපන්නේ අනුන්ට දීමට කැමති ශූර භාවයෙන් හා මෘදු කථාවෙන් යුක්ත ධනුවේදයෙහි හෙවත් විදීමෙහි දක්ෂ ජනයා විසින් ප්‍රිය කරනු ලබන ශක්ති සම්පන්න බුද්ධිමත් කෙනෙක් වන්නේය.

**හත** නැකතින් උපන්නේ අසත්‍ය වචන කියන, නපුරු ගති ඇති, සුරාපානයෙහි ආශාව දක්වන නෑදෑයන්ගෙන් ඈත්වූ අන්‍ය ස්ත්‍රීන් සේවනය කරන, සොරකම් දන්නා කෙනෙක් වේ.

**සිත** නැකතින් උපන්නේ අඹු දරුවන් ඇති, සන්තෝෂයෙන් කාලය ගත කරන ධන ධාන්‍යාදී වස්තුවෙන් සමන්විත ස්වකීය ආගම කෙරෙහි භක්තිය ඇති කෙනෙක් වේ.

**සා** නැකතින් උපන්නේ ධර්මිෂ්ඨ ගති හා අල්ප වස්තුව ඇති බැගෑපත් වූ ස්ත්‍රීන් කෙරෙහි ඇල්ම ඇති සැප විඳින ඉෂ්ට දේවතාවන් අදහන කෙනෙක් වේ.

**විසා** නැකතින් උපන්නේ ඉතා ලෝභ වූ පාප ක්‍රියාවන්හි ඇලුන නිකරුණේ කාලය ගතකරන කලහ කිරීමට සතුටු වෛශ්‍යා ස්ත්‍රීන් කෙරේ ප්‍රිය කරන කෙනෙක් වේ.

**අනුර** නැකතින් උපන්නේ පුරුෂ වීයර්යයෙන් යුක්ත පිටරට වාසය කරන නෑදෑ මිත්‍රයන්ගේ කටයුතුවලදී නිතර උත්සාහවත් වන ප්‍රීතියෙන් කාලය ගත කරන්නෙක් වේ.

**දෙට** නැකතින් උපන්නේ බොහෝ මිත්‍රයන් ඇති ප්‍රධානියෙකු වන, විද්‍යාව ඉගෙන ගන්නා විචක්ෂණ බුද්ධියෙන් යුක්ත, ධර්මයෙහි ඇලුන පහත් මිනිසුන් කෙරේ අනුකම්පාව ඇති කෙනෙක් වේ.

**මුල** නැකතින් උපන්නේ (1 2 වැනි පාදයෙන්) ධනය පරිත්‍යාග කරන්නෙක් වේ. (34 වැනි පාදයෙන්) ස්ථිර ගති ඇති සැප විඳින අභිමානයෙන් යුක්ත ධනයත් ගරු නම්බු ලබන්නෙක් වේ. (තවද 1 වැනි පාදයෙන්) පියාට අයස ද 2 වෙනි පාදයෙන් මවට අයස ද 3 වැනි පාදයෙන් වස්තු හානිය ද 4 වැනි පාදයෙන් සියලු කල්හි සැප ද ඇතිවන බවක් කියා තිබේ.

**පුවසල** නැකතින් උපන්නේ දුටු පමණින් උපකාර කරන භාග්‍යවන්ත වූ ලෝකයා පිය කරන සියලු කටයුතු වල විචක්ෂණ බුද්ධියෙන් ඇති කෙනෙක් වේ.

**උත්‍රසල** නැකතින් උපන්නේ බොහෝ මිත්‍රයන් හා මහත් ශරීරයක් ඇති ධාර්මික හික්මීමෙන් යුක්ත සැපසේ කාලය ගත කරන සූර කමින් වාදයෙහි දී ජය අත්පත් කර ගන්තා කෙනෙක් වේ.

**සුවන** නැකතින් උපන්නේ කෙළෙහි ගුණ දන්නා හික්මීමෙන් යුක්ත, අනුන්ට දෙනු කැමති, රෝග පීඩාදියෙන් මිදුනු වාසනාවන්ත බොහෝ දරුවන් ඇති කෙනෙක් වේ.

**දෙනට** නැකතින් උපන්නේ සංගීත ශාස්ත්‍රයෙහි ප්‍රිය නෑදෑ මිතුරන්ගෙන් ගරු නම්බු සැලකිලි ලබන රත්න ජාතීන්ගෙන් අලංකාර වන සියයකට නායකයෙක් වන කෙනෙක් වේ.

**සියාවස** නැකතින් උපන්නේ යටහත් පහත් කමෙන් හා ධනයෙන් යුක්ත පරදාර සේවනය කරන පිටරට යාමට කැමති කෙනෙක් වේ.

**පුවපුටුප** නැකතින් උපන්නේ බොහෝ කොට නිදාගන්නා නිකරුනේ කාලය ගත කරන, කථාවට කැමති සැපවත් දරුවන් ඇති දුකින් කාලය ගත කරන කෙනෙක් වේ.

**උත්‍රපුටුප** නැකතින් උපන්නේ හෙළලුවණි ශරීරයෙන් ඇති සියලු ධර්ම කෙරෙහි දැනීමක් ඇති සතුරන් විනාශ කරන කුෂ්ඨ රෝග වැලදෙන දාමරික ගති ඇති කෙනෙක් වේ.

**රේවතී** නැකතින් උපන්නේ පිරුණු අවයව ඇති පිරිසිදු භාවයෙන් ක්‍රියාවෙහි දක්ෂ යහපත් ගතිගුණ ඇති සූර වූ විචාර බුද්ධියෙන් යුතු ධන ධානයෙන් අලංකාර වූ කෙනෙක් වේ.

(ඕ. ඇන්ඩ්‍රියස් පෙරේරා ඩී. අයි. එම්. ඇස්. (ලංකා) විසින් සම්පාදනය කරන ලද ''ජ්‍යෝතිෂය ස්වාධ්‍යයනය හෙවත් නක්ෂත්‍ර ගුරුවරයා යන පොත ඇසුරිනි)

## ඇස් මහින්ද ස්වාමීන් වහන්සේගේ (ජාතික තොටිල්ල)

මුනි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදෙසින්නේ
මද සුළගයි මේ එන්නේ
මගේ පුතා නිදියන්නේ

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මොලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ

කරදර දහසක් හමුවී
ඉන්ටැකි නම් සිනාවෙවී
ඔහු මොලොව පහළ දෙවී
රජෙකැයි සළකනු මැනවී

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකොළොත් නුඹෙන් පුතේ
මෙලොවට කිසි ඵලක් නැතේ

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

එක් කොණකින් කොණට අතින්
පයින් යතත් තරුණ කතක්
පුළුවන් වූ කදිම රටක්
ඇද්ද පුතේ මෙලක මිසක්

බියගුළුකම නිවට කමයි
එය නැති කම පිරිමි කමයි
සිංහල සිතුවිලි මෙහෙමයි
පුත නුඹටත් එය උරුමයි

මිතුරු කමක් පෙරට එතොත්
දුවිල්ලක් එක්ක වුනත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්

ආර්එම් ජයන්ති

## මතු හැම භවයේ
## මා පිය තුම ඔබ වේවා

ඇසෙනා වෙඩි හඬ බංකරයේ
අප හැඬුවා මේ දිවා රැයේ
ඔබ අප හැරදා යන්න ගියේ
නොමැකෙයි මතකය මේ දිවියේ

මා දිවියට නව මං සාදා
ගියේ ඇයි ඔබ අප සැමහැරදා
පිය සෙනෙහස ඔබගේ සැමදා
බබළයි මතු මේ ලොව හැමදා

අප වෙනුවෙන් කඳුළැලි සැලුවේ
දිවිය ඔබේ රට වෙනුවෙන් පිදුවේ
මව්බිම ඔබ පණමෙන් රැකුවේ
මතු කවදා හෝ ඔබ හමුවේ

මරු කතරේ දිය උල්පත වේ ඔබ
වෙහෙස නිවාලන මද පවනයි ඔබ
ජීවිත කතරේ දිය දෝතයි ඔබ
මගේ ලොවේ හිරු සඳු දෙවියන් ඔබ

ජීවිතයේ හැම දුක් සංකා නැතිවේවා
මරු කතරේ ගිනියම් උණුසුම නැතිවේවා
දුක් විඳිනා හැම හට සැම සතුට
ලැබේවා
මතු හැම භවයේ මා පියතුම ඔබ වේවා

නිශාන්ත කුමාර පීජීඅයි
7 ශ්‍රීලපාහ

## සෙබළෙකුගේ සිහිනය

මා මළ දාට මගෙ කඳුළැලි හඬවාලා
සෙබළුන් ඇවිත් පෙට්ටි කර තියාගෙන
සීල් කරපු මගේ පෙට්ටිය බදාගෙන
නොහඬන් කෙල්ලේ ඔබ වෙනතක බලා ගෙන

මා මළ දාට මගේ නිවසට ඇවිත් ඔබ
අමතනවාද අයියේ ඔබ නිදිද කියා
මල් වඩමක් මගේ අසලින් තබාලා
කඳුළු සලා යයි මගේ මතකය තියාගෙන

සාසෙ අසංක කුමාර ටීඑම් 20 ශ්‍රීලපාහ

## රතු රුධිරය

ගිනියම් වූ වේලාවක
මහා හෙන හඬ මැද
උතුරෙහි බිම් කඩක
රත්වූ වැලි කැට සිසිල් කර
පතුලට කිඳා බැස
නුඹෙන් සමුගතිමි මා............

2/ලුතිතන් ජේජ් මිහිර ශාන්ත
ශ්‍රීලපාහ

# Nuptials

1. *The bride Miss. Mohini Pediculous*
   *who is now in her late fiftees,*
   *Betrothed to one Mr. Addict Voluptuous;*
   *Who is now in his early seventees.*

2. *Having finished her treatments bridal*
   *Hair, facial, manicure, pedicure etcetera,*
   *She emerges from her closed homely I.C.U;*
   *Where she happened to undergo these cares.*

3. *Attired in her trousseau brilliant white,*
   *And a bouquet gripped in gaudy hands,*
   *She walks in a stiff pompous gait;*
   *With an elaborate sway of hips.*

4. *She is enormous, toothy and flashy;*
   *A thick coating of lipstick, and*
   *Smudgy mascara on her eye-lashes;*
   *Doubly enhanced her natural beauty.*

5. *Mr. Addict Voluptuous, the bride-groom,*
   *Dressed in his borrowed plumes-Western,*
   *Flauntly struts his bride neat parlour;*
   *Amidst ear-splitting blasts of crackers.*

6. *He is thin-lipped, hollow-cheeked*
   *And moustached, with bovine orbs,*
   *Beak-nosed and abnormally drooping lobes;*
   *Edentate, due to a severe blow received.*

7. *The new couple seemed picturesque-photogenic,*
   *All invitees lavishly lauded them so much,*
   *Offered many a present and keepsake;*
   *With ledious folk-songs and extempore speecnest.*

8. *While most invitees hob-nobbed and caroused,*
   *A few of them enjoyed a sapid buffet,*
   *The couple leaving to achieve conjugal bliss;*
   *Awaited conreyance, an embellished bullock cart.*

*Jayaweera D. Gunaratne.*

සැම කෙනෙකුම මරණය දක්වාම ඉගෙනුම ලබයි



3



4





# පුතණුවන්ට නිවන මව්පියන්ට සෙවණ

තිස් වසරක කුරිරු යුද්ධය නිමා කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨතම පාබල රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාව දැක්වූ දායකත්වය විශිෂ්ටය. ශ්‍රී ලංකා පාබල හමුදාවේ 4 වන බළඇණිය ද රටට උපරිම අයුරින් යුතුකම් ඉටුකළ බළඇණියකි. 2008 වර්ෂයේ දෙසැම්බර් මස 08 වන දින ඕලුමඩු ප්‍රදේශයේ වන්නි මානුෂීය මෙහෙයුමේදී දිවි පිදු 4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/320876 ලාන්ස් කෝප්‍රල් විජේසිරි එස්පී ද මව්බිම වෙනුවෙන් සිය යුතුකම උපරිම අයුරින් ඉටු කළ තවත් රණවිරුවෙකි.

ආර්ථික අපහසුතා මැද ජීවත් වූ තම දෙමාපියන් හා සොයුරු සොයුරියන් රැකබලා ගැනීමට නිරන්තරයෙන්ම මෙම රණවිරුවා ජීවත්ව සිටියදී කටයුතු කර ඇත. දඹුල්ල කණ්ඩලම අතුයාය ප්‍රදේශයේ පොල්අතු සෙවිලි කළ තම නිවසේ මෙම මියගිය රණවිරුවාගේ දේහය තබා ගැනීමට පවා ඉඩකඩ මදි විය. නිවසේ තැන්පත් කළ දේහය වර්ෂාවෙන් නොතෙමී තබාගැනීමට පවා අපහසු විය.

නව නිවසක් තනා ගැනීම සඳහා දඹුල්ල කණ්ඩලම රණවිරු සංසදයේද මැදිහත්වීම මත රණවිරු සේවා අධිකාරිය මඟින් නිවාස අධාර ලබාදීම සඳහා මෙම රණවිරුවාගේ දෙමාපියන් තෝරාගනු ලැබිණි. එම නිවාස අධාර ලබාදීමේ චාම් උත්සවය 2009 සැප්තැම්බර් මස 11 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ගරු ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. එම නිවාස ආධාර ප්‍රදානය කරනු අවස්ථාවේ දී මෙම රණවිරුවාගේ පියා රාජ්‍ය ආරක්ෂක ලේකම් තුමාගේ විශේෂ අවධානයට ලක්විය. පසුව එතුමා විසින් මෙම රණවිරුවාගේ පියාණන් වෙතින් කරුණු විමසා සටහන් කරගෙන ඒ අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය මඟින් මෙම රණවිරුවාගේ නිවස පිළිබඳව කරුණු සොයා බලා ආරක්ෂක අමාත්‍යංශයේ සේවා වනිතා ඒකකය මඟින් මෙම මියගිය රණවිරුවාගේ දෙමාපියනට නව නිවසක් ලබාදීමට නිර්දේශ කරනු ලැබිණි.

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශ සේවා වනිතා ඒකකය මෙම සත්කාර්ය ඉටු කිරීමට ඉදිරිපත් වූ අතර, එහි ගරු සභාපතිනිය වන අයෝමා රාජපක්ෂ මැතිනිය විසින් නිරන්තරයෙන් මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සොයා බලන ලදි. ජීවත්ව සිටියදී නව නිවසක් ඉදිකිරීම සඳහා අත්තිවාරම සකස් කළ ලාන්ස් කෝප්‍රල් විජේසිරි තම දෙමාපියන්ට නව නිවසක සිහිනය සැබෑ කරදෙන බවට පොරොන්දු වී තිබිණි. එම සිහිනය ජීවත්ව සිටියදී ඉටුකර දීමට එම රණවිරුවාට නොහැකි වුවද මෙම රණවිරුවා විසින් සකස් කළ අත්තිවාරම මත නව නිවස ඉදිකර දෙමින් මියගිය රණවිරුවාගේ සිහිනය සැබෑ කිරීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශීය සේවා වනිතා ඒකකය ඉටු කළ කාර්යභාර්ය ප්‍රශංසනීයයි. කෙටි කාලයක් තුළ අංග සම්පූර්ණ නව නිවසක් ඉදිකිරීමට 4වන ශ්‍රීලංකා ඉංජිනේරු සේවා බළකාය දැක්වූ දායකත්වය ද අගය කළ යුතුය.

ලාන්ස් කෝප්‍රල් විජේසි
වෙත නව නිවසේ යතුරු හ
ප්‍රධානත්වයෙන් චාම් හා අභි
රාජ්‍ය ආරක්ෂක සේවා වනිත
වේ සේවා වනිතා ඒකකයේ
අතිරේක සුබ සාධක අධ්‍යක්ෂ
වන කර්නල් වීජේ කොඩිතුව
සියලු උත්සව සංවිධාන කටයු

ආරක්ෂක අමාත්‍යංශීය
රණවිරුවන් සඳහා නිවාස ත
දෙමාපියන් හට පරිත්‍යාග ක
වාසනාව උදා වේවා යැයි,
සභාපතිනිය අයෝමා රාජප
ධෛර්යය ලැබේවායැයි. ප්‍රා

## ඡායාරූ තතු :

1. වර්ෂ 2008 දෙසැම්බ
යෙදී සිටියදි ඕලුමඩු
කෝප්‍රල් විජේසිරි එ
2. මියගිය රණවිරුවාගෙ
3. රණවිරු සේවා අධි
ආරාධිත අමුත්තා
4. 2009 දෙසැම්බර් ම
ශාලාවේදී රාජ්‍ය ආ
මුදල් ලබාදීම.
5. නව නිවසේ යතුරු
අයුරු.
6. මියගිය රණවිරුවන්
7. මෙම නව නිවස ප
අයෝමා රාජපක්ෂ ම
8. ශ්‍රීලපාහ සේවා වනි
9. සමරු ඵලකය නිරාව
සභාපතිතුමිය.
10. රණවිරු පියාණන්
11. නිවහන පමණක්
12. දෙමාපියන් නව නිව
13. ඉදිවූ නව නිවහන.



8



9







6



7

ීරි එස්ජී රණවිරුවාගේ සිහිනය සැබෑ කිරීම සංකේතවත් කරමින් ඔහුගේ දෙමාපියන්
ාරදීමේ උත්සවය 2009 නොවැම්බර් මස 03 වන දින අයෝමා රාජපක්ෂ මැතිනියගේ
මානවත් අයුරින් පැවැත්විනි. සමරු ඵලකය නිරාවරණය කිරීමද සිදුවිය. මෙම අවස්ථාවට
ා ඒකකයේ ගරු උප සභාපතිනිය වන ඉන්දු රත්නායක මැතිනියත්, ශ්‍රී ලංකා පාබල හමුදා
ගරු සභාපතිනිය වන දමයන්ති රත්නායක මැතිනිය හා එහි සාමාජිකාවනුත්, යුද හමුදා
ක මණ්ඩලයේ අධ්‍යක්ෂක තුමා සහ ශ්‍රී ලංකා පාබල හමුදා මධ්‍යස්ථානයේ සේනාවිධායක
ක්කු ආර්ඩබ්ලිව්පී ඇතුළු නිලධාරී හා සෙසුනිලයන් සමඟ ප්‍රදේශවාසිහුද සහභාගි වූහ.
තු රෙජිමුබ ශ්‍රීලපාහ මගින් සංවිධානය කරන ලදි.
සේවා වනිතා ඒකකය මගින් ක්‍රියාන්විත රාජකාරියේ හි යෙදී සිටියදි මියගිය හා ආබාධිත
ාාදීමේ නිවාස ව්‍යාපෘතියේ ඉදිරි පියවරක් ලෙස ලාන්ස් කෝප්‍රල් විජේසිරි රණවිරුවාගේ
රනු ලැබූ මේ සුන්දර නිවහන තුල රණවිරු දෙමාපියන් හට සතුටින් සාමයෙන් ජීවත්වීමට
ප්‍රාර්ථනා කරන අතර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ සේවා වනිතා ඒකකයේ ගරු
ක්ෂ මැතිනිය හට මෙම ව්‍යාපෘතිය තව දුරටත් සාර්ථකව ඉදිරියට කරගෙන යාමට ශක්තිය
ථනා කරන්නෙමු.



2

ර් මස 12 වන දින 4 ශ්‍රීලපාහ ඒකකය සමඟින් වන්නි මානුෂිය මෙහෙයුමේ
ඩු ප්‍රදේශයේදී ත්‍රස්තවාදි ප්‍රහාරයකට ලක්ව මියගිය සෙ/32086 ලාන්ස්
ස්ජී රණවිරුවා.
ග් දෙමාපියන් ජීවත් වූ නිවස.
කාරිය මගින් පවත්වනු ලැබූ නිවාස අධාර ලබාදීමේ උත්සවයේ ප්‍රධාන
ලස සහභාගි වූ රාජ්‍ය ආරක්ෂක ලේකම් තුමා පැමිණි සිටි අය අමතමින්.
මස 11 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ
රක්ෂක ලේකම් තුමා අතින් ලාකෝ විජේසිරි එස්ජී ගේ පියා හට ආධාර

භාරදීමේ උත්සවය සඳහා පැමිණි ප්‍රධාන ආරාධිතයින් කැඳවාගෙන යන

සිහිකිරීම වස් විනාඩි දෙකක නිහඩතාවය රකිමින්.
රිත්‍යාග කිරීමට ප්‍රථම චිරාගත සම්ප්‍රදානුකූල පොල්තෙල් පහන දල්වන
ැතිනිය.
තා ඒකකයේ ගරු සභාපතිනිය විසින් පොල්තෙල් පහන දල්වමින්.
වරණය කරන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ සේවා වනිතා ඒකකයේ ගරු

නව නිවසට පියමන් කිරීමට ප්‍රථම.
නාව ඇවැසි භාණ්ඩද ලබාදෙමින්.
හනේ සමරු ඵලකය අසල.



13

**කපිතාන් කේබීජේසී ජිනදාස ශ්‍රීලපාහ**
*විධායක අධිකාරි රෙජිමුබ ශ්‍රීලපාහ*



10



11



12

# ඉස්ලාම් ධර්මයේ ඉතිහාසය

ඉස්ලාම් නමැති අරාබි පදයේ තේරුම පාරිශුද්ධිය නොහොත් සත්‍යය යන වචනයයි. මෙවන් පාරිශුද්ධත්වය මගින් තමන් සම්පූර්ණයෙන්ම අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේ) වෙත කැප කිරීම අදහස් කෙරේ.

අල්ලාහ්තආලාගේ අවසන් දූතයාණන් වන මුහම්මද් නබි නායකයාණන් ක්‍රි.ව. 571 අප්‍රේල් මස 22 වෙනිදා අරාබි දේශයේ මක්කම නගරයේ කුරෙෂි වංශයේ හාෂිම් නම් පවුලක ඉපදුනහ. එතුමා ඉපදුන අවදියේ අරාබි දේශයේ පැවති දේශපාලනික ආර්ථික, ආගමික, සමාජික, සංස්කෘතික අංශයන්හි පිරිහුනු ස්වභාවය ඉතිහාසඥයන් දක්වන්නේ පිරිහුනු කාලය යනුවෙනි. ආර්ථිකත්වයෙන්ද අරාබි දේශය පසුබා සිටයේය. එදා පැවති අරාබි සමාජයේ ස්ත්‍රීන්ට අත්වූයේ පහත් තත්ත්වයක්ය. තම දරුවන් පෝෂණය කිරීමටත් අසීරු තත්ත්වයක් ඇති විය. දේපල හිමිකමක් හෝ අනෙකුත් වරප්‍රසාදයක් නිදහසක් කාන්තාවට එකල නොවිනි. ඔවුන් වහලියන් මෙන් සලකන ලදී. මේ සැම අතින්ම අරාබිවරුන්ගේ ජීවන තත්ත්වය දුර්වල වූ බැවින් අධ්‍යාපනය කෙරෙහි ද ඔවුන්ගේ අවධානය යොමු නොවීය.

අරාබි දේශය මෙවන් අඳුරු යුගයක පසුවූ අවධියක මුහම්මද් නබි නායකතුමා ඉපදුනෝය. මෙතුමා නබි නායක ඉබ්රාහිම් තුමාගේ පරම්පරාවෙන් පැවතෙන්නෙකි. තමා ඉපදීමට පෙරම පියා නැතිවූ හෙයින් අනාථයෙක් වූ මෙතුමාට වයස අවුරුදු 6දී මැතිනියන්ද අහිමි විය. ඉන්පසු සීයා වන අබ්දුල් මුත්තලිෂ්ගේ රැකවරණයෙන් වැඩුනු එතුමා සීයාගේ මරණයෙන් පසු ලොකු පියා වන අබුතාලිබ්ගේ රැකවරණය යටතේ වැඩුනි. මුහම්මද් නබි නායකතුමා කුඩා අවදියෙහි සිට යහපත් ගුණ ධර්මයෙන් ඇත්තෙක් විය. එම නිසා එතුමා හට අස්සාදික් (සත්‍යවන්තයා) සහ අල් අමීන් (විශ්වාසවන්තයා) යන විරුදාවලිය ද ලැබුනි. කුඩා අවධියෙහිම මෙතුමා එළුවන් රැක බලමින් ජීවත් වූයේය. ඉන්පසු තම පවුලේ රක්ෂාව වූ වෙළඳාමෙහි යෙදුනේය. මේ කාලයෙහි එතුමානෝ තම සමූහයාගේ යහපත උදෙසා කටයුතු කළහ.

විටක මක්කම පිහිටා ඇති කංබතුල්ලාහ්ම (ශුද්ධ භූමියට) බලහත්කාරයෙන් ඇතුල් වී සටන් කළවුන්ට විරුද්ධව ඇති වූ හර්බුල් පිජාර් කටනේදි අසල්වැසියන්ගේ උදව්වට එතුමා ඉදිරිපත් විය. මක්කම වැසියන්ට හා පිටතින් සිට එහි පැමිණෙන්නන්හට අසාධාරණයක් සිදු වූ කළ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පිහිටුවන ලද හිල්පුල් පුලුල් නමැති සුබ සාධක සංගමය ආරම්භ කිරීම සඳහා ප්‍රධාන වගකීමක් මෙතුමා භාර ගත්තේය. මුහම්මද් නබි නායකතුමා තම විසිපස් වැනි වියේදී මක්කමහි ධනවත් කාන්තාවක් වූ කදීජා තුමියගේ වෙළඳ භාණ්ඩ රැගෙන වෙළඳාම සඳහා සිරියාවට පිටත් වූයේය. මෙතුමාගේ විශ්වාසවන්ත බව, අවංක බව, යහපත් ගතිගුණ යනාදිය නිසා හතලිස් වැනිවියෙහි පසු වූ වැන්දඹුවක් වූ කදීජා තුමිය මෙතුමා සමග විවාහ වීමට කැමැත්ත පල කළාය. එය සිදුවූයේ ක්‍රි.ව. 594 වර්ෂයේදීය. මෙය සතුටින් භාරගත් නබි නායකතුමා කදීජා තුමිය සමග විවාහ වූහ. වංක බව මිනී මැරීම, සූදුව, මංකොල්ල කෑම, සුරාපානය නපුරුකම, ස්ත්‍රීන්ට හිංසා කිරීම ආදී දුසිරිත් එදා අරාබි දේශයේ තිබීම දුටු නබි නායකතුමා බොහෝසේ වේදනාවට පත්වූයේය. මේ තත්ත්වයෙන් වෙනස් සමාජයක් ගැන නිතරම පැහැදිලි සිතුවිල්ලෙහි ගැලී සිටියහ. මෙසිතුවිල්ලෙන් පසුවීම සඳහාත්, භාවනා කිරීම සඳහාත් හුදකලාව සිටීමට මෙතුමාට අවශ්‍ය විය. එමනිසා මක්කමහි සිට සැතපුම් තුනක් ඈතින් පිහිටි හිරා නම් ගුහාවට නිතර නිතර මෙතුමා ගියේය. මෙසේ මෙතුමා හුදකලාවේ භාවනා කරමින් පසුවූ අවස්ථාවක එතුමාගේ හතළිස් වැනි වියෙදි. රාමලාන් මස එක් දිනක හිරා ගුහාව තුලදි අල්ලාහ්තඅලා (දෙවියන් වයන්සේ) ගේ වහී යු නමැති දේව වාක්‍යය ප්‍රදානය කළේය. එදා සිට ක්‍රම ක්‍රමයෙන් අල්කුරාආන්හි ආයතනයන් (කුරානයේ ගාථාවන්) පහළ වන්නට විය. මෙසේ අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේ) ගේ අවසන් දූතයා වශයෙන් නබි නායක මුහම්මද් තුමා පත්කර ගන්නා ලදී.

නබි නායකතුමා අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේ) විසින් ප්‍රදානය කරන ලද දූතභාවය එතුමාගේ බිරිය වන කදීජා මව්තුමිය මුලින්ම පිළිගෙන ඉස්ලාම් ධර්මය වැලඳ ගත්තාය. ඉන්පසු නබි නායකතුමාගේ මෙහෙකරු වූ සෙයිද් ලොකු පියාගේ පුත් වූ අලි ඉබ්නු අබිතාලිබ්, හිතවත්ම මිතුරා අබුබකර් යනාදීන් පිළිවෙලින් ඉස්ලාමය වැළඳ ගත්හ. මෙසේ පුරා වසර 3ක්ම මෙතුමා රහසිගතව ඉස්ලාම් ප්‍රචාරයෙහි යෙදුනේය. ඉන්පසු ප්‍රසිද්ධියේම ජනයා ඉස්ලාමිය වෙත කැඳවන ලෙසත් අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේ) කෙරෙහි තැබූ දැඩි අධිෂ්ඨානයෙන් තම ප්‍රචාරය අත් නොහලමින් දිනෙන් දින වර්ධනය කර ගත් අතර දිනෙන් දින ඉස්ලාම් ධර්මය පිළිගන්නන්ගේ සංඛ්‍යාව වැඩිවන්නට වූ හෙයින් එය දුටු කුරෙෂිවරුන් (ගෝත්‍රික ඝනයට සිටි අයවලුන්) කලබල වූහ. එම නිසා දැරිය නොහැකි තරම් වේදනා පමුණුවන්නට හා බාධා හිරිහැර කරන්නට විය. මක්කම හි නතරව සිටි ඉස්ලාම් ධර්මය අදහන තමන්ට වෙනත් බලවේගයන් විසින් පමුණුවන ලද හිරිහැර විඳ දරාගෙන ජීවත් වූයේය. මේ අතර මුහම්මද් නබි නායකතුමාට බොහෝ සේ කුඩා කල සිට රැකවරණය දුන් ලොකු පියා වූ අබුතාලිබ් හා ආදර බිරිය වූ කදීජා මව්තුමියන් ක්‍රි.ව. 619 දී අභාවප්‍රාප්ත විය. මේ සිද්ධිය වූයේ නබිතුමාගේ පනස්වැනි වියේදිය. මෙම සිද්ධියෙන් මෙතුමා බොහෝසේ වේදනා වින්දහ. මේ නිසා මෙම වසර ආමුල් හුස්න් (දුක් වසර) නමින් හැඳින්වේ. ඉස්ලාමයට කුරෙෂිවරුන් (වෙනත් ගෝත්‍රිකයින්)ගෙන් විරුද්ධතා දැක්වූ නිසා එයට ආධාර සොයා මෙතුමා මක්කම සිට සැතපුම් 50ක් දකුණු දෙසින් පිහිටා ඇති තා ඉෆ් නගරයට ගියේය. එහිදි එතුමානෝ ඉස්ලාම් ප්‍රචාරය පටන් ගත්හ. එහෙත් උදව් වෙනුවට ඒ නගර වැසියෝ නබි නායකතුමන්ව ගල්ගසා එලවා දැමූහ. තම උත්සහය අසාර්ථක වූ බැවින් බොහෝ දුක් වේදනා ඇතිව එහි සිට මක්කම බලා ආපසු මෙතුමා පැමිණියේය. හජ් (හජ්ජි) කාලයේ පිටරටවල සිට පැමිණෙන වන්දනා කරුවන්ට ධර්මය දේශනා කළේය. මක්කමට උතුරින් සැතපුම් 280ක් පමණ දුරින් ඇති යස්රිබ් (මදිනා) සිට පැමිණියන්ගෙන් හය දෙනෙක් ඉස්ලාමය පිළිගත්හ. මොවුන් එහි ඉස්ලාම් පැතිරීමට මුල් වූහ. ඊළඟ වසරේ දොළොස් දෙනෙක් මෙම ධර්මය පිළිගෙන එහි වත්පිලිවෙත් රකින බවට නබි නායකතුමන් වෙත පොරොන්දු වූහ. මෙය පළමුවන අකබා පොරොන්දුව නමින් හැඳින්වේ.

මේ කාලයේදි මෙතුමාගේ ජීවිතයේ පුදුම සිද්ධියක් විය. අල්ලාහතආලාගේ (දෙවියන් වහන්සේගේ) අණ පරිදි ජිබ්රිල් තුමා එක් රැයක නබි නායකතුමන් මක්කමේ කංබාහී සිට බොහෝ දුර ඇති ජෙරුසලමේ පිහිටා ඇති බයිතුල්මුකද්දස් මජ්පිදයට (දෙවස්ථානයට) කැඳවාගෙන ගියේය. එය අල් ඉස්රහ් (මැදියම් ගමන) යන නමින් හැඳින්වේ. ඉන් පසු නබි නායක තුමානෝ අහස් තෙරින් එගොඩ වී අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේගේ) අර්ෂ් දක්වා (අනන්තය) ගියේය. මෙය මිහිරාජ් නමින් හැඳින්වේ. මේ සිද්දියේදී නබි නායක තුමාගේ පෙර විසූ නබි නායකතුමන්ලා (ධර්ම දූතයන්) බොහෝ දෙනෙක්ද වූහ. නිරය, ස්වර්ඝය යනාදිය දුටුහ. තවද පංච කාල සලාතය (පස්වේල හැමදුම) මිහිරාජ් ගමනේදී එතුමා ලැබූ දායාදයක්ද විය. තවද එතුමන්හට ඉස්ලාම් ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය ශක්තියද, චිත්ත ධෛර්යද අල්ලා දෙවියන් වහන්සේ විසින් ප්‍රදානය කරන ලදී. මෙතුමාගෙන් ඉස්ලාම් ධර්මය සඳහා මදිනා නගරයේ සිදුවූ ප්‍රචාරයන් නිසා එහි මුස්ලිම්වරුන්ගේ (ඉස්ලාම් ධර්මය අදහන අයවලුන්) සංඛ්‍යාව වැඩිවෙමින් පැවතිනි. මුස්ලිම්වරුන්, කුරෙහිවරුන් අතර බද්ර් උහුද් නමින් සටන් කිහිපයක්ම ඇති විය. මුස්ලිම් ආගමිකයන් අල්ලා දෙවියන් කෙරෙහි තැබූ අචල විශ්වාසය හේතු කොට ගෙන ඔහුට උදව් උපකාර කර ජය අත්කර දුන්හ. තවද දකුණු සිරියාවට නබි නායකතුමා විසින් යවන ලද ඉස්ලාම් ධර්මය ප්‍රචාරක දූතයන් එහි සිටි පාලකයන් විසින් මරාදමන ලදී. එම නිසා මුස්ලිම්වරුන් හා පාලකයින් අතර පැවති සටන මුතා සටන නමින් හැඳින්වේ. කාලයාගේ ඇවෑමෙන් නබි නායකතුමා ඉස්ලාම් ධර්මය ලෝකයට ප්‍රචලිත කිරීම සඳහා අප්‍රමාණ වෙහෙසක් දැරූ අතර මෙම ආගමික සංස්කෘතිය යහපත් වූ බැවින් සමාජයට දැහැමි සමාජයක් බිහි කිරීමට හැකි විය. ක්‍රි. ව. 632 වර්ෂයේ එක් දිනක නබි නායකතුමා හජ්ජි වන්දනාව සඳහා මක්කමට පැමිනියහ. බොහෝ මුස්ලිම් ආගමිකයන් රැස්ව සිටි අර්ෆා පිටියේදී එතුමා තම අවසන් හජ්ජි දේශනය පැවැත්වූයේය. ඉන්පසු මදීනා නගරයට ගිය එතුමා මාස දෙකකට පසු අසනීප විය. එම වර්ෂයේදීම එතුමා වෂාත් (ස්වර්ගස්ත) වූහ. එතුමා ඉස්ලාම් ධර්මයට කරනු ලැබූ අනුපමෙය සේවය නිසාවෙන් එතුමාගේ උපත සිදුවන දිනය නබි නායක උපන් දිනය ලෙසින් සමරනු ලබයි. මෙය මුළු මුස්ලිම් ආගමික ලෝකවාසින් විසින් ම සමරති. එතුමා ඉස්ලාම් ධර්මයේ පියා යනුවෙන් හඳුන්වයි. අල්ලාහ්තආලා (දෙවියන් වහන්සේ) එතුමාණන්ට ශාන්තියත්, කරුණාවත් අත්පත් කරත්වා.

(ඉස්ලාම් පොතපත ඇසුරිනි)

**කෝප්‍රල් රම්සිල් මොහොමඩ්**

Wait a fair wind, and you'll get one

# සිමියොන්ලා හත්දෙනා

එකෝමත් එක රටක අයියලා මල්ලිලා හත් දෙනෙක් හිටියා. ඒ ගොල්ලන්ගේ වාසගම් සිමියොන්, හත්දෙනා ම දක්‍ෂ වැඩ කාරයෝ.

දවසක් දා ඒ ගොල්ලෝ ගියා කුඹුරු වපුරන්ට, හත්දෙනාම කුඹුරු වැඩ කරන කොට, රටේ රජතුමා, යුද්ධ නායකයාත් එක්ක ගමනක් ගියා. රජතුමා කුඹුර දිහා බලා හත් දෙනාව දැකලා පුදුම වුණා.

"හරි වැඩක් නෙව. එකම කුඹුරක හත් දෙනෙක් වපුරනවා. හත්දෙනාගෙම උස එක වගෙයි, මුහුණුවර එක වගෙයි, ගිහිල්ලා දැනගෙන වරෙල්ලා කවුද මේ ගොවියෝ, කොහෙන්ද මේ ගොවියෝ කියලා." රජතුමා කීවා

රාජ සේවකයෝ ගිහිල්ලා සිමියොන්ලා හත්දෙනාව රජතුමා ඉදිරියට ගෙනාවා. "නුඹලා කවුද? මොනවද කරන්නෙ?" රජතුමා ඇහුවා. "අපි සිමියොන්ලා. අයියලා මල්ලිලා හත්දෙනෙක්. ගොවිතැන් වැඩ කරනවා. සීයාලාගේ තාත්තලාගේ කුඹුරු වපුරනවා. අපට කර්මාන්ත වැඩත් පුළුවන්." හත්දෙනාම පිළිතුරු දුන්නා.

"නුඹලා දන්න කර්මාන්ත මොනවාද?" රජතුමා ඇහුවා.

"මහ පොළොවේ ඉඳලා අහසට වැදෙන තරම් උස යකඩ කණුවක් හදන්ට මට පුළුවනි." ලොකු සිමියොන් කිව්වා.

"ඒ කණුව දිගේ අහසට නැගලා හතර වටේටම බලලා, තොරතුරු හොයන්ට මට පුළුවනි," දෙවනි සිමියොන් කිවුයා. "මට පුළුවන් පට පට ගාලා නැවක් හදලා මුදු ගිහිල්ලා, මුදේ යට කිමිදිලා වගතුග හොයාගෙන එන්නට." තුන්වෙනි සිමියොන් රජතුමාට කීවා.

"පියාඹන මැස්සෙකුට වුණත් වරදින්නේ නැතුව ඊයෙන් විදින්න මට පුළුවනි." හතරවෙනි සිමියොන් කීවා.

"අහස දිහා බලා, අහසේ තියෙන තරු වරදින්නේ නැතුව ගණන් කරන්ට මට පුළුවනි." පස්වෙනි සිමියොන් කිව්වා.



"නුඹට මොනවද පුළුවන්?" රජතුමා පොඩි සිමියොන්ගෙන් ඇසුවා.

"මහ රජ තුමනි මම සින්දු කියනවා නලාව පිඹිනවා."

එතකොට යුද්ද නායකයා රජුට මෙහෙම කියනවා. "දේවයන් වහන්ස! අපට ඕන වැඩක් දන්න දක්ෂ උදවිය. සින්දු කාරයින් ගෙන් අපට වැඩක් නැහැ. උන්ව පන්නා දමන්න ඕන. උන් නිකම් පිනට කාලා, බීලා ඉන්න එවුන්."

"නුඹේ කතාව හරි." රජතුමා කීවා. පුංචි සිමියොන් රජුට නමස්කාර කරලා මෙහෙම කිව්වා.

"මහරජ තුමනි! මගේ හපන් කම් පෙන්වන්න අවසර දෙන්න. මම නළාව පිඹින්නම්."

**ඔක්කෝටම වැඩියෙන් උඩ පැන, පැන නැටුවේ යුද්ද නායකයා. ඔහුට දාඩිය දාලා. ඔහුගේ යටි රැවුළ වෙවුලනවා. කම්මුල දිගේ කඳුළු කැට ගලනවා. රජතුමා කෑගැහුවා. වාදනය නවත්වාපන්, මීට වැඩිය නටන්ට මට බැහැ. මට බොහොම මහන්සියි.**

**හොඳ මිනිසුන්ට, නැටුම් නවත්වලා විවේක ගන්ට පුළුවනි. යුද්ද නායකයා නුඹේ නපුරු කටයි, නපුරු ඇසුයි නිසා නුඹ තව නටපන්" කියලා පුංචි සිමියොන් කිව්වා.**

**ඔන්න ඒ පාර මිනිස්සු නිකම් හිටියා. යුද්ද නායකයා විතරක් හති දම, දමා නටනවා. නටලා, නටලා බැරිම තැන ඔහු බිම ඇද වැටුණා. බිම වැටිලා හරියට වැලි ගොඩක දාපු මාළුවකු වගේ ඉන්නවා.**

"හොදයි අන්තිම වරට පිඹපන්. ඊට පස්සේ මගේ රටින් පිටවෙලා පලයන්." රජතුමා කිව්වා.

පුංචි සිමියොන් නළාව අරගෙන රැසියන් ගීයක් වාදනය කළා. එතැන රැස්වෙලා හිටිය මිනිස්සු ඔක්කොමල්ලා නටන්ට පටන් ගත්තා.!

රජතුමා නටනවා, සිටු වරයෝ නටනවා, මුර කාරයෝ නටනවා. ඉස්තාලෙ හිටිය අස්වයොත් නටනවා. ගව මඩුවල ගවයෝ. එළදෙන්නු නටනවා. කුකුලෝ, කිකිළියෝ නටනවා. ඔක්කෝටම වැඩියෙන් උඩ පැන පැන නැටුවේ යුද්ද නායකයා. ඔහුට දාඩිය දාලා. ඔහුගේ යටි රැවුළ වෙවුලනවා. කම්මුල දිගේ කඳුළු කැට ගලනවා. රජතුමා කෑ ගැහුවා. "වාදනය නවත්වාපන්, මීට වැඩිය නටන්ට මට බැහැ. මට බොහොම මහන්සියි."

"හොඳ මිනිසුන්ට, නැටුම් නවත්වලා විවේක ගන්ට පුළුවනි. යුද්ද නායකයා නුඹේ නපුරු කටයි, නපුරු ඇසුයි නිසා නුඹ තව නටපන්" කියලා පුංචි සිමියොන් කිව්වා.

ඔන්න ඒ පාර මිනිස්සු නිකම් හිටියා. යුද්ද නායකයා විතරක් හති දම, දමා නටනවා. නටලා, නටලා බැරිම තැන ඔහු බිම ඇද වැටුණා. බිම වැටිලා හරියට වැලි ගොඩක දාපු මාළුවකු වගේ ඉන්නවා. පුංචි සිමියොන් නළාව පිඹීම

නැවැත්තුවා.

“මේ තමයි මම දන්නා කර්මාන්තය!” පුංචි සිමියොන් කිව්වා. රජතුමා හිනා වුණා. යුද්ද නායකයා තරහ පෙන්වන්නේ නැතුව හිටියා.

“ලොකු සිමියොන් දැන් නුඹේ හපන්කම් පෙන්වාපන්!” රජතුමා අණ කළා.

ලොකු සිමියොන් රාත්තල් පන්සීයක් බර යකඩ මිටියක් අරගෙන මහ පොළොවේ සිට නිල් පාට අහසට යන කල් උසට උසේ යකඩ කණුවක් හැදුවා. දෙවැනි සිමියොන් යකඩ කණුව දිගේ අහසට නැගලා බලනවා.

“මොනවද පෙනෙන්නේ කියලා කියාපන්!” රජතුමා අහනවා.

“මහ මූදේ නැව් යනවා පේනවා! කුඹුරුවල වපුරනවා පේනවා!.” දෙවැනි සිමියොන් කියනවා.

“තව මොනවද පෙනෙන්නේ”

“මහා සාගරයේ” බුයානා දූපතේ රත්තරන් මාලිග ාවක ජනේලයක් ළඟට වෙලා, ලස්සන යෙලේනා සේද පා පිස්සක් ගොතනවා.”

“යෙලේනා කොහොම කෙනෙක්ද?”

“ඒ තරම් ලස්සන කුමරියන් ඉන්නේ කතාවල විතරයි. හිස පීරලා අඩ සඳ පැළඳලා. හැම කෙස්ගහකම මැණික් ගලක්.”

රජ තුමාට ලස්සන යෙලේනාව සරණ පාවා ගන්ට හිතුනා. ඒ රටට මඟුල් කපුවකු යවන්ට හිතුනා. නපුරු යුද්ද නායකයා රජුට උපදෙස් දුන්නා.

“දේවයන් වහන්ස! ලස්සන යෙලේනා කැමති කරවා ගන්ට සිමියොන්ලා හත්දෙනාව යවන්ට. ඒ ගොල්ල දක්ස වැඩ කාරයෝ!. කුමාරිව නො ගෙනාවොත් ඒ ගොල්ලන්ගේ බෙලි කපා දාන්ට අණ කරන්න.!”

“හොඳයි. ඒ ගොල්ලන්ව යවන්නම්!” රජ තුමා කීවා.

ලස්සන යෙලේනා කුමාරිව අරගෙන එන්න කියලා රජතුමා සිමියොන්ලා හත්දෙනාට අණ කළා.

“නැතිනම් මගේ කඩුවෙන් නුඹලා ගේ බෙලි කපා දමනවා” රජු කීවා.

මොනවා කරන්ටද? නැව් හදන සිමියොන් පොරවක් ගත්තා, පට, පට ගාලා ගස් කපලා, නැවක් හදලා මුදට දැම්මා. ඕන කරන බඩු මුට්ටු, වටිනා තෑගි බෝග නැවට පැටෙව්වා. සිමියොන්ලා හත්දෙනා ගේ නායකයා හැටියට රජතුමා නපුරු යුද්ද නායකයාව පත් කළා. නපුරා සුදුමැලි වුණා. එහෙත් කරන්ට දෙයක් නැහැ. නපුරා මිනිසුන් අමාරුවේ දාන්ට හපනා. ඒ වුණාට අනුන්ට කපාපු වළේ තමා වැටෙයි කියලා නපුරු යුද්ද නායකයාට බයයි.

ඔන්න ඉතින් මේ ගොල්ල නැව් නැග්ගා. හුළං පාරට රුවල් ලෙලදුන්නා. මහා සාගරයේ බුයානා දූපතට නැව පිටත් වුණා.

ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, මහා සාගරයේ නැව ගමන් කරලා බුයානා දූපතට ආවා.

පිරිස ගොඩ බැහැලා තෑගිබෝග අරගෙන ලස්සන යෙලේනා කුමරිය ළඟට ගිහිල්ලා විවා මඟුල් ගැන කතා කළා. ලස්සන යෙලේනා කුමරිය තෑගිබෝග දිහා බලනවා. නපුරු යුධ නායකයා ඇගේ කනට රහසක් කියනවා.

“ලස්සන යෙලේනා නුඹ ඔය මඟුලට කැමති වෙන්න එපා. අපේ රජ්ජුරුවෝ හද්ද නාකියෙක්. එයාගේ රටපුරා වෘකයෝ හූ කියනවා. වලස්සු ඇවිදිනවා.”

ඔහොම ගිහිල්ලා,
ගිහිල්ලා, මහා සාගරයේ නැව
ගමන් කරලා බුයානා දූපතට ආවා.
පිරිස ගොඩ බැහැලා තෑගිබෝග අරගෙන
ලස්සන යෙලේනා කුමරිය ළඟට ගිහිල්ලා
විවා මඟුල ගැන කතා කළා. ලස්සන යෙලේනා
කුමරිය තෑගිබෝග දිහා බලනවා. නපුරු යුද්ද
නායකයා ඇගේ කනට රහසක් කියනවා.
.ලස්සන යෙලේනා නුඹ ඔය මඟුලට කැමති
වෙන්න එපා. අපේ රජ්ජුරුවෝ හද්ද
නාකියෙක්. එයාගේ රටපුරා වෘකයෝ
හූ කියනවා. වලස්සු
ඇවිදිනවා.”

“ලස්සන යෙලේනාට තරහ ඇවිත් මඟුල් කපුවන්ව පන්නා ගත්තා. දැන් ඉතින් මොනවා කරන්නට?”

“අයියණ්ඩියෙනි.! නුඹලා නැවට නැගපල්ලා රුවල් දා ගනිල්ලා! ගමනට ලෑස්ති වෙයල්ලා! කෑම බීම නැවට පටවාගනිල්ලා! කුමාරිව නැවට ගෙනෙන එක මම බලාගන්නම්” පුංචි සිමියොන් අයියලාට කිව්වා.

සිමියොන් ගොවිරාළ මූදු වෙරළේ තිරිඟු ගොවිතැන් කරලා, එක පැයකින් කරල් කපලා, තිරිඟු පිටි කරලා පාන් පුච්චලා, පාන්, තිරිඟු නැවට පැටෙව්වා. නැව පුංචි සිමියොන් එන තුරු බලාගෙන ඉන්නවා.



පුංචි සිමියොන් මාලිගාවට ගියා. ලස්සන යෙලේනා ජනේලය ළඟ වාඩිවෙලා සේද පා පිස්නක් ගොතනවා. පුංචි සිමියොන් ජනේලය ළඟ බංකුවක වාඩිවෙලා කුමාරියට ඇහෙන්නට කතා කරනවා.

“බුයානා දූපත හොඳයි, මහ මුහුදයි, සාගරයයි හොඳයි, අපේ රුසියාව ඊට වැඩිය බොහොම හොඳයි. රුසියාවේ පිට්ටනි කොළ පාටයි. ගංගා නිල් පාටයි. රට බොහොම හොඳයි. රුසියාවේ පිට්ටනි කොළ පාටයි. ගංගා නිල් පාටයි. රට බොහොම ලොකුයි. ඉමක් කොණක් පෙනෙන්නේ නැහැ. බිරියෝසා ගස් සුදු පාටයි, වතුවල මල් රතු පාටයි. එක පැත්තකින් ඉර බහිනකොට තව පැත්තකින් ඉර පායනවා. රෑට හඳ බබලනවා. තරු දිලිසෙනවා. පිනි බිඳු රන්වන් පාටයි, දිය පාරවල් රිදී පාටයි, උදෑසන එඬේරා පිටියට ඇවිත් නලාව පිඹිනවා. ඔහු පස්සේ යන්ට හිතෙනවා...”

පුංචි සිමියොන් ඊට පස්සේ නළාව පිඹින්නට පටන් ගත්තා. රත්රන් දොරකඩින් ලස්සන යෙලේනා එළියට ආවා. සිමියොන්

නළාව පිඹින ගමන් මල් වත්තේ ඇවිදිනවා. ලස්සන යෙලේනා ඔහු පිටුපසින් ගමන් කරනවා. පුංචි සිමියොන් වත්ත මැදින් ආවා. කුමරිය ඔහු පිටුපසින් යනවා. පුංචි සිමියොන් වෙල මැදින් ගියා. කුමරිය ඔහු පිටුපසින් යනවා. පුංචි සිමියොන් වෙරළට ආවා. කුමරිය ඔහු පිටුපසින් වෙරළට ආවා. පුංචි සිමියොන් නැවට නැංගා, ලස්සන යෙලේනා කුමරියත් නැවට නැංගා.

සිමියොන්ලා ඉක්මනට නැව පදවාගෙන මහ මුහුදට ආවා. මුහුද මැදදි පුංචි සිමියොන් නළා වාදනය නැවැත්වුවා. ඔන්න එතකොට තමයි, ලස්සන යෙලේනා කුමරිය වට පිට බැලුවේ. වටේටම මහ මුහුද, බූයානා දූපත බොහොම ඈත. යෙලේනා කුමරිය එකවරම අහසට පියාඹලා නිල් පාට තරුවක් වුණා. ඈ දැන් අහසේ අනිත් තරු මැද හැංගිලා ඉන්නවා. තරු ගණන් කරන සිමියොන් අහස දිහා බලා තරු ගණන් කරලා යෙලේනා තරුව හොයා ගත්තා. දුනු ශිල්පියා ඇවිත් යෙලේනා තරුව හොයා ගෙන එල්ලය බලලා ඒ තරුවට විද්දා. එතකොට තරුව නැවට වැටිලා ආයෙමත් ලස්සන යෙලේනා කුමරිය බවට පත්වුණා.

සිමියොන් වඩුවා ලස්සන ගෙයක් හැදුවා. සිමියොන් ගොවියා ගොවිතැන් කරනවා. සිමියොන් නාවිකයා නැව් නැගලා ගියා. සිමියොන් ගණිතයා ගණන් කරනවා. සිමියොන් දුනු ශිල්පයා රුසියාව රකිනවා. රුසියාවේ හැම දෙනාටම රස්සාවල් තියෙනවා.

"කුමරියනි, නුඹ අපෙන් දුවන්ට එපා. නුඹට හැංගෙන්නට බැහැ. නුඹ අකැමැති නම් අප සමඟ යන්ට, අපිට පුළුවනි නුඹව නුඹගේ රටට ගෙන යන්න. රජ්ජුරුවෝ අපගේ බෙලි කපා දැම්මත් කමක් නැහැ." පුංචි සිමියොන් කුමරියට කිව්වා.

ලස්සන යෙලේනා කුමරියට පුංචි සිමියොන් ගැන මහ දුකක් උපන්නා.

"පුංචි සිමියොන් සින්දු කාරයා. නුබේ බෙල්ල කපන්ට මම ඉඩ තියන්නෙ නැහැ. නාකි රජු ළඟට යන්නම්". කුමරිය කීවා.

දවසක් ගත වුණා, දවස් දෙකක් ගත වුණා. පුංචි සිමියොන් කුමරිය ළඟින් හෙලවෙන්නේවත් නැහැ. ලස්සන යෙලේනා කුමරිය ඔහු දිහා බලාගත්තු ගමන්ම ඉන්නවා.

නපුරු යුද්ද නායකයා මේවා සේරම හොඳට බලාගෙන ඉන්නවා. නපුරු වැඩ කරන්ට ඔහු කල්පනා කළා. ඔන්න දැන් රටත් වෙරළත් පේනවා. යුද්ද නායක නපුරා සිමියොන්ලා හත් දෙනාට අඬ ගහලා පැණි, රයි වයින් දීලා මෙහෙම කිව්වා.

"අපේ රටට ජය පතා වයින් බොමු!"

වයින් බිව් හැටියේම හයදෙනාම බිම වැටිලා නිදා ගන්න පටන් ගත්තා. දැන් ඉතින් හෙණ ගැහුවත් විදුලි කෙටුවත් ඔවුන් නැගිටින්නේ නැහැ. ඒ වයින් වලට වහ කවලම් කරලා.

ලස්සන යෙලේනා කුමරියයි. පුංචි සිමියොනුයි විතරයි වයින් බිව්වේ නැහැ.

නැව රටට පැමිණියා. සිමියොන්ලා හය දෙනෙක්ම නිදාගෙන ඉන්නවා. ලස්සන යෙලේනා කුමරිය රජු ඉදිරියට ගෙනයන්ට ඇයට පුංචි සිමියොන් ඇඳුම් ඇන්දෙව්වා. දෙන්නාම අඬනවා, සුසුම් ලනවා. වෙන් වී යාමට කැමති නැහැ. මොනවා කරන්නට ද? හිතේ තියෙන වචන පිට නොකර ඉන්නවා.

නපුරු යුද්ද නායකයා ඉක්මනට රජු ළඟට දුවගෙන ගිහිල්ලා දණින් වැටිලා මෙහෙම කියනවා.

"දේවයන් වහන්සේ! පුංචි සිමියොන් ඔබ තුමා මරන්ට ලැස්ති වෙනවා. කුමරියව සරණ පාවා ගන්ට රහසේ ලැස්ති වෙනවා. ඔහුව මරා දමන්න."

කුමරියයි, පුංචි සිමියොනුයි ආව හැටියේම රජතුමා කුමරියව මාලිගාවට යවලා, පුංචි සිමියොන්ව හිරගෙට දැමීමට නියම කළා. පුංචි සිමියොන් කෑ ගැසුවා.

"අයියණ්ඩියෙනි මාව හිරගෙට දානවා. මට පිහිට වෙයල්ල!" අයියලා හය දෙනාම නිදි.

පුංචි සිමියොන්ව හිරගෙට දාලා අත් පාවලට යකඩ දම්වැල් දැම්මා.

උදේ පාන්දර පුංචි සිමියොන්ව මරා දමන්ට ගෙනගියා. ලස්සන යෙලේනා අඬනවා. ඇගේ කඳුළු කැට මැණික් ගල් වගේ. යුද්ද නායක නපුරා පුරසාරම් දොඩවනවා.

පුංචි සිමියොන් ඉල්ලීමක් කළා.

රජතුමා සමාව දෙන්නේ නැහැ. පැරණි සිරිත අනුව මරණයට ඉස්සෙල්ලා මගේ අන්තිම කැමැත්තට අවසර දෙන්න. මගේ නළාව වාදනය කරන්ට අවසර දෙන්න.

යුද්ද නායක නපුරා කෑ ගහනවා.

"දේවයන් වහන්ස! ඉඩ දෙන්න එපා!"

"පැරණි රජසිරිත් කඩ කරන්ට මට බැහැ. නළාව පිඹපන්. ඉක්මන් කරපන්. මගේ වදකයා බලාගෙන ඉන්නවා, නුඹේ බෙල්ල කපන්න." රජතුමා කීවා.

පුංචි සිමියොන් නළාව වාදනය කළා.

නළාවේ හඬ කඳුවලට එහා, මුහුදුවල යන නැව්වලට ඇහුණා. නිදා හිටිය සිමියොන්ලා හය දෙනාටම ඇහුණා. ඔවුන් නැගිටලා මෙහෙම කියනවා.

"අපේ මල්ලිට ලොකු විපතක් වෙලා!"

සිමියොන්ලා හය දෙනා රජ ගෙදරට දුව ගෙන ගියා. වදකයා පුංචි සිමියොන් ගේ බෙල්ල කපන්ට ලැස්ති වුණා. සිමියොන් වඩුවා, සිමියොන් ගණිතයා, සිමියොන් ගොවියා, සිමියොන් නාවිකයා, සිමියොන් දුනු ශිල්පයා, සිමියොන් කම්මල් කාරයා හැම පැත්තෙන්ම දුවගෙන ආවා.

අයියලා බලය පෙන්නලා රජුව බය කරලා මෙහෙම කිව්වා.

"අපේ මල්ලිව නිදහස් කරපන්. ඔහුට ලස්සන යෙලේනා කුමරිය පාවා දීපන්."

රජ්ජුරුවෝ බොහොම බය වුණා.

"නුඹලාගේ මල්ලිව අර ගනිල්ලා. කුමාරිවත් අර ගනිල්ලා. මම ඇයට කැමති නැහැ. ඉක්මනට අරගෙන පලයල්ලා."

ඔන්න අයියලා එකතුවෙලා ජයට උත්සවයක් ලැස්ති කළා. කාලා බීලා, ගී කිව්වා. පුංචි සිමියොන් නළාව අරගෙන වාදනය කළා. රජ්ජුරුවෝ නටනවා, බිසව නටනවා, සිටු ගොල්ලොයි, ගැණුයි නටනවා. ඉස්තාලවල අශ්වයෝ නටනවා. ගව මඩුවල ගවයෝ, එළදෙන්නු නටනවා. කුකුළෝ, කිකිළියො නටනවා.

යුද්ධ නායක නපුරා උඩ පැන පැන හති දම දමා නටලා, නටලා බිම වැටිලා මළා.

පුංචි සිමියොන් ලස්සන යෙලේනාව විවාහ කර ගත්තා. සිමියොන් වඩුවා ලස්සන ගෙයක් හැදුවා. සිමියොන් ගොවියා ගොවිතැන් කරනවා. සිමියොන් නාවිකයා නැව් නැගලා ගියා. සිමියොන් ගණිතයා ගණන් කරනවා. සිමියොන් දුනු ශිල්පයා රුසියාව රකිනවා. රුසියාවේ හැම දෙනටෙම රස්සාවල් තියෙනවා. පුංචි සිමියොන් නළාව වාදනය කරලා මිනිසුන්ගේ සිත් සතුටු කරලා ඔවුන්ට වැඩ කිරීමට උදව් දෙනවා.

(රුසියන් සුරඟනා කතාවකි. .ලස්සන වසිලිස්සා" පොතෙන් උපුටා ගන්නා ලදි)

# සුබ මොහොතින් නව අණදෙන නිලධාරි තනතුර භාරගැනීම

වර්ෂ 1881 ක් වූ අප්‍රේල් මස 01 වන දින මේ ලක් දරණිතලය මත ස්ථාපනය කෙරුණු ශ්‍රී ලංකා පාබල හමුදාව ශ්‍රී ලංකාවේ පැරණිතම රෙජිමේන්තුව වශයෙන් ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියයි. එසේ ගෙවිගිය පසුගිය කාල පරිච්ඡේදය තුල විශ්මිත දස්කම් දැක්වූ සැබෑ විරුවන්ගෙන් පිරිපුන් ඒකකයන් කිහිපයකින් සමන්විත රෙජිමේන්තුව බවට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව අද දිනය වන විට පත්ව ඇති බව මෙහිලා සදහන් කරමි. ඉහත දින "2 වන බළඇණිය (සෙව්) ලංකා පාබල හමුදාව" ආරම්භ කරමින් යුධ හමුදා සේවයක අවශ්‍යතාවය ඉටු කිරිමෙහිලා සිය දායකත්වය සපයාදුන් "ලංකා පාබල හමුදාව" ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙමින් රෙජිමේන්තු මධ්‍යස්ථානයක් ආරම්භ කිරිම දක්වා ද, එතැනින් නොනැවති ශ්‍රීලපාහ ඒකකයන් ව්‍යාප්ත



කරමින් සිංහල ජාතියේත්, මාතෘභූමියේත් ආරක්ෂාව වෙනුවෙන් සුවිශාල මෙහෙයක් ඉටු කර ඇති බව අභිමානයෙන් යුතුව සදහන් කරමි. මෙසේ බළඇණි වල ව්‍යාප්තියත් සමගින්ම වර්ෂ 1990 ක් වූ ජූනි මස 08 වන දින ස්ථාපනය කළ මෙම 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ආරම්භක අණදෙන නිලධාරි වූයේ වත්මන් යුධ හමුදාවෙන් විශ්‍රාම ලබා සිටියදී මියගිය මේජර් ජෙනරාල් ඩි රත්නසභාපති ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී" යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමා වේ.

එසේම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවයන් මැනවින් ඉටු කරන්නට 6 වන බළඇණියට නායකත්වය දුන් අණදෙන නිලධාරි වරුන්ගේ නාම ලේඛනය පහත දක්වමු.

මේජර් ජෙනරාල් ඩී රත්නසභාපති ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී
මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී
ලූතිතන් කර්නල් ඩීයු ද ලැනරෝල් ආර්ඩබ්පී ආර්එස්පී(මියගිය) ශ්‍රීලපාහ
කර්නල් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී ආර්එස්පී
කර්නල් එස්කේපීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී
බ්‍රිගේඩියර් ඒඑල්එස්කේ පෙරේරා ආර්එස්පී
ලූතිතන් කර්නල් ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පී ශ්‍රීලපාහ
ලූතිතන් කර්නල් එම්පී ගුණසිංහ ශ්‍රීලපාහ
කර්නල් ඒඒඑස්පී තිලකරත්න

ශ්‍රීලපාහ රෙජිමේන්තු මාතාවගේ ඒකකයන් අතරේ මෙම 6 වන බළඇණිය ක්‍රියාන්විත දක්ෂතාවයන් පමණක් නොව විවිධ අංශයන්ගෙන් දක්ෂතා දක්වමින් පෙරමුණේ සිටින ඒකකයක් බව සදහන් කළ හැකි වන අතර ඒකකයක් වශයෙන් ඉදිරි ගමන් මග නිවැරදි ලෙස ගමන් කරන්නට අවශ්‍ය සෑම අවශ්‍යතාවයක්ම ඉහත නම් සදහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සකස්කර දී ඇති බව මෙමගින් සදහන් කරමි. ඒ නිසාම වන්නට අද මේ මොහොත වන විට සමස්ත යුද හමුදාවේම ඇති පාබල ඒකකයන් අතර අති දක්ෂ රණකාමීන්ගෙන් පිරිපුන් ඒකකයක් බවට පත්ව ඇත.

උතුර දකුණ යා කෙරෙන ප්‍රධාන සැපයුම් මාර්ගය අත්පත් කර ගැනීමත්, වන්නි මානුෂීය මෙහෙයුමේ නිරත භට පිරිස් වෙත සහය දැක්වීම සදහාත්, මුහමලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ සිට ඉදිරියට ඇදෙන්නට ඒකකය හැඩ ගැන්වීමේදී එවකට දෙවන අණදෙන නිලධාරි වශයෙන් කටයුතු කල නි/61403 මේජර් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ඒකකයේ අණදීම සහ පරිපාලන කටයුතු සියල්ල සැලසුම් කර ක්‍රියාත්මක කල අතර, ඒ වන විට ඒකකයේ අණදෙන නිලධාරිව කටයුතු කල ලුතිතන් කර්නල් ඒඒඑස්පී තිලකරත්න ශ්‍රීලපාහ 213 බසේමූ හි බළසේනාධිපති තනතුරට පත්ව ඒකකයෙන් සමුගෙන ගොස් තිබිණ.

කෙසේ වෙතත් මුහමලේ ඉදිරි ආරක්ෂක වළල්ල සිදබිද දමමින් ඉදිරියට ඇදුන මෙම ඒකක භට පිරිස් පලෙයි, අයියාකච්චි, අලිමංකඩ, දක්වා ද එතැනින් නැවත වමට හැරී වෙත්තලයිකේර්නි සිට කඩ්ඩෙයිකාඩු දක්වාත් ත්‍රස්තවාදීන්ට පහර පිට පහර දෙමින් ඉදිරියට ඇදෙන්නට වූහ. මේ වන විට ඒකකයට අණදෙන නිලධාරියෙකු නොමැති වුවද ක්‍රියාන්විතයේ නිරතව සිටියදී ලද දින කිහිපයක විරාමයත් සමගින් කඩ්ඩෙයිකාඩු ගම්මානයේ තාවකාලිකව ඒකක මූලස්ථානය හා භට පිරිස් ස්ථානගත කරන්නට හැකි විය. කණ්ඩායම් වල භට පිරිස් වෙත්තලයිකේර්නි වෙරළ තීරයට සමගාමීව රැකවල්ලා ගනිමින් මුහුදින් එල්ල විය හැකි ත්‍රස්තවාදී ප්‍රහාරයන් පිළිබඳ විමසිලිමත්ව සිටියේය.

ඒ වන විට මෙම ඒකකය වෙත නව අණදෙන නිලධාරි වරයෙකු පැමිණෙන බව දැනගන්නට ලැබී තිබූ අතර නව අණදෙන නිලධාරි තුමාගේ භාර ගැනීම් කටයුතු සිදු කිරිම සදහා අවශ්‍ය සියළු කටයුතු ලහි ලහියේ සිදු වන්නට විය. 2009.01.20 දින වන විට එකී සියළුම කටයුතු සංවිධානය වී තිබූ අතර, පෙරවරු 0810 පැය වන විට ඒකකයේ 10 වන අණදෙන නිලධාරි" වශයෙන් මේජර් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ" ඒකකය වෙත පැමිණෙන ලදි. එතෙක් ඒකකය ක්‍රියාන්විතයේ සාර්ථක ගමන් මගක් ඔස්සේ රැගෙන ආ දෙවන අණදෙන නිලධාරිව කටයුතු කල මේජර් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් නව අණදෙන නිලධාරි තුමන්ව පිලිගන්නා ලදි. අණතුරුව නව නායකයා හට සම්මාන මුරයක් මගින් ඒකකයේ ගරු ගාම්භීර උත්තමාචාරය පිරි නමන ලදි. ඒකකයේ 10 වන අණදෙන නිලධාරි වශයෙන් වැඩ භාර ගැනීමට වාසනාව ලද නව අණදෙන නිලධාරි



තුමන් බළඇණි මූලස්ථානය ඉදිරියේ ඒකක ධජය ඔසවා ඒකකයේ නාමය ඉහලින් තබන්නටත් කඩ්ඩෙයිකාඩු සුනාමි ගම්මානයේදී ලෙළ දෙන මෙම ඒකක ධජයේ සෙවණින් 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ නව අණදෙන නිලධාරි තුමන් හට දික් විජයක් දක්වා රැගෙන යන්නට අවස්ථාව සැලසෙනු ඇතැයි සැමට සිතෙන්නට ඇත.

අනතුරුව 2009.01.20 දින 0846 පැයට එළඹි සුබ මොහොතේදී 6 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 10 වන අණදෙන නිලධාරි

වශයෙන් නව පත්වීම භාර ගැනීම සඳහා ප්‍රථම ලිපියට අත්සන් තැබීමට මොහොතකට මත්තෙන් මේජර් වයිඑච්එම් යහම්පත් ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් පොල්තෙල් පහන දල්වා තෙරුවන් සරණ නැමැද ආශිර්වාද ලබා ගන්නා ලද අතර, අනතුරුව සුවිසාල වගකීම් සම්භාරයකින් පරිපූර්ණ වූත්, ගෞරවාභිමාණ වූත්, ඒකක අණදෙන නිලධාරි තනතුරේ වැඩ භාර ගැනීමට සියල්ල සූදානම් විය. කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් 1990.01.17 වන දින ශ්‍රී ලංකා යුධ හමුදා නිත්‍ය බළසේනාවට එක්ව පාබල ඒකක සමගින් ක්‍රියාන්විත රාජකාරීන් ඉටු කරලීම පමනක් නොව මිලේච්ච ත්‍රස්තවාදය විනාශ කිරීමෙහිලා 1 වන විශේෂ බළකාය වෙත එක්ව යුද හමුදා නිලධාරියෙකු වශයෙන් ත්‍රස්තවාදී බළය අඩපන කරන්නට ඉමහත් දායකත්වයක් ලබාදී ඇති මෙම නව අණදෙන නිලධාරි තුමා එකී ගමන් මග ඔස්සේ එමින් දෙස් විදෙස් පාඨමාලා හදාරමින් ලද පන්නරය සහ අසල අත්දැකීම් පෙරෙටු කර ගනිමින් ඒකකයේ ඉදිරි ගමන් මග, පෙළ ගැස්ම සහ පාලන රාජකාරීන් වෙනුවෙන් නායකත්වය ලබාදීමෙහිලා නව තනතුරේ වැඩ භාර ගනිමින් ප්‍රථම ලිපියට අත්සන් තබන ලදි.

අනතුරුව නව අණදෙන නිලධාරි තුමන් පිලිගැනීම වෙනුවෙන් පිලියෙල කර තිබූ පරිපූර්ණ තේ පැන් සංග්‍රහයකට සහභාගී වූ අතර, එළඹි සුභ මොහොත සිහිගන්වන්නට බළඇණි මූලස්ථානය ඉදිරිපිට පොල් පැලයක් සිටුවීමද විශේෂ අවස්ථාවක් විය.

එවන් කටයුතු නිමා වීමත් සමගින්ම බළඇණි මූලස්ථානයට රැස්ව සිටි නිලධාරි සහ සෙසුනිලයන් ඇමතූ නව අණදෙන නිලධාරි ඒකකයේ යහපත් ඉදිරි පැවැත්මක් වෙනුවෙන් කැපවී කටයුතු කරන බවත්, ඒ සඳහා ආධුනික සෙබළාගේ සිට රෙජිමේන්තු සැරයන් මේජර් දක්වාත් සියලු නිලධාරින්ගේත් සහය තමන් වෙත අවශ්‍ය බවත් සඳහන් කළ අතර, ඒකකයේ අවශ්‍යතා සහ පොදු වැරදි සකස් කර ගනිමින් සැවොම එක්ව කටයුතු කළහොත් ඒකකයේ ඉදිරි පැවැත්ම අවිවාදයෙන්ම සාර්ථක වන බවද ප්‍රකාශ කරන ලදි.

රටට අවශ්‍ය සාමය ගෞරවනීය සාමයක් දක්වා කැඳවාගෙන යමින් ඒකකයේ අණදීම හා පරිපාලන කටයුතු නිසි අයුරු පවත්වාගෙන යන්නටත්, නිදහස් නිවහල් රටක් බිහි කිරීමෙහිලා උරදෙන ඒකක භට පිරිස් වෙත ශක්තියක් ලබා දෙන්නටත් වාසනාව, ශක්තිය සහ ධෛර්ය ඔබ තුමන් වෙත සැලසේවා,! සියළු දෙවියන්ගේ දේව ආශිර්වාදය හා පිහිට ආරක්ෂාව නිරතුරුව ලැබේවා! යි ප්‍රාර්ථනා කරමු...

බුද්ධි අංශය 6 ශ්‍රීලපාභ

# පලෙයි නගර මධ්‍යයේ ඉදිවූ පළමු බුදු මැදුර



මේ දේශයේ වෙනම රාජ්‍යයක් බිහිකිරීමේ අපේක්ෂාවෙන් පුරා වසර 30ක පමණ කාලයක සිට යුධ භිතිකාවෙන් ඇළලී ගිය රුදුරු එල්ටීටීඊ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වලට කදිම පිළිතුරක් ලබා දෙමින් ලංකා දේශයේ පමණක් නොව බහුතරයක් විදේශීය රටවල ද ව්‍යාප්ත වෙමින් පැවති මෙම රුදුරු එල්ටීටීඊ සංවිධානය නැවත ගොඩගත නොහැකි අන්දමින් මුළුමනින්ම වළලා දමන්නට අප වීරෝදාර හමුදාවන්ට හැකි විය. ඒ අන් කිසිවක් නිසාවෙන් නොව අධිෂ්ඨාන ශක්තියෙන් හා එක් අරමුණකින් නිවැරදි නායකත්වයකින් යුතුව ක්‍රියා කරන ලද නිසාවෙනි.

එය එසේ සිදු වෙද්දී මේ තුන් ලෝකයටම මහේශාඛ්‍ය වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කළ ශ්‍රී සම්බුද්ධ ධර්මයේ පිහිට ආරක්ෂාව පමණක් නොව සිදු කරන්නට යෙදුන මෙම උතුම් සත්ක්‍රියාවලිය වෙනුවෙන් දෙවියන් වහන්සේලා පවා ආශිර්වාද කරන්නට ඇතිය යන්න විශ්වාසය තිබූ නිසාවෙනි. ශාන්ති නායකයාණන් වහන්සේගේ ගුණ සුවඳින් වෙලාගත් මේ මිහි තලයේ නිවහල් භාවය වෙනුවෙන් උරදුන් වීර පුතුන් වෙත තිසරණ සරණ සහ පිහිට ආරක්ෂාව නිරතුරුව ලැබී ඇති බව නම් සැබෑය. එනිසාම වන්නට ඒකකය ස්ථානගත පලෙයි නගර මධ්‍යයේ බුදු මැදුරක් ඉදි කරන්නට සියළු කටයුතු සම්පාදනය විය. මේ සඳහා ඒකක අණදෙන නිලධාරි තුමාගෙන් ලද අපිරිමිත වූ උපදෙස් නිසාම වන්නට ඒකක භට පිරිස් වෙතින් මිනිස් ශ්‍රමය නිරතුරුව ලැබෙද්දී මෙහි ඉදිකිරීම් කටයුතු කඩිනම් විය. මිනිසාගේ සදාකාලික සැපත වෙනුවෙන් බුදුන් නමදින්නටත්, තෙරුවණ ගුණ සිහිපත් කරන්නටත්, තථාගත බුදුපියාණන් වහන්සේගේ සමාධි බුදු පිලිමයක් වඩා හිඳුවන්නට මෙම බුදුගෙය ඉදිකිරීමෙහිලා අණදෙන නිලධාරි, දෙවන අණදෙන නිලධාරි ඇතුළු සියළු නිලධාරින්ගෙන් ලද උපදෙස් මත සෙ/304759 බනි II චූලවංශ එච්ඒඑස් විසින් ඉටුකල අපිරිමිත වූ කැප කිරීම නිසාම වන්නට ඉතා කෙටි කාලසීමාවක් තුල ඉදිකිරීම් කටයුතු නිමවා අඩි 5 ක් පමණ උසින් යුතු බුද්ධ ප්‍රතිමාවක් එතුල වඩා හිඳුවන්නට හැකියාව ලැබිණ. උතුරු ලක දිදුලන්නට බොදුබැති සැමට තිසරණ සරණ සිහි ගන්වන්නට මෙයින් හැකි වෙතැයි සඳහන් කරන අතර, 2009.09.29 දින ඒකයේ විශාල භට පිරිස් සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් බෝධි පූජාමය පිංකමක් සිදු කරමින් පලෙයි නගරය බෞද්ධ බොදුබැති පිරිස්හි පිං බිමක් බවට පත් කරවන ලදි. එසේම මෙම නිරාවර්ණය වූ බුද්ධ ප්‍රතිමා වහන්සේ වැඩ සිටින ස්ථානය චූලබිම්භාරාමය යන නමින් හඳුන්වන්නට කටයුතු කිරීම සතුටට කරුණක් බව මෙහිලා සඳහන් කරමු.

බුද්ධි අංශය 6 ශ්‍රීලපාභ





# ශ්‍රී ලංකා යුධ හමුදාවට සොල්දාදුවන් 268 දෙනෙකු ශ්‍රී ලංකා පාබල හමුදාව දායාද කළ වගයි







2009 අප්‍රේල් මස 8 වන දින සිට 2009 ජුලි මස 15 දින දක්වා වූ මාස 3කට අධික කාල වකවානුවක් තුල වෘත්තිය පුහුණු සොල්දාදුවෙක් සතු දැනුම් සම්භාරය ලබා ගනිමින් තම දෙමාපිය නෑ හිත මිතුරන් ඉදිරියේ විසිර ගිය මෙම ආධුනික පාඨමාලාවේ සෙනින් 268 දෙනා අතුරින් පාඨමාලාවේ අතිශූර සෙබළා වශයෙන් සෙ/2010399 ආසෙ සේනාරත්න එල්ඒඑස්ආර් හා දක්ෂතම වෙඩික්කරු වශයෙන් සෙ/2003468 ආසෙ රෝහණ ඩබ්කේඑස් යන අයවළුන් කුසලතා ලබාගත් අතර තම දැනුම් සම්භාරය ආධුනිකයින් වෙත ලබා දීමේදී ඉදිරියෙන් සිටි සෙ/12472 කෝප්‍රල් ධර්මසිරි ඩබ්ඩීඑම් හොඳම උපදේශක ලෙසින් ද සෑම අතින්ම ඉදිරියෙන් සිටි බණ්ඩය වශයෙන් සිව්වන බණ්ඩය ද රෙජිමේන්තු සේනාවිධායක තුමා අතින් කුසලාන ලබා ගන්නා ලදී.



# ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා තරගාවලිය 2009



ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් සහභාගි වූ ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඒසී ඔබේසේකර කේඑස්වී



මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී රෙජිමේන්තු අධිපති තුමන් විසින් ජයග්‍රහනය කරන ලද ක්‍රීඩකයින්ට පදක්කම් ලබා දෙමින්



ශ්‍රී ලංකා රෙජිමේන්තුවට රන් පදක්කමක් ලබා දුන් සෙ/14ඩී 01104 ලාකෝ අබේනායක ඩබ්ලිව්අයිඑම්ජේ හට කර්නල් කේඑන් පෙරේරා යන ජ්‍යේෂ්ඨ නිලධාරින් විසින් ලබාදුන් මොහොත



ප්‍රධාන ආරාධිත අමුත්තා වෙතින් පදක්කම් ලබන ක්‍රීඩකයින්



ක්‍රීඩා උළෙලේ එක් ප්‍රවේගකාරී අවස්ථාවක්




ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා උළෙලට සහභාගි වූ ශ්‍රීලපාහ ක්‍රීඩකයින්

2009 ජූලි මස 28,29 හා 30 යන දිනයන් වලදී ශ්‍රී ලංකා යුධ හමුදා ස්වේච්ඡා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා උළෙල සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී පැවැත් වූ අතර, එම ක්‍රීඩා උළෙලට ශ්‍රීලපාහ රෙජිමේන්තුව විසින් ක්‍රීඩකයින් 45 දෙනෙකු සහභාගි කරවමින් රන් පදක්කම් 1ක් රිදී පදක්කම් 5ක් හා ලෝකඩ පදක්කම් 8ක් දිනාගනිමින් අනු ශූරතාවය හිමි කරගන්නා ලදී.

# 23 ශ්‍රිලපාහ ඒකකයේ ආරම්භක පිය සටහන









ශ්‍රී ලංකා යුද හමුදාවේ පාබල හමුදා රෙජිමේන්තුවට තවත් එක් සුවිශේෂී මතක සටහනක් එක් කරමින් වර්ෂ 2009 ක්වූ ජූලි මස 23 වන දින 0910 පැයට යෙදුන සුබ මොහොතින් පාබල රෙජිමේන්තුවේ 23 වන නව සාමාජිකයා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රිලපාහ පනාගොඩ යුධ හමුදා කදවුරු භූමියේදී ජන්මය ලැබ සිය ජාතික මෙහෙවර ඉටු කිරීමේ ගමන ආරම්භ කරන ලදි.

නවතමයෙන් ස්ථාපිත මෙම බලඇණියේ ප්‍රථම කාර්ය නියුක්ත අණදෙන නිලධාරී වශයෙන් මේජර් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රිලපාහගේ අණ දීමෙන් යුතුව ආරක්ෂකසේනා මූලස්ථානය (මුලතිව්) යටතේ පාලනය වන 59 වන සේනාංකයේ, 594 බලසේනා මූලස්ථානයට අනුයුක්තව කුමලමුනෙයි ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරි කරනු ලබයිඒකකයේ පරිණත දැනුම් සම්භාරයක් ලද නිලධාරී/බලලත් නිලධාරී හා ජ්‍යොකොනොනි ගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයකින් යුතුව ඉදිරි කටයුතු සිදු කරගෙන යනු ලබයි.



තවද මාස එකහමාරක් වැනි කෙටි කාලයක් තුලදී නව දැක්මෙන් හා කැපවීමෙන් යුතුව තම බුද්ධිය මෙන්ම දක්ෂතාවය මනාව කැටි කොට ගනිමින් අධිෂ්ඨානයෙන් යුතුව ඒකකය මෙහෙය වන වත්මන් අණදෙන නිලධාරීගේ මග පෙන්වීම යටතේ බලඇණිය කුමලමුනෙයි ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරී කටයුතු වල නියැලෙමින් සිටියි. නව බලඇණියක් ලෙස ස්ථාපනය කරන ලද අප ඒකකය සියලුම නිලධාරී/සෙසු නිලයන්ගේ පූර්ණ කැපවීම සහ දායකත්වය මත ඒකකය දිනෙන් දින දියුණුවට පත් වේවා!යි ප්‍රාර්ථනා කරමි.

බුද්ධි අංශය
23 ශ්‍රිලපාහ



| | | |
|---|---|---|
| අණදෙන නිලධාරී | –: මේජර් | ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රිලපාහ. |
| දෙවන අණදෙන නිලධාරී | –: මේජර් | ඩබ්එම්ජීපීඑස් බණ්ඩාර ආර්එස්පී ශ්‍රිලපාහ. |
| විධායක අධිකාරී | –: කපිතන් | එස්ජ්ඩී සූරියආරච්චි ශ්‍රිලපාහ. |
| බුද්ධි නිලධාරී | –: 2/ලුතිතන් | ඩීකේඑල්ආර් ලියනගේ ශ්‍රිලපාහ. |
| නි:අ: පාලන කණ්ඩායම | –: මේජර් | එස්එල් නන්දසේන ශ්‍රිලපාහ. |
| නි:අ: ඒ කණ්ඩායම | –: කපිතාන් | පීඩීඑස්පී ගන්නෝරුව ශ්‍රිලපාහ. |
| නි:අ: බී කණ්ඩායම | –: 2/ලුතිතන් | එස්එච්එම් තිරෝශන ශ්‍රිලපාහ. |
| නි:අ: සී කණ්ඩායම | –: කපිතාන් | එස්එස් ලියනකම්කානම්ගේ ශ්‍රිලපාහ. |
| නි:අ: ඩී කණ්ඩායම | –: කපිතාන් | ජීඩීඑස්පී සේනානායක ශ්‍රිලපාහ. |
| රෙසැමේ | –: බති II | ගුණවර්ධන ඩීජ්ඔපී |
| රෙළපාසැමේ | –: බති II | විමලසේන කේ |
| ප්‍රධාන ලිපිකරු | –: ව/සැරයන් | ප්‍රේමලාල් ඩබ්ඩීජේ |

## ආසිය හැමදාක

පාට පාට දේදුනු ගාව
හින හින දකින කොට
ඇත ඇත හිඳ
බලා හිඳින්නම්....

රෑට රෑට තරු පායන විට
අහස් තලේ දුර
ළංව ළංව පායන්නට
ආසයි හැමදාක........

හින්පොද වැටෙන
හිරිගඩු පිපෙන හැන්දෑවක
ඔබේ උණුසුම් රැඳෙන්න
ආසයි හැමදාම.........

**සාසෙ පියසෝම යූඑල්පී**
**4 ශ්‍රීලපාහ 'ඩී' කණ්ඩායම**

## යුධබිමේ මතකය

යුද බිමේ දිනක් කල් ගෙවනා වෙලාවක
ඉගිළිලා එන්න ආසයි ගම් පළාතට
මම කොහොමද එන්නේ මේ යුද බිමේ සිට
අවි බිම තියන්නේ කොහොමද මේ වෙලාවට

යුද වදින යුද පිටිය බිහිසුනුයි හරියට
අමතක කරන්න බෑ යුද බිමේ මතකය
ඝණ කැලේ ඉඳන් රට රකිනා සෙබළ අප සැම
දුක් කඳුළු කම්කටොලු මැද අපි සැනසෙනවා

මේ රටේ සිවු කොනේ දෙවිවරුන් සිටිනවා
බය නැතේ හදවතේ අපි මෙල්ල කරනවා
බය වෙන්න නැනෙ සෙබළ සොයුරෝ රටේ ඉන්නවා
බය වෙන්නෙ නැනෙ සෙබළ සොයුරෝ අපිට වටිනවා

**සාසෙ ශාමංග කේඑයි**
**'සි' කණ්ඩායම 10 ශ්‍රීලපාහ**

## සෙනේබර පැතුමක්....

නිකිනි මහේ විසිපස් වන දින
පළමු පියවර තබන
ආදර දියණියේ
දෑහැමි පහාන්යා
විශ්මිත වූ විශ්වය දකින්නට
සෙවණැල්ලක් ලෙසින්
මා පිය සෙනෙහසින්
සුබ උපන් දිනක් දියණියේ
ඔබට පතන්නම්
සෙනෙහෙබර පැතුමක්

**ව/සැරයන් කොඩිතුවක්කු කේජ්ආර්**
ආධාරක කණ්ඩායම.
15 ශ්‍රීලපාහ



## සෙබළ සෙනෙහස

සිහිනෙන් ඇවිත් මා ළඟ
ඔබ දැවටෙන්නේ
එය මට සතුට වේ දවසක් සැනසෙන්න
පුතුන් නිතර අසනා ප්‍රශ්නය ඔන්න
තාත්ති එන්නේ නැහැ අම්මේ
යමු යන්න.......

ඔබ හා පුතුන් ගැන හිතලා මව හැරදා
සෙබළෙකු ලෙසින් ඔබ හමුදාවට
ගිය දා අමතක වෙන්නෙ නැහැ
රන්කඳ ඔබ සැමදා
ඔබට ණය ගැතියි මගේ ජිවිතේ සදා

සුළඟට පාවී මේ එන්නේ
කුටියක සිරවී හෙලන සුසුම්
අතු අග පරවී බිමට වැටෙන්නේ
සමනළ යුගයක පිපුනු කුසුම්

**සාසෙ තුෂාර රංගනාත් එල්එම්**
20 ශ්‍රීලපාහ



## නුඹ

නුඹව සිහිවී නෙතට
කඳුළු ඉනුවා මට නොදැනිම
කෙසේ කියන්නද මා නුඹට
මගේ හදවතේ තියෙන දෙය

මුර කුටියෙන් සමුගෙන මම
නිවාඩුවක් අරගෙන මම
පවසම් මම නුඹහට
මගේ හිතේ තියෙන දෙය

හිතේ හිරිවට්ටන ඔය ලෙන්ගතු
ඇස්දෙක මට සින්නක්කරයට
ලියා ගන්න මම මග බලා
ඉන්නම් සැමදා මගේ හදවතේ

**සාසෙ වීරසිංහ ඒජීඑස්**
20 ශ්‍රීලපාහ

## ජනගග ගැලුව තැන පුදුමාතලන් ඉම

නොම දැන මිනිස් ජිවිතයක වටිනා කම
පෙරුහාකරන් පතුරන ලද කුරිරු කම
තව තව දරාගෙන ඉන්නට හැකිය නොම
ජනගඟ ගැලුව තැන පුදුමාතලන් ඉම

දැනට ගන්න හැකි බඩු කොටසක් රැගෙන
මැරුණට වෙතින් පැනඑන ඔබ දුටුව දින
ඇතිළන හැගුම් කැටිකොට කවියකට ගෙන
කවියෙක් වෙමි සෙබළෙකි සේවයේ සිටින

මව් පිය වරුන් අභිමව දරුවන් සිටියා
දරුවන් සැවොම මියගිය මව්වරු දුටුවා
වෙඩි කා පැමිණ පිය උගුලෙහි සිටි පැටියා
පුදුමාතලන් වලදී පරලොවට ගියා

වයසට ගිය කලට වාරුව නැත ගතට
ජිවත්වෙන්න ආශාවක් ඇත සිතට
ඒනමුත් නොහැක ගොඩවෙන්නට පස්ගොඩට
සෙබළෙකු අතට අතදුන්නා අම්මෙකුට

කලබල වැඩි එක පොදියට පැමිණි විට
එය නවතන්න ගොස් වියලුනි උගුර කට
ගත් දිය පොදක් බොන්නට සෙබළගේ අතට
දෙන්නට වුනා ළඟ සිටි තංගච්චිට

දින ගණනකින් ආහාරයක් නැත ලබලා
උන්ඩෙට තිබුනු බය ඇත මුණෙහි ඇඳිලා
දෙන්නට දෙයක් මට ඇත අම්මේ කියලා
තම බත් වේල පිරි නැමුවා යුධ සෙබළා

මිනිසුන් මරන්නට කොටියට කත් ඇදලා
එන්ජිඕ එකේ පොහොසත් කොටි මහප්පලා
සැනසෙන්නට අපේ අභිමානය නසලා
දේශන පෙන්නලා ඇත විකෘති කරලා


වැනසුන වගයි උන් දුටු මුළු සිහිනයම
අද ලක්මැණි ඇන්දා සතුටින් බෝම
වියරුව දැහලුවත් සමහර අය ඔහොම
වැනසිය නොහැක යුධ සෙබළගේ සෙබළකම

ඇති එක නිල ඇඳුමය හොඳටම පරණයි
ඕනෑ එය නොවෙයි මට මගේ ලක් දෙරණයි
ඒ හැගුම්න්ම මා සටනට පැමිණි වගයි
දිවි දුන් සෙබළ සොයුරන් මා සිතට නැගෙයි

සාමය නගා සිටුවන්නට උපන් දෑයේ
දිවිදුන් ඔබ හලමින් ලේ ඔබගේ ලයේ
කිනොච්චියේ වෙඩි හඬ නොම ඇසෙනපයේ
ස්මාරකය ඉදිකෙරුවා ලහි ලහියේ


**2/ලුතිතන් ඒච්එම් රාජපක්ෂ ශ්‍රීලපාහ**
'බී' කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# COUNTRIES WITH ABSOLUTELY NO MILITARY FORCES.




**Andorra**
Defense of the country is the responsibility of France and Spain. Similar treaties were made with both nations on June 3, 1993.

**Kiribati**
The only forces permitted are the police and the coast guard. Defense assistance is provided by Australia and New Zealand.




**Costa Rica**
Costa Rica was the very first country to formally abolish military forces. The constitution has forbidden a standing military since 1949. Seat of the Inter American Court of Human Rights and the United Nations' University for Peace.







**Liechtenstein**
Abolished their army in 1868 because it was deemed too costly. Army is only permitted in times of war, but this situation has never occurred. According to the CIA World Fact book, defense is the responsibility of Switzerland. However, official sources of both Switzerland and Liechtenstein do not provide any backing to this claim and no defense treaty is ever mentioned.




**Dominica**
Has not had a standing army since 1981 due to an attempted army coup. Defense is the responsibility of the Regional Security System.

**Marshall Islands**
Defense is the responsibility of United States.







**Grenada**
Has not had a standing army since 1983 due to an American – led invasion. Defense is the responsibility of the Regional Security System.




**Mauritius**
Has had a paramilitary police force and coast guard since 1968.

**Federated States of Micronesia**
Defense is the responsibility of the United States. Maintains a small paramilitary police force.







**Haiti**
Haiti's military disbanded in June 1995, but rebels have demanded its reestablishment. The 9,000 strong Haitian National police maintains some paramilitary units, these units are considered to be larger than what is required, considering the much smaller militaries of some neighboring countries.




**Nauru**
Australia is responsible for Nauru's defense under an informal agreement between the two countries.



The older the crab, the tougher his claws

**Palau**

Defense is the responsibility of the United States.







**Saint Lucia**

A special service unit is maintained for internal purposes. Defense is the responsibility of Regional Security System.




**Saint Vincent and the Grenadines**

A special service unit is maintained for informal purposes. Defense is the responsibility of Regional Security System.




**Samoa**

Does not have a standing army. New Zealand can be called upon for military aid per a 1962 agreement.




**Solomon Islands**

Had a heavy ethnic conflict between 1998 and 2006, in which Australia, New Zealand and other pacific countries intervened to restore peace and order. Has no standing army.

**Tuvalu**

Has no army, but its police force includes a Maritime Surveillance Unit.







**Vatican City**


Maintains a Gendarmerie Corps for internal policing. The Swiss Guard is a unit belonging to the Holy See, not the Vatican City State. There is no defense treaty with Italy, as it would violate the Vatican's neutrality. The palatine Guard and Noble Guard were abolished in 1970.

*(Courtesy Internet)*

---

With the meaning **'the killing of another'**

| | | |
|---|---|---|
| **Deicide** | - | the killing of a god |
| **Filicide** | - | the killing of one's son or daughter |
| **Fratricide** | - | the killing of one's brother or sister |
| **Genocide** | - | the killing of a large number of people within a single population |
| **Homicide** | - | the killing of a person; murder |
| **Infanticide** | - | the killing of a baby |
| **Matricide** | - | the killing of one's mother |
| **Parricide** | - | the killing of a parent or near relation |
| **Patricide** | - | the killing of one's father |
| **Regicide** | - | the killing of a king |
| **Siblicide** | - | the killing of siblings in animal groups |
| **Suicide** | - | the intentional killing of oneself |
| **Tyrannicide** | - | the killing of a tyrant |
| **Uxoricide** | - | the killing of one's wife |



සෙ/306116 සාසෙ රංජිත් එච්එම්
2 ආබ ශ්‍රීලපාහ

# 8 ශ්‍රීලපාහ සිව්වන අණදෙන තිලධාරී

වර්ෂ 2004.03.25 වන දින රජරට මහවැලි සිංහපුර ප්‍රදේශයේ ස්ථාපනය කරන ලද 8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට 2009.08.21 වන දින තවත් සුවිශේෂි දිනයක් විය. මන්ද යත් 8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සිව්වන අණදෙන තිලධාරී වශයෙන් නි/61688 මේජර් ඩීජ්කේ දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෝෂ්ඨ



තිලධාරී එදින යෙදී තිබූ සුබ මොහොතින් වැඩ ඇරඹීම සඳහා ඒකකයට සම්ප්‍රාප්ත වීමයි. 4 වන ඊලාම් යුද්ධය ඇරඹීමත් සමගම මෙම බලඇණිය ත්‍රස්තවාදීන් මුලිනුපුටා දැමීමේ මහා සංග්‍රාමයට ඉදුරාම සහභාගි වෙමින් වන්නි මානුෂීය මෙහෙයුමේදී දැවැන්ත කාර්යභාරයක් ඉටුකර විජයග්‍රහණ රු සක් අත්කරගන්නා ලදී. මෙම මහගු කාර්යභාරය වෙනුවෙන් උරදී ක්‍රියාකිරීමේදී ඒකකයට නව දෙවන අණදෙන තිලධාරී වරයෙකු 2007.10.24 වන දින පැමිණෙන ලදී. ඒ අන් කිසිවෙකු නොව වත්මන් අණදෙන තිලධාරී තනතුරෙහි රාජකාරී භාරගන්නා ලද නව අණදෙන තිලධාරියායි. වන්නි මානුෂීය මෙහෙයුමේ නිරතව සිටි මෙම බලඇණිය වෙත දෙවන අණදෙන තිලධාරී වශයෙන් මෙම ජ්‍යෝෂ්ඨ තිලධාරී ලබාදුන් අනුපමේය කැපකිරීම නිසා බලඇණිය, බලසේනාව සේනාංකය මෙන්ම මුලු මහත් යුධ හමුදාවේම පැසසුමට ලක්වූ බව නොරහසකි.



මෙතෙක් ඒකකයට අණදෙමින් රාජකාරී කළ ලුතිනන් කර්නල් ටීජීඩීඑම්ආර්බී දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෝෂ්ඨ තිලධාරී 681 බලසේනාවේ බලසේනාධිපති තනතුර සඳහා පත්වී ඒකකයෙන් නික්මගිය පසු මෙම බලඇණියේ සිව්වන අණදෙන තිලධාරී වශයෙන් නි/61688 මේජර් ඩීජ්කේ දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෝෂ්ඨ තිලධාරී පැමිණි පසු එතුමා හට 2009.08.21 වන දින



උදෑසන සම්මාන මුරයක් පිරිනමමින් ඒකකය වෙතින් පිළිගන්නා ලදී. පසුව 1043 පැයට යෙදී තිබූ සුබ මොහොතින් සම්ප්‍රදායානුකූලව මහා සංඝරත්නයේ පිරිත් දේශනය හා සියල්ලන්ගේම ආශිර්වාදය මැද නව තනතුරේ රාජකාරී භාරගන්නා ලදී. නව අණදෙන තිලධාරීතුමා සියලු භට පිරිස් අමතමින් ක්‍රියාත්විතයේදී මියගිය නි/සෙසුනිලයින් හට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, සටනේදී තුවාල සිදුවූ සියලුම අයවලුන්හට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කරන ලදී.

8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත පා තැබූ සිව්වන අණදෙන තිලධාරී තුමණි, ඔබගේ ඉදිරි සැලසුම් සියල්ලම සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! යි බලඇණියේ සියලු නි/සෙනින්ගේ ඒකායන ප්‍රාර්ථනයයි. තවද ඔබගේ අණදීම යටතේ අප බලඇණිය ඒකකයන් අතර සුවිශේෂි ස්ථානයක් කරා රැගෙන යෑමට ඔබ හට ශක්තිය හා ධෛර්ය ලැබී බලඇණියේ සියලු දෙනා හට ශ්‍රී දළදා සමිඳුන්ගේ පිහිට හා ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ගේ ආරක්ෂාව, ආශිර්වාදය නොඅඩුව ලැබේවා! යි එක සිතින් ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය 8 ශ්‍රීලපාහ






Not all readers are leaders, but all leaders are readers

# ආබාධිත රණවිරුවන්ගේ විශේෂ ක්‍රීඩා දක්‍ෂතා

2009.05.21 දින සිට 2009.05.26 දින දක්වා ජර්මනියේ පැවති අන්තර් ජාතික බැඩ්මින්ටන් තරගාවලියට ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් ක්‍රීඩකයින් දෙදෙනෙකු හට අවස්ථාව උදාවිය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩකයින් 6 දෙනෙක් සහභාගි වූ අතර එහිදී හිමිකරගත් එකම රන් පදක්කමට හිමිකම් කීමට අප ක්‍රීඩකයෙකුට හැකි විය. එහිදී සහභාගිවූ අනෙකුත් ක්‍රීඩකයින්ද පදක්කම් හිමිකර ගනිමින් දක්‍ෂතා දැක්විය.

සැරයන් වීරසිංහ කේඑස් - රෝද පුටුවට සීමාවූ ක්‍රීඩකයෙකි
ඒකල තරගය - ලෝකඩ පදක්කම
යුගල තරගය - රිදී පදක්කම

කෝප්‍රල් ලලිත් කුමාර ඩබ්පීඒ - එක් පාදයක් දණහිසට පහලින් අහිමි
ඒකල තරගය - රන් පදක්කම
යුගල තරගය - ලෝකඩ පදක්කම



යුද්ධයේදී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත් වුවද එම ආබාධිත තත්ත්වය ගැන නොසිතා තම තරුණ ශක්තිය ක්‍රීඩා සඳහා යොදවමින් සැම කෙනෙක් හටම ආදර්ශයක් ලබාදී ඇත. මොහුන් මීට ප්‍රථම වසර කිහිපයක් විදේශ තරග සඳහා සහභාගි වී පදක්කම් හිමිකර ගනිමින් ශ්‍රී ලංකා පාබල හමුදාවටත් සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවටත් පොදුවේ ගත් කල ශ්‍රීලංකාද්වීපයටත් මහත් කීර්තියක් අත්කර දුන් ක්‍රීඩකයින් වේ. ඒ වගේම යුද හමුදා අන්තර් රෙජිමේන්තු ජාතික ආබාධිත ක්‍රීඩා උළෙලවලදී දක්‍ෂතා දක්වා පදක්කම් හිමිකර ගනිමින් අප ඒකකයට ජයග්‍රහණ හිමිකරදීම සඳහා විශාල දායකත්වයක් ලබා දී ඇත.




තවද කෝප්‍රල් ලලිත් කුමාර ඩබ්පීඒ 2009.09.07 දින සිට 2009.09.12 දින දක්වා කොරියාවේ සියොල් නගරයේ පැවැත්වෙන ලෝක බැඩ්මින්ටන් තරගාවලියට සහභාගි වීමට නියමිතව ඇත. එම තරගාවලිය තුලින්ද දක්‍ෂතා දැක්වීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ලැබේවා! යි ප්‍රාර්ථනා කරන අතර අනෙකුත් ආබාධිත ක්‍රීඩකයින් හට ඔවුන්ව ආදර්ශයට ගනිමින් ක්‍රීඩා තුලින් දක්‍ෂතා දක්වා අප රටට කීර්තියක් අත්කරදීමට ශක්තිය හා වාසනාව ලැබේවා! යි ප්‍රාර්ථනා කරමු.

ක්‍රීඩා අංශය රෙජිමූල ශ්‍රීලපාහ

---

# කවි සරණිය

බුදුන් දහම් සඟ මග යන
තෙරුවන ගුණ මලින් පුදා
ඔබගෙන් අවසර අරගෙන
මේ කවි ටික ලියමි මෙමා

පෝයට පන්සල් යන්න
අටසිල් ඔබ අරගන්න
අප හැමටම පුලුවන් නොවැ
නිති පන්සිල් සුරකින්න

මත් වතුරට ලොල් අයගේ
ජිවිත හරි කෙටි නේද
ඒ හින්දා යහළුවනේ
යහළු කමට සුරා එපා

එහෙ ගැහුවා මෙහෙ ගැහුවා
උතුරු කරේ කොටි ගැහුවා
ඔබ සැම දෙන පිනවන්නට
මේ කවි ටික මම ලිව්වා

අයියේ අක්කේ නංගි මල්ලි
ඔවදන් මල් දමක් ගොතමි
ඔබේ දිවියට දිරිය වේවි
ඇසුවොත් ඔබ සිත් සතුටින්

ලස්සන ඔබෙ ඔය දෙතොලේ
දුම්වැටි දල්වන්න එපා
දිලිසෙන ඒ ගිනි දළුවෙන්
තම ජිවිත දවනු එපා

යායුතු මග හරිම දුරයි
බාධා කම්කටොලු ගොඩයි
එනමුත් අපෙ සිත් නම්
වලකනු බෑ ජය නියතයි

මේ කවි ටික හද රැන්දූ
එවදන් මිනි ගී සින්දූ
අවසන් කර මට යන්නට
අවසර දෙනවද යාළු

ආසෙ අමරතුංග පීඑස්කේ
10 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම





# උසස් පාබල බණ්ඩ පුහුණු පාඨමාලාව සඳහා යෑමට ප්‍රථම 4 ශ්‍රීලපාහ ඒකකය තුල පැවති පෙර පුහුණුවීම්

වසර 30 කට අධික කාලයක් ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවතී අප දේශය තුලින් ත්‍රස්ත උවදුර තුරන් කිරීමෙන් පසු නැවත භට පිරිස් පුහුණුවීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ආසේමු (මුලතිව්) විසින් ආරම්භ කරන ලද උසස් පාබල බණ්ඩ පුහුණු පාඨමාලාව සඳහා අප ඒකකයෙන් ද 01x34 ක භට පිරිසක් සහභාගී කරවීමට නියමිතව තිබුණි.

මෙම පාඨමාලාව සඳහා භට පිරිස් පිටත් කර හැරීමට ප්‍රථම පාඨමාලාවට අදාල වන පුහුණුවීම් ඒකක තුල සිදුකර පාඨමාලාව සඳහා භට පිරිස් විසින් ඉතා උනන්දුවෙන් පෙර පුහුණුවීම් සිදුකර සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන ලදී.

මෙම පාඨමාලාවෙහි විශේෂත්වයක් වනුයේ අසේමු (මුලතිව්) විසින් සංවිධානය කරනු ලබන ප්‍රථම පාඨමාලාව සහ මුතියන්කට්ටු පුහුණු පාසලෙහි සිදුකරනු ලබන ප්‍රථම පාඨමාලාවද මෙය වීමයි.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ









# මක් කරන්න අප්පච්චී....

අතීතයේ එක් දිනයක
ජනිත වුණා නුඹේ කුසින්
මාගේ හැඩුමක් අසන්න
පිංකර නැත ඔබ සසරේදී

මට එළියක් දී ගිය ඔබ
සැඟව ගියා හිරු අවරේ
යළි එන්නේ කවදා දැයි
නොදනිමි මා මතු සසරේ

අතීතයේ ඒ දිනයේ
හැකි වී නම් ඔබත් එක්ක
යන්න එනවා මම හැමදා
ඔබත් එක්ක ළඟින් ඉන්න

නොලැබෙන මව් සෙනෙහෙ පතා
හැඬුවත් මාගේ දෙනයන
හදවත පෑරෙන දුක් ගිනි
දන්නේ අද මා පමණකි

ළඟින් ඉන්න ඔබත් එක්ක
එන්නට බෑ දැන් නම් මට
මං වෙනුවෙන් අප්පච්චී
ඇතැයි කියා තේරුණි මට

මහාමේරු පර්වතයක්
සේ නොසැලෙන ඔබ අභියස
දණින් වැටී සුරත හොවා
මව් සෙනෙහස ඉල්ලන්නද

මව් සෙනෙහස නොමැති වුවත්
ජීවිතෙ නෑ අඳුරු වුණේ
පිය සෙනෙහස තිබුණා මට
මහා මෙරක් තරම් උසට

වසත් සමේ මල් පිබිදී
ජය මංගල සීනු හඬින්
පෝරුව මත අභිසෙස් ලැබ
සිටියත් මා සතුටු සිතින්

පෝරු මස්තකයෙ සිටිනා
දවසෙත් මට මතක් වෙන්නේ
අම්මේ මට ඔබෙ මුහුණුයි
දෙනෝදහක්දෙන අතරින්

වඳින්න බෑ ඔබේ දෙපා
මගේ දෑසේ කඳුළු පිරේ
දූවක් අයිති පිටටම නොවැ
මක් කරන්න අප්පච්චී

ඩබ්පීඑම් දිලීෂා නිශානි
13 ශ්‍රේණිය
දප/ගා/අම්/විද්‍යාවර්ධන ම.වි
දොඩන්දූව.

# ගමේ ගියෙමි

ටක් ටක් ටක් ටක්
කෝපි කොලේ වතුර බිංදු සංගීතේ
ගස් අතරේ මීදුම් සළු බඳවටලු මිහිර ගතිය

නන්නාදුනනා මිහිරි කුරුලු කූජනේ
හිතේ කොනක් කිති කැව්වෙමි
ගිය ගමනේ අපේ ගමට

උඩරට තාලයට නටන
හිත කරන වැල් පාලම
දඟ කර කර හැඩට නටන
වී ඔය කොමලිය බැස යන
හැඩ පලු අතු අගින් පෙරුන
කිරණ කැරලි රටා මවන
මිහි මත සුර විමනක් දෝ
පැටි කාලය ගෙවූ මෙබිම

පෙඳ පාසින් රටා මැවුනු
දොළකඩවල් දෙස තෙමන
කුඩැල්ලන් රංචු රංචු
තණකොල අග ඉව අල්ලන
මීමන පඳුරින් වටවුනු
ගිරි කඳුරේ අඩි පාරේ
පියවර පියවර ගානේ
පරණ මතක කවි ලියවෙන

වවුලගල සුදු පාටට පොතු
ගැලවුනු
යෝධ බිම්මලක් වාගේ
සෙවණ කරයි මගේ ගමම

සැමදා දෙසවන් සනහන
මිහිරි සිංදු සිතට කියන
සුදු පොඩි පෙණ බුබුලු වලින්
නොමැකෙන පිංතූර අඳින
දඩිං බිඩිං ලී පාලම
යටින් ඔයට ගලාන යන
ඕලු ඇල්ල ගමට ගෙනෙන
සිරි විසිතුරු කියන් කොහොම

වැලි කෙලියේ රැලේ වැටුන
සුමිතුරනේ ඉතින් කොහොම
කඳුළු නැගෙයි නෙතට හොරෙන්
නුඹ හිනැහෙන විටදි ඔහොම

හොඳ හිත සහ සම්බෝලය
සමග ලැබුනා සප්පායම
තුති පිදුවොත් අඩුවක් වෙයි
ආගන්තුක සත්කාරෙට

අතැඹුල සේ සිතින් විඳිමි
නොකිලිටි ගම් සුවය නිතර
සිතේ මතක එලෙසින්මයි
නොමකම් එය සදා මිතුර

වෛද්‍ය එස්එල්එස් කුමාරගේ
යුධ හමුදා රෝහල
කොළඹ




# පිය ගුණ වැයුම

කසාවත මා ගතේ දැවටී
වටාපත මා වත වසාගෙන
නුඹේ ගුණ කඳ කෙසේ පවසමි
පියාණෙනි, මළ ගමයි නුඹේ..........

වෙල් ඉපනැල්ලේ එදවස මා හා
කොලු ගැටවෙකු මෙනි ඔබ උන්නේ.......
මගේ තනිකම මිස නුඹේ තනිකම නොව
සිතුවේ කිසි දින පියාණනේ.....................

දහසක් මළ ගම් වෙතට යනෙන මුත්
දහසක් පිය ගුණ ගයන නමුදු මා.........
නිසල ඔබේ කය අභිමුව වැඩ සිට
කඳුළැලි සලනෙමි නොපෙනෙන සේ......

සිවිල් සේවක අනුර ප්‍රියලාල්
17 (සෙවි) ශ්‍රීලපාහ
යුධ හමුදා කඳවුර
අයිත්තියමලෙයි

බොහෝ සෙයින් කතා කරන්නා හිස් මිනිසෙකි

# සිව්වන ඊළාම් අවසානය

මාවිල්ආරුවෙන් ඇරඹුන මේ සටන් බිම
දස්කම් දක්වයි අපෙ සෙබළුන් ඒ බිම
සතරවන ඊළාමට පෙරුම්පිරූ ඒ බිම
වැනසුනේ කොටි කට්ටපරිච්චාන් යුධ බිම

කටුක දුක් මැද අපි සටන් වදිනවා
නැගෙනහිර කොටි බලයත් අප වැනසුවා
මඩු පල්ලියත් ලපාහ කොල්ලෝ ඇල්ලුවා
ජීවිතය පුදාහරි රටට සාමය ගෙනෙනවා

රුදුරු කොටියෝ බලපං ආපසු හැරී
යන්න වෙන තැනක් නුඹලට කොහේ හරී
කිලිනොච්චියෙන් නෑ නුඹලට ඉඩක් හරී
ආවා ලපාහ කොල්ලෝ ඉදිරියටම හරී

නවතින්නයැයි සිතා කොටියා කළ උපරවැටී
ගැසුවා දිගට හරහට හැමතැන පස්වැටී
නොසිතූ විලස සෙබළුන් ගොස් ඒ අසල වැටී
දෙනවා පහරපිට පහර කොටියට හොදහැටී

හැකිවුන සොයුරනේ අද ඔබහට පිං ඇත්තේ
අපි අපේ යුතුකම හරිහැටි ඉටුකර ඇත්තේ
ලපාහ කොල්ලෝ නිසයි අද කොටි නැත්තේ
එලෙසයි අපි අද රටටම සාමය ගෙන ඇත්තේ

වෙඩිහඩ අපහට ආපසු කිසිදින නොඇසේවා
සැමදෙනා එකසේ මේ නිජබිම තුල වැජඹේවා
මින්පසුවටත් රටතුල සාමයේ මල් පැතිරේවා
දෙවියනි ඔබ අප සැම දෙන රැකදේවා

2/ලුතිනන්
එම්කේඑස්ටී නිරෝෂන් ආර්ඩබ්පි ශ්‍රීලපාහ

# රුදුරු බිම් බෝම්බය

පිපිරි බෝම්බය ඇටවූ අතර මග
අද සෙබළකු වුණා ජීවිතෙ අතර මග
නැතිවූ නමුදු පාදය පිය නැගූ මග
බොරු කකුළකින් අද ඔහු යයි ආව මග

සිය පුතු ළගට විත් සුරතල් බස් දොඩවා
ඔහු ඇස් නොහැර ඉන්නේ ඇයිදැයි ඇසුවා
මා හට විහිළු කෙරුමට දෙනෙතම සඟවා
ඉන්නට වගෙයි කියමින් හසරැළි සැලුවා

කෝප්‍රල් ගමගේ පීසී
'ඊ' කණ්ඩායම
ජනාධිපති ආරක්ෂක සේනාව
අරලියගහ මන්දිරය

# විශ්වාසය හා මිත්‍රත්වය

විශ්වාසවන්ත කමයි
මිත්‍රත්වයයි කියන්නේ
හරියට... වීදුරුවක් වගේ
ආරක්ෂා කළ යුතු දෙයක්
මොකද?.......
බැරිවෙලාවත් එක බිඳුනොත්
හදාගන්න බැරිනිසා
නැවත හැදුවත් පුංචි ඉරක් හරි
පලුද්දක් හරි ඉතුරු වෙනවා
හරියට විශ්වාසවන්තකම
බිඳුන වගේ......

සාසෙ චන්ද්‍රසිරි ටීඑච්එස්
'ඊ' කණ්ඩායම
ජනාධිපති ආරක්ෂක සේනාව
අරලියගහ මන්දිරය

# සිරිලක රැකගමු විරුදරු සළකමු

සිරිපා කඳු මුදුනේ බුදු පා සලකුණු තිබෙනතුරා
ඊවි සඳු එලියෙන් සැමදා මුළු ලෝකය දිලෙනවා
ලක්බිම රැකගන්න අපේ සුරවිරු අවි සුරතදරා
කළගුණ සලකමු රණවිරු අපගේ දිවි තිබෙනතුරා

රැකගන්නට මතු පරපුරෙ නිදහස ගැන සිතුවිල්ලෙන්
කඳවුරු තුල අවි අතැතිව විරුවන් ඇත විමසිල්ලෙන්
ගත් පියවර පෙරමුණටම යන්නට දෑ අභිමානෙන්
මුකලානේ රැදෙන පුතුන් සටන් වැදෙති ඉවසීමෙන්

විඩා නිවන්නට මොහොතක් නැති විරුවන් යුධ පිටියේ
රුවන් මැදුරු නැතිව පුතුන් සිටී නිතර මහකැලයේ
දරු පරපුරෙ අනාගතය සුරකින්නට මතු දිනයේ
රුදුරු කොටින් වනසාලමු ජය නියතයි හෙට දිනයේ

සමගිය සාමය සම්පත මේ සිරිළක ඇතිවෙන්නේ
ලක්බිම හැම දූ දරුවෝ එක මවකගෙ දරුවන්නේ
කඳ සුරිඳුගෙ රැකවරණය විරුවන් හැම ලබමින්නේ
මුදා ගන්න පුතුනට ඇත සිරි දළදා රැකවරනේ

වන්නි මානුෂිය මෙහෙයුමේදී දිවිපිදූ
කෝප්‍රල් දිනේෂ් ප්‍රියංකර පුතුට
නිවන් සැප පතමි පීඑස් පෙරේරා (පියා)




# හිමි නෙතු

නෙළුම් මානෙල් වතුසුදු ඇති මුත් ලොව
සියල් පරදයි ඔබේ නෙත් යුග නෙතු
බැල්ම මිහිරිය දකින හැම මොහොතකම
අයිති ඔය නෙතු මටම විතරද

1 ශ්‍රීලපාහ වසැ චමින්ද කුමාර පීඑච්ගේ බිරිය
ඩබ්ලිව්. නෙලුකා සුජීවනි

## You are the hero

To Safe guard our mother land
You sacrifice your life
With untiring effort
And a strong moral
The journey you go
Can't stop by multi barrels
Can't stop by weapons
The service you do, for you

Mother land
Try to see smile
Through the tears
Able and heroic your life
Energy and power of your life
To protect our lives
To protect our mother land
You jeopardize your life
Even not knowing us
So you are the heroes in our hearts


MMH

# වෙන් වෙන් නැති ආදරයක්

හිතවත් කමින් ඇතිවූ අපෙ ඇසුර ඉබේ
ඔබගේ සුවඳ තවමත් මගේ ළගම තිබේ
හිනහෙන දයාබර සුරතල් මූහුණ ඔබේ
අවසන් හුස්ම යනතෙක් මට මතක තිබේ

මේ සීත රාත්‍රියේ එපා මා තනිකරන්න
සුළඟක්වී ඔබ ඇවිත් මා ළඟම දැවටෙන්න
පාලුවෙන් තනිකමින් ඉන්න
හැමමොහොතකම
ආදරයේ සුවඳ ගෙන
මොහොතකින් ඔබ එන්න
මගේ මේ ජීවිතේ ඔබටමයි හැමදාම
නෑ ඉතින් වෙන්වෙලා යන්නේ නම් කිසිදාක

තුෂාර ගේ බිරිය නදීකා



# මව්බිම පණ සේ රකිමින් දැය වෙනුවෙන් දිවි පුදන්න
# මතු භවයෙදි පුතු සමගින් අම්මට හැක නිවන් යන්න

දස මාසයක් පුතු මගෙ කුස දරාගෙන
බිහිකළ දිනය මතකයි සිත පිනායන
ඇඟ ලේ රුහිරු කිරි කර කුස පුරෝගෙන
පුතු දැඩිකලේ නෙත් යුග සේ රැකීමෙන

පුතුනේ ඔයා දුන පැන දඟලන වයසේ
පියතුම ඔබේ මරු කැඳවා ගති රහසේ
දෙන්නම අපිව තනිඋනෙ ඇයි මේ විලසේ
සිහිවී එදා කඳුලැලි ගැලුවා ගඟසේ

දුක්විඳ හැදූ මගෙ පුතු තරුණයෙකු වෙලා
කොටි හා සටන් වැද සිරිළක එලිය කලා
සොහොයුරු කැලත් සමඟින් පුතු එකතු වෙලා
දෑ සුරැකුමට යනු පුත ඉදිරියම බලා

හැමදා පුතේ දැන් නිවසේ නොදැක්කට
නිරතුරු සිටී ලංවී මගෙ තුරුල්ලට
හෙට දින අපේ මුළු සිරිළක රකින්නට
දළදා සමිදු පිහිටයි මගෙ පුතුන්හට

රජකම් කරපු නරනිඳු දුටුගැමුණු වගේ
මගෙ පුතු මෙලක රැකපන් එය තමයි අගේ
ඉදිරිය ජයයි බාධක ඇත යනෙන මගේ
පෙරමුණ බලා පලයන් රන්පුතුනි මගේ

දෑ සුරැකුමට හා පරපුරෙ අනාගතේ
රැකුමට සටන්වැද ලක බබලවන් පුතේ
පිංබර රටක් බලයෙන් ගනු පිණිස පුතේ
දෙන්නට එපා කිසි ඉඩ රත්තරං පුතේ

හැමදා ඇඳුම් ඇඟලා අභිමාන ලෙසින්
පිරිවර සමග යන පුතුගේ විලාසයෙන්
මා සිත නැගෙන විස්තර කළ නොහැක මෙයින්
වීර හැම පුතුන් රැකගනු දෙවි හතර වරන්

මා සෙබලියක වී ගිනි අවි දරන්නට
ආසයි පුතේ එන්නද රට රකින්නට
ශක්තිය තිබේ පුතුනේ තව මෙමන්හට
ඉඩ දෙනු මැනවි දෑ රැක දිවි පුදන්නට

ගිනි අවි දරා රුදු කොටි හා සටන්වැදී
ලක්බිම රකිමු දිවි හිමියෙන් පෙරටඇදී
දිවි තොර උවත් දැය වෙනුවෙන් සටන්වැදී
අභිමානයකි පිදුවත් දිවි සටන වැදී

රට දැය සමය වෙනුවෙන් ඔබ වීර පුතෙක්
නෑ කිසි විටෙක මගෙ පුතු ගැන හිතට බයක්
පෙර භවයෙදිත් රංකද ඔබ මගෙම පුතෙක්
වීරු හොඳ පුතෙක් වැදූ මා රත්තරං මවක්

හෙට දින ඔබේ ජීවය වෙඩි උන්ඩයට
ලක්වී දිවිය පිදුවත් ඔබ රට දැයට
දුක් වේදනා නොම අරගෙන මගෙ ලයට
නිරතුරු ඉදිමි නෙහෙලා කඳුලක් නෙතට

පිය සෙනෙහසක් නැතුවයි රත්තරං පුතේ
පණමෙනි ඔබව හැදුවේ රත්තරං පුතේ
සුරකිනු පිණිස ලක්බිම දරු අනාගතේ
බිය සැක නැතුව පලයන් ඉදිරියට පුතේ

ජය ටැඹ පෙනේ පෙරමුණ ගැන බලනවිට
තව ටික දිනයි ඇත්තේ ජය ලබන්නට
නවතා සටන එනු හැරිලා පසුපසට
දුන්නොත් අණක් තියපන් වෙඩි උගෙ ලයට

දහසක් පුතුන් දිවි පුදලා ඇත රටට
දුන්නොත් අණක් ආපසු හැරෙනා ලෙසට
නොහිතා කිසිත් හැරියත් පුත පසු පසට
අම්මා වුවත් තියපන් වෙඩි මගෙ කටට

ලක රැකගන්න පිදුවත් දිවි අභිමානෙන්
අම්මා ඔබේ නොබලම් එය අවමානෙන්
විරුවෙකු පරිදි පුතු මගෙ රට රැකදීමෙන්
ඒ පිං බලෙන් අපි සැනසෙමු මතු නිවනින්

ජී.එස්. පෙරේරා
(මියගිය 6 ශ්‍රීලපාභ කෝප්‍රල් දිනේෂ් ප්‍රියංකර පෙරේරා ගේ පියා)

# ප්‍රහේලිකා අංක 42

නිවැරදි විසඳුම්පත් 2010 අප්‍රේල් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරග කුපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

## වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 42

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | | | | | 3 | 7 | | |
| | 1 | | | 6 | | | 4 | |
| | | 2 | 8 | | | | | 5 |
| 6 | | | | | 2 | 1 | | |
| | 3 | | | 5 | | | 2 | |
| | | 7 | 3 | | | | | 9 |
| 9 | | | | | 5 | 3 | | |
| | 7 | | | 3 | | | 9 | |
| | | 3 | 6 | | | | | 8 |

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුල 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර එය පිළිවෙළකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙළකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුල හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 40

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | 5 | 6 | 8 | 1 | 4 | 7 | 2 | 3 |
| 4 | 2 | 1 | 6 | 3 | 7 | 5 | 9 | 8 |
| 7 | 3 | 8 | 5 | 9 | 2 | 1 | 4 | 6 |
| 3 | 1 | 9 | 7 | 5 | 8 | 2 | 6 | 4 |
| 5 | 4 | 2 | 1 | 6 | 9 | 3 | 8 | 7 |
| 8 | 6 | 7 | 4 | 2 | 3 | 9 | 5 | 1 |
| 1 | 8 | 5 | 2 | 7 | 6 | 4 | 3 | 9 |
| 6 | 7 | 3 | 9 | 4 | 5 | 8 | 1 | 2 |
| 2 | 9 | 4 | 3 | 8 | 1 | 6 | 7 | 5 |

## ප්‍රහේලිකා අංක 40 හි ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය :-**

සෙ/309254 කෝප්‍රල් තුසිත බණ්ඩාර පේළිම්
20 ශ්‍රීලපාහ, යුද හමුදා කඳවුර,
අක්කරායම්කුලම, පුනරීන්.

**දෙවන ස්ථානය :-**

සෙ/300010 බනි II දිසානායක කේජී
රෙපිමුඛ ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
පනාගොඩ, හෝමාගම.

**තෙවන ස්ථානය :-**

සෙ/316907 කෝප්‍රල් ගමගේ පීසී
'ජ' කණ්ඩායම, ජනාධිපති ආරක්ෂක අංශය,
අරලිය ගහ මන්දිරය,
කොළඹ - 03.

## තරග කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන,දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. ප්‍රහේලිකා අංක 42 හි නිවැරදි විසඳුම් පත් 2010 අප්‍රේ 15 වන දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු 3 කට වඩා ඇත්නම් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 42 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ජනපදය
පනාගොඩ
හෝමාගම

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**අංක 42**

**කූපනය**

අංකය :........................................

නිලය :........................................

නම :........................................

රාජකාරී ලිපිනය :........................................

........................................

........................................

ඒකකය :........................................

ජාතික හැඳුනුම්පත් අංකය :........................................



# 60 වන යුධ හමුදා දිනය සැමරීමට සමගාමීව සිදුකරන ලද රෙජිමේන්තු ධජයන්ට සෙත් පැතීමේ උත්සවයේ විවිධ අවස්ථා



ශ්‍රී ලංකා යුද හමුදාව ආරම්භ කර 2009 ඔක්තෝබර් මස 10වන දිනට වසර 60ක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සියළුම රෙජිමේන්තු හා එම රෙජිමේන්තු යටතේ පාලනය වන ඒකකයන්හි ධජයන්ට ජය ශ්‍රී මහා බෝ සම්දුන්ගේ ආශිර්වාද ලබා ගැනීමේ පිංකම් මාලාවක් 2009.10.02 වන දින අනුරාධපුර පූජනීය භූමියේදී පැවැත්විනි. එම අවස්ථාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා පාබල හමුදාව හා ඒ යටතේ පාලනය වන ඒකකයන් හී ධජයන්ට ආශිර්වාද ලබා ගැනීම සඳහා සහභාගි වූ රෙජිමේන්තු අධිපතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරි මෙන්ම ඒකක නියෝජනය කරමින් සහභාගි වූ නිලධාරි හා රෙජිමේන්තු සැරයන් මේජර්වරු කාචයේ සටහන් වූ අයුරු.









පුනරුත්ථාපන
අධ්‍යක්ෂ ජෙනරාල් ධුරය ද
දරන මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී




ඊජිප්තුවේ කයිරෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ
නියෝජ්‍ය තානාපති ධුරය ද දරන මේජර් ජෙනරාල්
කේඑච්ජී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී